# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 දෙසැම්බර් 12 වන අඟහරුවාදා**

2017 மார்கழி 12 வெள்ளிக் கிழமை

Tuesday 12th December 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 09 ට පළාත් සභාව රැස් විය.**

*மு.ப. 09.09 க்கு சபை கூடியது*

*The Provincial Council met at 09.09 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය

## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

*"අද දිනට නියමිත න්‍යාය පත්‍රයානුකූලව සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදයෙන් අනතුරුව සභාවේ එකඟතාවය විමසීම පෙ.ව. 10.00 ට සිදු කිරීමට තිබෙන බව සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සංවිධායකවරු දෙපළ වෙත මම පූර්ව දැනුම් දීමක් කරනවා."*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2018

## පූර්ණ කාරක සභාව

## ANNUAL FINANCIAL STATMENT - 2018

## COMMITTEE OF THE WHOLE COUNCIL

**(ප්‍රගතිය - 2017.12.11)**

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

2018 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් පිළිබඳව සලකා බැලීම සඳහා මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***

*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

***ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත කපා හැරීමක් කළ යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී. (ප්‍රගතිය : 2017.12.11)***

*The question on the amendment that a token cut off of Rs. 10/- from each vote Nos. of 105, 113, 114, 115 & 116 moved by Hon. U. George Perera - Chief Opposition Whip, was proposed again. (Continuation: 11.12.2017 )*

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

ඊළඟට තිබෙන්නේ, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය ඊයේ එනම්, 2017.12.11 වන දින නතර කළ තැන් පටන් ඉදිරියට පවත්වාගෙන යෑමයි. ඒ අනුව මම මුලින්ම විපක්ෂය වෙනුවෙන් හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 09.11 ]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**

Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, 2017 වර්ෂය අවසානයේ 2018 අයවැය විවාදයට සම්බන්ධ වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විවාදයට මම සම්බන්ධ වෙන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන්. ඇත්තටම අපි ගොඩක් කරුණු කාරණා ඒ පවත්වන උපදේශක කාරක සභාවලදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ගනිමින්, අඩුපාඩු නිවැරදි කර ගනිමින් අපි ඉදිරියට ගිහින් තිබෙනවාය කියන එක ඇමතිතුමාත්, ඒ නිලධාරීනුත් දන්නවා ඇති. හැබැයි, මම බොහොම සන්තෝෂයෙන් හිටියා. උදේ පාන්දර අපේ මහ ඇමතිතුමාත් ඉදීවි කියලා. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇමතිවරයාට විතරක් අත්පුඩි ගහලා විසඳගන්න බැරි ප්‍රශ්න ගොඩක් තිබෙනවා. මේක අධ්‍යාපනය වාගේම, මහ ඇමතිතුමාගේ වාගේම විෂය පථයන්ට නොදෙවෙනි විෂය පථයක්. ගරු ඇමතිතුමා කොපමණ උත්සාහ ගත්තත්, තනිවම වැඩක් කර ගන්න එතුමාගේ අවශ්‍යතාවය තිබුණාට කර ගන්න බැහැ. අපට

[ගරු හරිස්චන්ද්‍ර කොස්තා ]

ඊට වැඩිය ලොකු හයියක් අවශ්‍යයි. මම එහෙම කථා කරන්නේ. මොකද, මම දැක්කා පසුගිය කාල වකවානුවල - මම මේ කථා කරන්නේ වැදගත් කියලා හිතන දේවල් ගරු ඇමතිතුමාට දැනුම් දෙන්නයි. හිටපු නිලධාරීන්ගේ ගොඩක් කඹ ඇදිලි තිබුණා. නිලධාරීන් පත් වෙන කොට ගරු සභාපතිතුනි, ඒ නිලධාරීන් තමන්ට ආවේණික න්‍යාය පත්‍ර හදාගෙන ඒවාම ඉස්මතු කරලා, ඒවාම implement කරන්න තමයි හදන්නේ. තව දේවල් නවත්වලා, කර ගෙන ගිය වැඩ සටහන් නවත්වලා, තමන්ට ආවේණික දේවල් කරන්න උත්සාහයක් ගන්නවා. මම දැක්කා, හිටපු අධ්‍යක්ෂතුමිය. එතුමිය වැඩ කළා. එතුමිය ඩෙංගුවලට තිබුණු අපි කර ගෙන ගිය ඒ වැඩ සටහන් නවත්වලා, එතුමිය කුණු සම්බන්ධව වෙන වැඩ සටහනකට ලොකු වියදමක් දරා ගෙන යන්න ගියා.

ගරු සභාපතිතුමනි, අධ්‍යක්ෂවරයෙක් පත් වෙලා වැඩි කලක් ඉන්න බැහැ. විශ්‍රාම යන්න තිබෙද්දී තමයි ගොඩක් අධ්‍යක්ෂකවරු අපට හම්බ වෙන්නේ. එහෙම නේද ගරු ඇමතිතුමනි. වැඩිම වුණොත් අවුරුදු හතරක් පහක් ඉඳීවි. එතැනට යන කොට තමයි අධ්‍යක්ෂවරු, ලේකම්වරු අපට හම්බ වෙන්නේ. ඒක තමයි අපේ තිබෙන වැරැද්ද. ඉතින් මෙහෙම තරුණ කෙනෙකු ආවොත්, අවුරුදු ගණනාවක් පුටුවේ වාඩි වෙලා වැඩ කරන්න පුළුවන් අධ්‍යක්ෂවරයෙකු හරි ලේකම්වරුයෙකු හරි ආවොත් අපට දීර්ඝ කාලීන වැඩ සටහනකට යන්න පුළුවන්. අවාසනාවකට මෙන් ගරු සභාපතිතුමනි, අපට ඒක ලැබිලා නැහැ. අපේ සෞඛ්‍යයට විතරක් නොවෙයි. පොදුවේ සෑම අමාත්‍යාංශයකම තිබෙන ප්‍රශ්නයක්. ඉතින් ඒ ලේකම්තුමිය අලුත් වැඩ සටහනක් හඳුන්වාදීගෙන ආවා. ඒකට අපේ weight එක ගොඩක් දැම්මා. කුණු බැග් වර්ගීකරණය කිරීම වාගේ දේවල්. ඒවා හොඳයි. නමුත් අතරමැද සියල්ල කඩාගෙන වැටුණා. ඊට පස්සේ තව අධ්‍යක්ෂවරයෙක් ආවා. අපි දැක්කා, එතුමා පෞද්ගලික න්‍යාය පත්‍ර ඇදගෙන, ඒ කියන්නේ මිනිස්සු එක්ක හැප්පි හැප්පි තමයි රාජකාරිය කරන්නේ. වැඩ කරන අනික් නිලධාරීන් එක්ක. සමහර වෙලාවට ඇමතිතුමාවත් over run කරන වෙලාවල් තිබුණා. එහෙම වෙන්න බැහැ. මේකට ක්‍රියා පටිපාටියක් තිබෙන්න ඕනෑ. ඇමතිවරයාට හෝ උපදේශක කාරක සභාවට හෝ ගැලපීමක් නැත්නම්, මහ ඇමතිතුමාත් සමහම සම්බන්ධ වෙලා දොට්ට ඇදලා වෙන කෙනෙකු ගේන්න අපට. අපි අසරණ වෙලා ඉන්නවා, මේ තිබෙන නීති කෙටුම්පත් එක්ක. මේක අපි නිවැරදි කර ගන්න ඕනෑ. මම විශ්වාස කරනවා, හිටපු අධ්‍යක්ෂතුමා දැන් විශ්‍රාම ගියා කියලා. අලුත් අධ්‍යක්ෂතුමෙක් ආවා කියලා මට ආරංචි කිහිපයක් ලැබුණා. අපි සන්තෝෂ වෙනවා. හොඳ දක්ෂ, වැඩ කරන්න පුළුවන් ක්‍රියාශූර අධ්‍යක්ෂවරයෙක් ආවා කියලා මට වෛද්‍යවරු කිහිප දෙනෙකු කිව්වා. ඔබතුමන්ලාට වැඩ කරන්න පුළුවන් හොඳ මනුස්සයෙක් ආවා කියලා. ගරු ඇමතිතුමනි, අපි මුලින්ම හදන්න ඕනෑ මේගොල්ලන්ගේ - ඒගොල්ලන්ගේ තිබෙන පෞද්ගලික Agenda අමතක කරලා, එකට වාඩි වෙලා, එකට වැඩ කිරීමේ පරිසරයක් ඉස්සෙල්ලාම හදන්න ඕනෑ. එයා මේ කිව්වාට ඕක කරන්න බැහැ. මම මේක කිව්වාට, ඕක කරන්න බැහැයි කියනවා. මොකද, සෞඛ්‍යය කියන්නේ, මේ බස්නාහිර පළාතේ වටිනාම ක්ෂේත්‍රයක් කියලා මම විශ්වාස කරනවා. මේ නිලධාරීන් වැඩ නොකරනවා නොවෙයි. අපි මුල ඉඳන් හදාගෙන යන්න ඕනෑ ගමනක්. ඒක මම දැකපු ලොකු අඩුපාඩුවක්. එතකොට අපි දැක්කා, බස්නාහිර පළාතේ අපේ යටතේ තිබෙන මේ රෝහල්වල විශාල වශයෙන් අඩුපාඩු තිබෙනවා,. ගරු සභාපතිතුමා හරහා මම ගරු ඇමතිතුමාව දැනුවත් කරන්න කැමැතියි. 80% ක් වාගේම රෝහල් තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව යටතේ කියලා මම විශ්වාස කරනවා. මේ රෝහල්වලින් අපි පුළුල් සේවාවක් දෙන්න, අපට ඒ පහසුකම් ඉල්ලා ගන්න ඕනෑ මහ ඇමතිතුමා හරහා. මධ්‍යම රජයෙන්.

දැන් පසුගිය කාලයේ ඇති වුණු ඩෙංගු ව්‍යසනයේදී, අපට බස්නාහිර පළාතේ මේ තත්ත්වය මර්දනය කර ගන්න ලැබුණේ රේඛීය අමාත්‍යාංශයෙන් අපට දුන්න සහයෝගය නිසයි. ඔබතුමා විශ්වාස කරනවා ඇති. පිළිගන්නවා ඇති. දැන් ඒ දීපු සහයෝගය, ඒ දීපු සපෝට් එක ටික ටික ගලවනවා. අද වෛද්‍ය රසායනාගාර නොතිබුණු අපේ පළාත්වල රෝහල්වලට immediately වෛද්‍ය රසායනාගාර දුන්නා. ඒ අවශ්‍ය මූලික පහසුකම් ටික අපට දුන්නා. අපි සන්තෝෂ වෙනවා. ඒ පහසුකම් අරගෙන අපි එකට එක්කහු වෙලා වැඩ කළා. ඔබතුමා සමඟ අපි ගම්වල රෝහල්වල යමක් කළා. මේ ඩෙංගු ව්‍යසනය අඩු වුණාය කියලා හිතලා, දැන් ආපහු ටික ටික ඒ පහසුකම් ගැලවෙමින් යනවාය කියන එක අපට දැනෙනවා. මේකට අපි ස්ථිර ක්‍රියාමාර්ගයක් යොදවා ගන්න ඕනෑ. ඔබතුමන්ලාට ජනාධිපතිතුමා නිතර හම්බු වෙනවා. ඔබතුමන්ලාට

යුතුකමක් තිබෙනවා, ඒ හම්බ වෙන හැම වෙලාවකම අපට දීලා තිබෙන පහසුකම් ගලවන්න එපා. මේක මෙහෙම්මම තියන්න කියන්න. වෙන එකකට ගියත් ඔය වචනයක් හැම තිස්සේම ජප කරන කොට ඒ මිනිස්සුන්ගේ ඔලුවට මේක යනවා. කථා කරලා අපට ඒවා ස්ථිර කරලා තියා ගන්න. අපි හුහාක් පිළියන්දල රෝහලත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා. රෝහල් කාර්ය මණ්ඩලය අපට දැන් ආපහු අඩු වී ගෙන යනවා. එදා අපි කොහොම හරි අවසරය අරගෙන ඔබතුමා සේවකයෝ බඳවා ගෙන වැඩ කර ගෙන ගියා. දැන් ඒ සේවකයින්, ඒ මිනිස්සු ඒ අරන් තිබෙන පටිපාටියට, මම හිතන්නේ, ඒගොල්ලන්ගේ සර්විස් එක කඩලා ඇතුළත් කර ගන්න ක්‍රමවේදයක් මොකක් හරි තිබෙනවා. ඒ දීපු රස්සා ආපහු නවත්වලා තිබෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

නැහැ. දිගටම යනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒක අපි ස්ථිර කරලා, ඒ ළමයින්ව බඳවා ගෙන - මම කියන්නේ, පෞද්ගලිකව ඔබතුමා අපට අවසරය දුන්නා ඔක්කොම මන්ත්‍රීවරුන්ගේ ළමයින් ඇතුළත් කර ගන්න. ඒක නොවෙයි ගැටළුව. ඒක අපට ලොකු සේවයක් වුණා, මේ රෝහල්වලට. වෛද්‍යවරයෙකු එක්ක කථා කළාම, DMO කෙනෙකු එක්ක කථා කළාම කියන්නේ, අපට ලොකු සහයෝගයක් ලැබුණා. මේක නවත්වා ගන්න කියලා. නැත්නම් සුළු සේවකයා කරන වැඩෙත් කරන්නේ, අර ඉගෙන ගත්ත හෙද නිලධාරිනිය. ඉතින් මේක අපේ රෝහල්වල තිබෙන බොහොම දුක්ඛදායක තත්ත්වයක් තමයි. එතකොට අපට දැන් මේ වන කොට ඩෙංගු ගැන ආපහු අමතක වෙමින් යනවා. ගරු සභාපතිතුමා හරහා මම ගරු ඇමතිතුමාට දන්වන්න කැමැතියි. උපදේශක කාරක සභාව ඔබතුමා පවත්වනවා. නමුත් ඒක හරියට දිනයට තියලා, අපි දැන් මේ ඩෙංගු ගැන ආපහු කථා කරන්න ඕනෑ. මේක අමතක කරන්න හොඳ නැහැ. මේකට අපි ස්ථිර ප්‍රතිපත්තියක් අරගෙන මේ ගිය වැඩ සටහන නොනවත්වා ක්‍රියාත්මක කිරීම - දැන් පොඩ්ඩක් අඩපණ වෙලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි කියලා ගරු සභාපතිතුමා හරහා මම ගරු ඇමතිතුමාව දැනුවත් කරනවා. ඒ විතරක් නොවෙයි. මේ වන කොට අපේ පළාත්වල තිබෙන රෝහල්වල තත්ත්වය නගා සිටුවන්න හැම දෙනාගේම - ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ ඇති වුණු ව්‍යසනයෙන් මහ ඇමතිතුමාත් රෝහල්වලට ගිහින් පරීක්ෂණ කරලා බලලා, එතුමා මගේ විෂය නොවෙයි කියලා අතහැරියේ නැහැ. විශාල සේවයක් කළා. මේ සියලු දෙනාම එක්කහු වෙලා, ඒ දුන්න සහයෝගයෙන් තමයි අපි මේ තරමට සාර්ථක වුණේ කියන එක කියලා මම ඔබතුමා හරහා ගරු ඇමතිතුමාට දන්වනවා.

ගරු සභාපතිතුමනි, තවත් එකක් මම ගරු ඇමතිතුමාට දැනුම් දෙන්න කැමැතියි. ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක, අපි මධ්‍යම බෙහෙත් ශාලා කියලා පිහිටුවන්න සැලසුම් කරලා තිබෙනවා. දැන් මේ වෙන ඒවා බොහොම පැටලුම් සහගතයි. මේවාට රේඛීය අමාත්‍යාංශයෙන් අපි අවසර ගන්න ඕනෑ නැහැ. අපේ බස්නාහිර පළාත් සභාව යටතේ තිබෙන වෛද්‍ය මධ්‍යස්ථානවල වැඩ කරන්න. අපි ඉල්ලුම් කළාම අපේ MOH එකෙන් එහෙම ඒවා යවනවා, රේඛීය අමාත්‍යාංශයට. මේ තිබෙන ගැටළු මේ නිලධාරීන් පටලවාගෙන ඉන්නේ ගරු ඇමතිතුමනි. මේක තේරුම් ගැනීමේ ශක්තියක් නැතිකම කියලා තමයි මම හිතන්නේ. දැන් අපට මේ පළාත්වලට ඉතාම වැදගත්, ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර. පොඩි Medical clinic. මේවා ඇති කිරීම අවශ්‍යයි. අපි ඒවාට සහාය දෙන්න ඕනෑ. එතකොට අපට රෝගීන් හඳුනාගන්න පුළුවන්. අපේ තිබෙන ප්‍රධාන පෙළේ රෝහල්වල තිබෙන තදබදය අඩු කර ගන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා සැහෙන මහන්සි වෙලා වැඩ කරන ඇමතිවරයෙක්. අපි දැක්කා, පක්ෂ භේදයකින් තොරව මොනවාද අපි කියන්නේ, කථා කළාම ඇහුම්කන් දීමේ හැකියාව මෙතුමාට තිබුණා. අපිත් එක්ක එක්කහු වෙලා විශාල වැඩ කොටසක් අපේ පළාත්වල රෝහල්වලට කළා. ගරු සභාපතිතුමනි, මම කැමැතියි ඔබතුමා හරහා අපේ ඇමතිතුමාව දැනුවත් කරන්න. මේ රෝහල්වල අපි විශාල සේවයක් කළා. දන්ත චිකිත්සාගාර. ඇස් පරීක්ෂණ කිරීම. දැන් ඒවා ඔක්කොම අඩපණ වෙමින් යන්නේ. පිළියන්දල රෝහලේ සමහර වෛද්‍යවරු ගලවලා අයින් කරලා තිබෙන්නේ. මේ තනිකරම නිලධාරීන්ගේ පෞද්ගලික agendas. මේ ගැන අපි සොයලා බලන්න ඕනෑ. අපි සාකච්ඡා කරන්න

[ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

ඕනෑ. දැන් උපදේශක කාරක සභාවේ සාකච්ඡා කරන්න අවශ්‍ය මාතෘකා ගොඩක් අපි සතුයි. ඒවා මෙතැන කථා කරලා වැඩක් නැහැ. මම මේ වැදගත් කියලා හිතන යමක් තමයි මෙතැන කථා කරන්න උත්සාහ ගන්නේ. ගරු ඇමතිතුමනි, මේක අපි නැති කරන්න ඕනෑ. මම ඔබතුමාට වාගේම සුභ පතනවා. හොඳ අධ්‍යක්ෂවරයකේ අපට හම්බ වුණාය කියලා ආරංචි වුණා. එතුමාටත් මේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල මෙහෙවරක් කරන්න හැකියාව, ශක්තිය ලැබෙන්නය කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඔබතුමාටත් අපි ඒ වාගේම සුභාශිංසනය කරනවා. පසුගිය කාලයේ තිබුණු ව්‍යසනවලට මුහුණ දෙමින් අපිත් එක්ක එක්කහු වෙලා, අපේ රෝහල් සංවර්ධනය කර ගෙන මේ වැඩ සටහනට දුන්න සහයෝගයට ස්තුතිවන්ත වෙමින් එළඹෙන 2018 වර්ෂයේදී මේ අඩුපාඩුකම් නිවැරදි කර ගෙන අපේ ඉන්න රාජ්‍ය නිලධාරීන් එක්ක එක්කහු වෙලා විශාල සේවයක් බස්නාහිර පළාතේ රෝහල්වලට කරන්න හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 09.25 ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳ මූල්‍ය විවාදය වන අවස්ථාවේ අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන් අපි කාටත් වැඩිපුරම අවධානය යොමු වන දෙපාර්තමේන්තු කිහිපයක් එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා. අපි කවුරුත් මේ සියලු කටයුතු කරන්න නිරෝගීව ඉන්න ඕනෑ. බුදු වදනෙත් තිබෙන්නේ, ආරෝග්‍යා පරමා ලාභා කියලා. රෝග නැතිකම නිරෝගී භාවයේ පරම ලාභය වේ. ඒ පරම ලාභය ලබා දෙන්න තිබෙන දෙපාර්තමේන්තුව තමයි අපේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව. එතකොට මේ දෙපාර්තමේන්තුව හරහා අපට - බස්නාහිර පළාත කියන්නේ, පාර්ලිමේන්තුවට දෙවැනි වුණු ආයතනය. මේ ආයතනය හරහා ක්‍රියාත්මක වන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් මේ රටේ ඉන්න ලක්ෂ සංඛ්‍යාත ජනතාවකට සේවය සිදු කිරීම සඳහා වගකීමක් අපට තිබෙනවා. ඒ වාගේම තමයි මේ හා බැඳුනු තවත් දෙපාර්තමේන්තුවක්, සුවිශේෂී දෙපාර්තමේන්තුවක් තමයි සමාජ සේවා දෙපාර්තමේන්තුව. සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා එක පැත්තකින් සමාජයේ රැක බලා ගත යුතු අය රැක බලා ගන්න, පිහිට විය යුතු, පිළිසරණ විය යුතු අයට පිළිසරණ වෙන්න - අපි විශේෂයෙන් බෞද්ධයෝ විධියට අපට තිබෙන යුතුකම, වගකීම එක් පැත්තකින් මේ හරහා වඩාත් තීව්‍ර කරලා, වැඩි කරලා, අපට වගකීමක් පවරලා තිබෙනවා. ඉතින් එවැනි වැය ශීර්ෂ කිහිපයක් තිබෙන විශේෂයෙන් කාන්තා කටයුතු, ළමා රක්ෂණ සේවා, සභා කටයුතු ආදී මේ අමාත්‍යාංශය යටතේ විශාල වගකීම් ප්‍රමාණයක් අපේ ගරු ඇමතිතුමාට පැවරිලා තිබෙනවා. මේ වගකීම් ප්‍රමාණය අපි බලාගෙන හිටියා මේ ඇමතිතුමා පසුගිය කාලයේ කොහොමද ඉෂ්ට සිද්ධ කරන්නේ කියලා. එතුමා නවක ඇමතිවරයෙකු විධියට මේ වගකීම ඉෂ්ට කරනවා.

මම සාමාන්‍යයෙන් කාටවත් සුදු හුණු ගාන්නේ නැහැ. මුහුණට එකක් කියලා, පිටිපස්සට තව එකක් කියන්නේ නැහැ. ඒ නිසා මම සතුටින් කියනවා. මම ලලිත් වනිගරත්න ඇමතිතුමාටත් කිව්වේ, මනුස්සකම් අතින් එතුමා වාගේම අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමාත් අපිත් එක්ක හිටපු බව අමතක කරලා නැහැ. තමන් මන්ත්‍රීවරයෙකු විධියට, මේ අනික් අය දරන ප්‍රශ්නවලට මුහුණ දීලා ඒ ප්‍රශ්න විසඳගන්න විශාල උත්සාහයන් දරපු බව අමතක කරන්නේ නැතිව - දැන් සමහර අයට ඇමතිකම් ගත්තාම තමන් මන්ත්‍රී වෙලා හිටියා. තමන්ට මේ වාගේ කෙනහිලිකම් වුණා. ඒ නිසා ඒ අසාධාරණයන් නිවැරදි කරන්න ඕනෑය කියන

එක සමහර විට අමතක වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. හැබැයි, සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමා දැනට එහෙම කරන්නේ නැහැ. අනාගතයේ ඒවා මම කියන්න දන්නේ නැහැ. දැනට එහෙම නොකිරීම පිළිබඳවත් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැනට හොඳයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැනට හොඳයි. ඒ නිසා එතුමා ගරු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රශ්නයකට අවධානය යොමු කරලා, කළ හැකි දෙයක් තිබෙනවා නම්, ඒ වෙනුවෙන් පෙනී සිටලා කටයුතු කිරීම පිළිබඳව මම මගේ ගෞරවය, ප්‍රණාමය මේ වෙලාවේ පළ කර සිටිනවා. ඒ වාගේම එතුමාට තිබෙන මේ වගකීම හරියට අවබෝධ කර ගෙන එතුමා කටයුතු කරනු ඇතැයි කියලා මම හිතනවා. මට තවම 100% ක් කියන්න බැහැ ඒ වගකීම එහෙම දරනවාද කියලා. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ඒ දෙපාර්තමේන්තුවේ විශාල වැඩ කොටසක් කළ යුතුව තිබෙනවා. සමහර විට යම් නිලධාරීන්ගේ ප්‍රශ්නද? වෙන මොනවා හරි හේතුද කියලා මම හරියට දන්නේ නැහැ. නමුත් ගරු ඇමතිතුමනි, යම් තැන්වල අකාර්යක්ෂමතා, ප්‍රමාද වීම් තිබෙනවා. සෞඛ්‍යයත් එක්ක ප්‍රමාද වෙන්න බැහැ. සෞඛ්‍ය කියන්නේ ජීවිතයක් නැති වෙන්න ආසන්න අවධානමක් ගන්න තිබෙන තැනක්. ඒ නිසා සෞඛ්‍යයේදී ඉතාම ක්ෂණිකව යම් යම් කරුණු සඳහා උත්තර සොයන්න ඕනෑ. දැන් ඩෙංගු ව්‍යසනය වසංගතයක් විධියට පැතිරිලා තිබුණු කාලයේ අපට තීන්දු තීරණ අරගෙන ක්‍රියාත්මක වෙන්න මධ්‍යම රජයේ ඉඳන් සෑහෙන කාලයක් ගියා. ඒ නිසා මේ රටේ වටිනා ජීවිත, පුංචි දරුවන්ගේ ඉඳන් වටිනා ජීවිත විශාල ප්‍රමාණයක් නැති වෙනවා. ඒක ඔබතුමාගේ වැරැද්දක් නොවෙයි. නමුත් මධ්‍යම රජයේ ඉඳන් ඒ අඩුපාඩු ආපු නිසා අපට බේරා ගත හැකිව තිබූ ජීවිත අහිමි වුණා. ඒකට දැනටමත් සම්පූර්ණ පිළියමක් තිබෙනවාය කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. නමුත් ඒකට යම් යම් දේවල් ප්‍රමාද වෙලා හරි ඔබතුමන්ලා සේවකයෝ බඳවා ගෙන පිරිසිදු කිරීම්, පරීක්ෂණ සහ අනෙකුත් කටයුතු කළ නිසා සහ ඒ ප්‍රතිකාර කටයුතු ඉක්මන් කරන්න දෙවනුව කටයුතු කිරීම නිසා ඒවා යම් ප්‍රමාණයකට අද අඩු වෙලා තිබෙනවා. නමුත් නැවත මෙවැනි තත්ත්වයන් හිස ඔසවන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒවාට අපි දීර්ඝ කාලීන විසඳුම් අපි හදා ගන්න ඕනෑ. මෙවැනි තත්ත්වයන් අවුරුද්දකට මේ කාල පරිච්ඡේදයකදී එන්න පුළුවන්. ඒ වාගේම මෙවැනි ස්වභාවික ව්‍යසනයන් එන කාල පරිච්ඡේදවලදී ගංවතුර, වෙනත් අවස්ථාවලදීත් මේ වාගේ තත්ත්වයන් එන්න පුළුවන් නම්, ඒවාට පිළියම් යොදන්න කල් ඇතිව අපි සූදානම් වෙන්න ඕනෑ. නමුත් එහෙම සූදානමක් අපේ රටේ පොදුවේ ගත්තාම ජාතික මට්ටමෙන්වත් තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. කෙසේ වෙතත් ඔබතුමාගේ වගකීම බස්නාහිර පළාත් සභාවට තිබෙන නිසා මම ඉතාම කාරුණිකව ඉල්ලනවා. මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමහර විට පසුගිය කාලයේ හිටපු අධ්‍යක්ෂවරු සමහර විට ඇමතිවරයාටත් ඇහුම්කන් දෙන්නේ නැති සහ සමහර විට මන්ත්‍රීවරුන්ව පවා නොසලකා හරිනවා. හැබැයි, දැන් එහෙම නැතිව ඇති කියලා මම විශ්වාස කරනවා. මට ළඟදී එහෙම සම්බන්ධ වෙන්න බැරි වුණා. නමුත් පොදුවේ ගත්තාම එහෙම මතයක් තිබෙනවා. ඒ අයගේ ඇහුම්කන් දීම සහ ඒ අය යම් ප්‍රශ්නයකට මැදිහත් වෙන්නේ ටිකක් ඉහළින් හිතලා. යම් කාරුණික භාවයන් අඩුයි කියලා.

ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඔබතුමාට කියනවා. අද වර්තමාන තත්ත්වය දන්නේ නැහැ. මට හිතෙනවා, ඔබතුමා ලේකම්තුමාගේ ඉඳලා වෙනස්වීම්වලට ලක් කර ගෙන තිබෙන නිසා - පාලනයකින් තොර ලේකම්වරු සිටිය බව අපි දන්නවා. ඒ වෙනස්වීම්වලට ලක් කර ගෙන තිබෙන නිසා මේ වන විට යම් වෙනස් වීමක් ඇති කියලා. නමුත් එය වඩාත් හොඳින් වර්ධනය කරලා, අපි මේ සමාජයේ මිනිස්සුන්ට අත්‍යවශ්‍ය අංශය වන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් කළ යුතු යුතුකම් ටික, ඒ දැරිය යුතු වගකීම් ටික වහාම ඉටු කරන්න අවශ්‍ය පියවර ගන්න ඕනෑ. දැන් අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ඒ ප්‍රදේශවල තිබෙන ග්‍රාමීය රෝහල්. ග්‍රාමීය රෝහල්වල කටයුතු වඩා ප්‍රතිසංවිධානය කරලා, ඒවා විධිමත් කිරීම තුළ තමයි මහා පරිමාණයේ රෝහල්වලට එන ජන සංඛ්‍යාව අඩු කර ගන්න පුළුවන් වෙන්නේ. නැත්නම් දහස් ගණනක් සමහර රෝහල්වල රස්තියාදු වෙනවා. ඒ රස්තියාදු වන රෝගීන්ට ප්‍රතිකාර ගැනීමට - රස්තියාදු වෙනවා විතරක් නොවෙයි. සමහර විට පීඩාවටත් පත් වෙනවා. කාර්ය මණ්ඩලවලින්

[ගරු ජගත් කුමාර]

පීඩාවට පත් වෙනවා. සමහර විට ඒ නිසා සන්තෝසම් දීලා තමන්ට යම් ප්‍රමුඛතාවයන් ලබා ගන්න සිද්ධ වන බව අපට සමහර අය කියනවා. පොදුවේ ගත්තාම. එවැනි තත්ත්වයන් වළක්වන්න නම් අපේ ගමේ තිබෙන රෝහලට ගරු ඇමතිතුමා, වඩා හොඳින් අපි පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. කඩුවෙල ගත්තත් නවගමුව, අතුරුගිරිය, තලංගම රෝහල් තිබෙනවා. නවගමුව, අතුරුගිරිය සෑහෙන ග්‍රාමීය මට්ටමක තිබෙන්නේ. තලංගම කියන්නේ, අපි මේ ඉන්න පරිශ්‍රයට ආසන්න රෝහලක්. ඉතින් ඒකෙත් තවමත් යම් යම් අඩුපාඩු තිබෙනවා. අපට ආරංචියක් තිබෙනවා, ගරු මහ ඇමතිතුමා මැදිහත් වෙලා අලුත් ගොඩනැගිලි හදලා යම් ප්‍රතිසංවිධානයක්, පහසුකම් ටිකක් දෙන්න හදනවාය කියලා. නමුත් එහිදී මම දන්නේ නැහැ මේ පළාතේ මන්ත්‍රීවරු විධියට එක්කෙනෙක් දෙන්නෙක් සම්බන්ධ කර ගන්නවාද දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, අපව සම්බන්ධ කර ගත්තේ නැහැ. මම මුල්ම කාලයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට ආවා. අපි මුල ඉඳන් විශාල වශයෙන් ජගත් අංගගේ හිටපු ගරු ඇමතිතුමාගේ කාලයේදී ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හැම එකක් එක්කම ළඟින් සම්බන්ධ වෙලා කටයුතු කළා. දැනට මම ඉන්නේ මහා මාර්ග අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ නිසා මට වැඩි වගකීමක් එතැන තිබෙනවා සහ අපට තිබෙන කාර්ය බහුලත්වය නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයේ කටයුතුවලට සහ සම්බන්ධ වෙන්න ඉඩ අඩු වුණත්, අපි කැමැතියි මේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලට වැඩියෙන් අවධානය යොමු කරලා කටයුතු කරන්න. මොකද, මේක අපට එක අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක වගකීමක් විධියට නොවෙයි එන්නේ. මේක සමස්ත ජනතාවගේ ප්‍රශ්නයක්. ඒක ඇමතිවරයෙකුගේ වගකීමක් කියලා, එතුමාගේ පිට දාන්න අපි සූදානමක් නැහැ. අපි කැමැතියි, ඒ දෙපාර්තමේන්තුවල වගකීම් බෙදා ගෙන, අපෙත් අවධානය යොමු කරලා, අපෙත් අදහස් යෝජනා අරගෙන කටයුතු කරන්න.

ඒ නිසා මම ඉල්ලනවා විශේෂයෙන් තලංගම, අතුරුගිරිය සහ නවගමුව රෝහල්වල අඩුපාඩු රාශියක් තිබෙනවා. ඔබතුමාට පසුගිය දවසකත් යොමු කළා. ඔබතුමා ඒකට අවධානය යොමු කළා. අතුරුගිරිය රෝහලේ අවශ්‍යතා සඳහා. ඒ වාගේම අතුරුගිරිය රෝහලේ පසුගිය දිනවල ඉතාම ව්‍යසනයක අවස්ථාවකදී විශිෂ්ට සේවාවක් කරපු වෛද්‍යවරියක් ඉන්නවා. ඉතින් එතුමියගේ පැත්තෙන් මට ආරංචියක් තිබෙනවා, ඇගයීමක් වෙලා නැහැ. ඒ නිසාම එතුමිය යම් කලකිරීමකට පත් වෙලා. ඉතාම බරපතළ ව්‍යසනයකදී එතුමිය විශාල දායකත්වයක් දීලා කටයුතු කරලා තියෙනවා. සේවකයෝ, නිලධාරීන්, වෛද්‍යවරු තෘප්තිමත්ව හිටියොත් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අය ඒ ඔවුන්ගේ සේවාව කරන්නේ. ඒ නිසා ඉහළ ඉඳන් පහළට, පහළ ඉඳන් ඉහළට ඇගයීමක් ඇති වෙන ආකාරයට මේ දෙපාර්තමේන්තු, ආයතන තිබෙන්න ඕනෑ. විශේෂයෙන් වෛද්‍යවරු කියන්නේ, ජීවිතයක් එක්ක වැඩ කරන, සටන් කරන අය. ඒ අය අතෘප්තිමත් වුණොත්, ඒ අයගේ වැඩ අඩාල වුණොත්, හිමින් වුණොත් මම හිතන්නේ ඒක රෝගියාට බලපානවා. ඒ නිසා එවැනි තැන් පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මම ඉතාම කාරුණිකව ඉල්ලනවා.

ඒ වාගේම තමයි ගරු ඇමතිතුමනි, සමාජ සේවා දෙපාර්තමේන්තුව පැත්තෙන් ගත්තාම ආබාධිත සහ විශේෂයෙන් රැක බලා ගත යුතු වැඩිහිටියෝ සම්බන්ධව අපි විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. මම දැක්කා. ශිෂ්‍යාධාර මුදල නම් 500 සිට 1000 දක්වා වැඩි කරන්න තීන්දුවක් තිබෙනවා කියලා. ඒක හොඳ දෙයක්. මමත් යෝජනා කරන්න සිටියා. ඒ වාගේම ඒක අසීමාන්තිකව දෙනවා කියලත් තිබෙනවා. ඒකත් හොඳයි. එහෙම දෙනවා නම්. ඒ අදාළ පවුල්වලට. ඒ වාගේම මේ මහජන ආධාර. දැන් ජීවන විදයදමත් එක්ක ගත්තාම අපි දෙන මහජන ආධාර ඉතාම සොච්චම් මුදලක්. පසුගිය කාලයේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ රු. 250 ට 350 ට තිබුණු සමෘද්ධි ආධාරය අඩුම එක 1000 ක් දක්වා වැඩි කරලා, උපරිම එක 3000 දක්වා වැඩි කළා. ඊට පස්සේ මේ අය බලයට එන කොට යහපාලනයෙන් කිව්වා, අපි 9000 ක් කරනවා කියලා. හැබැයි, එහෙම වුණේ නැහැ. 200% කින් වැඩි කරනවා කිව්වා. නමුත් රු. 500 කින් විතරයි වැඩි කළේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු මන්ත්‍රීතුමා, මොනවා හරි වැඩි වුණා නේ? එහෙම වැඩි වුණාට සන්තෝෂ වෙන්න ඕනෑ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම වැඩි වුණාට සන්තෝෂ වෙන්නේ කොහොමද? වැඩි කරනවා කියලා කියපු ගණනත් එක්ක නේ බලන්න ඕනෑ. මිනිස්සුන්ට බොරු පොරොන්දු දීලා ඡන්දය අරගෙන දැන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම නම් ටිකක් බාධා නොකර ඉන්න කියන්න. රුපියල් 250 රුපියල් 3000 ක් දක්වා වැඩි කරපු ආණ්ඩුව පෙරළන්න තමයි ඔබතුමන්ලා අලුත් ආණ්ඩු ගෙනාවේ. එතකොට ඔබතුමන්ලා කිව්වේ - ඒ කාලේ මහින්ද මහත්තයාගේ කාලයේ අවුරුද්දෙන් අවුරුද්දට කීයක් හරි වැඩි වුණා. දැන් අවුරුදු හතරටම 10,000 යි තිබෙන්නේ. හරි නම් වැඩි කරන්න ඕනෑ අයවැයවලදී. ඊට පස්සේ සතයක්වත් වැඩි කළේ නැහැ. තව අවුරුදු කීයකටද 10,000. දැන් ඩොලරයේ මිල කීයද? රුපියලේ අගය අඩු වෙලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ කීයක් වැඩි වුණත් ඇත්ද? ජීවන වියදම වැඩි වෙලා. පොල් ගෙඩිය 110 ට 120 ට ගිහිල්ලා. හාල් කිලෝ එක 120 ට ගිහිල්ලා. එවැනි තත්ත්වයක් තුළ මෙවැනි පොඩි ගණනකින් වැඩි කරලා ප්‍රමාණවත් නැහැ. රුපියල් විසි තිස් දාහකින් දැන් වැටුප් වැඩි කිරීම් කරන්න ඕනෑ. මිනිස්සුන්ගේ තිබෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන් වෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අවසන් කරන්න විනාඩියක් දෙන්න. මම කියාගෙන ආවේ සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් දුප්පත් අහිංසක මිනිස්සුන්ගේ ඒ මහජන ආධාරය තව වැඩි කළ යුතුව තිබෙනවා. සුදුස්සන්ටම දෙන්න. ඒ නිසා අපි බොහොම වගකීමෙන් ඉල්ලනවා. ඒ දුප්පත් මිනිස්සුන්ගේ සහනාධාරය වැඩි කරන්න. අවසාන වශයෙන් මම ඉල්ලනවා. ආබාධිත සහ ළමා නිවාසවල ඉන්න අයට දෙන දීමනාව. දවසක වියදම, දීමනාව අඩුයි. ඒ නිසා ඒ වියදම වැඩි කරලා ඒ අයටත් වැඩි සහනයක් දෙන්න. මේවා රැක බලාගෙන යන්න විශාල ප්‍රශ්නයක් කියමින්, විශේෂයෙන් ඇමතිතුමාගේ කටයුතු සාර්ථක වේවායි කියනවා. මීට වඩා වැඩි වගකීමකින්, ජවයකින් වැඩ කරන්න එළඹෙන වර්ෂයේදී එතුමාට හැකි වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා. 09.38 ]

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන්ම මම සෞඛ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. පුද්ගලිකවත්, මීගමුව ආසනයේ සංවිධායකවරයා හැටියටත්. එතුමා මීගමුව රෝහලේ පවතින වත්මන් තත්ත්වය පිළිබඳව මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට දුරකථන ඇමතුමක් දුන් සැණින් පසුදාම එතුමාගේ කාර්ය මණ්ඩලයත් එක්ක ඇවිල්ලා, ඒ තත්ත්වය බලලා, එතුමාගේ තිබුණු වපසරිය තුළ, එතුමාගේ අමාත්‍යාංශය හරහා කරන්න පුළුවන් හැකි තීන්දු තීරණ සෘජුව අරගෙන, ගරා වැටෙමින්, මන්දගාමීව ප්‍රතිසංස්කරණ කටයුතු වෙමින් තිබුණු රෝහලේ තට්ටු හතරක් මේ වෙද්දී සාර්ථකව නිම කරලා අර දුකෙන් මුදවා ගත්ත රෝගීන් වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තුතිය, ප්‍රණාමය ඔබතුමාට පුද කරනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඩෙංගු උවදුර වෙලාවෙත් ඔබතුමා ඇවිල්ලා බලලා, මම හිතන්නේ විශාල ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් තාවකාලික වාට්ටුවල හිටපු තත්ත්වය ඔබතුමා දැක්කා. ඒ දැකලා අපි ඉල්ලපු සේවක සේවිකාවන් හැකි ප්‍රමාණයක් දීලා, අපට ශක්තියක්, ධෛර්යයක් දීම පිළිබඳවත් පක්ෂ භේදයකින් තොරව, දේශපාලන මතවාදයකින් තොරව මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊට පස්සේ නම් තිබෙන්නේ විවේචන තමයි. අවුරුදු දෙකක් යන කල් ගරු ඇමතිතුමනි, රෝහල් අධිකාරීන් හය

[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

දෙනෙක් ආවා. දැන් ඉන්නේ හය වැනියා. මීගමුව වාගේ රෝහලකට මේ වාගේ මාස දෙකෙන්, හතරෙන්, පහෙන් රෝහල් අධිකාරීවරුන් මාරු කිරීම සුදුසු ක්‍රියාවක් නොවෙයි. ඒ වාගේම සේවකයින්ගේ තිබෙන ශක්තිය, ඒ අයගේ මොරාල් එක, ambition එක පහළට වැටෙනවා, මේ විධියට කටයුතු කරද්දී. ඒ වාගේම මේ මහ රෝහලේ වත්මන් තත්ත්වය පිළිබඳව කියද්දී, මේ තත්ත්වයෙන් ගොඩ එන්න නම් ශක්තිමත්, හොඳ සැලසුම් සහගත, හොඳ නායකත්වයක් දෙන්න පුළුවන් රෝහල් අධිකාරීවරයෙකුගේ අවශ්‍යතාවය කාලෝචිතයි. ඒක අවශ්‍යම කාරණයක් කියලා මේ අවස්ථාවේදී මම ඔබතුමාට අවධාරණය කරනවා. ඒක කරලා, ඉල්ලීමකුත් කරනවා. මොකද, දැන් මීට ඉස්සෙල්ලා ආපු කෙනත් ගිහිල්ලා, දැන් තව කෙනෙකු ආවා. එයත් තව මාස දෙක තුනකින් යන්නට පුළුවන්. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරලා, මීගමුවට අපට අවුරුදු හතරක් පහක්වත් කෙලින් වැඩ කරන්න පුළුවන් කෙනෙක් දෙන්න. මේ වැඩ කටයුතු අවසන් කරලා, මේ වාණිජ නගරයේ, මේ commercial hab එකේ මේ තිබෙන ජාත්‍යන්තර ගුවන් තොටුපල, ඒ වාගේම පිට ගම්මානවලින් කටාන, බඩල්ගම, දිවුලපිටිය, මීරිගම අනික් පැත්තෙන් ගත්තාම බසියාවත්ත, මේ මුහුදුකරයේ හැම ගම්මානයකින්ම ඇදී එන අයට මහ රෝහලක් ලෙස තිබෙන්නේ මීගමුව රෝහලයි. ඒ නිසා ඒකේ අධ්‍යක්ෂවරයා ශක්තිමත් අධ්‍යක්ෂවරයෙක් වෙන්නම ඕනෑ. අවුරුදු දෙකක කාලය ඇතුළත හය දෙනෙක්, හත් දෙනෙක් ආවා කියන්නේ, ඊට වඩා ඔබතුමාට මම පැහැදිලි කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි. පිටිපන බෙහෙත් ශාලාව. මේ බෙහෙත් ශාලාවේ විදුලිය සහ ජලය ලබා දීම අවශ්‍ය වෙනවා. ගොඩක් කල් ඉඳලා කරන ඉල්ලීමක්. උපදේශක කාරක සභාවටත් ලියලා කථා කළා. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වාගේම දැනට වැඩ නිම කරලා තිබෙන තලාහේන බෙහෙත් ශාලාව පිළිබඳවත් ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරනවා. ගොඩනැගිල්ල හදලා ඉවරයි. ඒකට අවශ්‍ය කරන මෙවලම් ටික දෙන්න තිබෙන්නේ. ඒක මම හිතන්නේ, මීගමුවේ කිලෝ මීටර් ගණනක් තිබෙන ප්‍රදේශයක්. ඒක අපි වත්තල ආසනයෙන් ගත්ත ප්‍රදේශයක්. ඒක ධීවර ගම්මානයක්. ඒ නිසා ඒ බෙහෙත් ශාලාව අවශ්‍යම කරන බෙහෙත් ශාලාවක්. මේ වෙද්දී ගොඩනැගිලි සාර්ථකව නිම කරලා තිබෙනවා. ඒ ගොඩනැගිලි හුදකලා වෙද්දී, සමහර රාජ්‍ය නිලධාරීන් වෙනත් වෙනත් දේවල්වලට ඒවා ගන්න හදනවා. මේ වෙද්දී ප්‍රාදේශීය ලේකම්තුමා වුණත්, ඒ ප්‍රදේශයේ ග්‍රාම සේවක මහත්තයාව ඒකේ කාමරයක තියන්න උත්සාහ කරනවා. අර ගොඩනැගිලි හුදෙකලා වෙනවාට වඩා යම් කාර්යයක් කරන්න පරිපාලන නිලධාරීන්, ඒ ක්ෂේත්‍රවල අය ඒවා ගිලගන්න බලාගෙන ඉන්නවා. ඒ නිසා මේක හැදුවේ බෙහෙත් ශාලාවකට. රෝහලකට. ඒකට වෛද්‍යවරු ඉන්නවා. ඒ නිසා ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරනවා. මේ කාල පරාසය අවසාන වෙන්න ඉස්සෙල්ලා මේ සභාවේ ඔබතුමා, ඒකේ කටයුතුත් කරයි කියලා අපේක්ෂා කරනවා. ඒ වාගේම එක දෙයක් මම ඔබතුමාගේ සිහියට නගනවා. මම දන්නේ නැහැ. රටේ නීතියද, මොකක්ද මේකට හරස් වෙලා තිබෙන්නේ කියලා. මේ පිස්සු බලු රෝගය. නැත්නම් ජලභීතිකා රෝගය. මේ රටේ මිනිස්සු මරනවා. මේ රටේ කිරි ගන්න ගවයාව ගැට ගහලා තිබෙද්දී ලක්ෂ ගණනක් වටිනා ගවයාගේ කකුල කපාගෙන යනවා. හරක් මරනවා, මේ බෞද්ධ රටේ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් රුපියල් මිලියන ගණනක් මේ එන්නත්වලට වැය කරනවා. රුපියල් මිලියන ගණනක්. ඇයි මේ බල්ලෝ මරන්න බැරි. මිනිස්සු මරන්න පුළුවන්. බල්ලෝ. ඒ නිසා මිනිස්සු වෙඩි තියලා මරනවා. මොකක්ද හරස් වෙලා තිබෙන්නේ. මේ මුදල් අපට මේ රටේ සුභ සිද්ධියට, වෙනත් යහපත් ක්‍රියාවන්වලට, අධ්‍යාපනයට, නැත්නම් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළම වෙනත් දේවල්වලට අපට යොදවන්න පුළුවන්. මිලියන ගණනක්. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. කොතැනද වැරදි වෙලා තිබෙන්නේ. කොයි නීතියද හරස් වෙලා තිබෙන්නේ කියන්න මම දන්නේ නැහැ.

අවසාන වශයෙන් වැඩිය කරුණු කාරණා කියන්නේ නැහැ. මම ඒ මීගමුව ගැන කියන්නේ. මම හිතන්නේ, මගේ අවසාන කථාව වෙන්නට පුළුවන්. ඉදිරියේ එන පළාත් පාලන මැතිවරණයේදී මීගමුව මහ නගර සභාවට මම නගරාධිපති අපේක්ෂකවරයා හැටියට තරඟ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම මේ සභාවට ආපු දවසේ ඉඳන් දැනට අවුරුදු තුනහාමාරක් කල් ඉකුත් වෙනවා. ඒ කාලය තුළ හොඳ තෝතැන්නක් වුණා මට මෙතැන. අපි

නගර සභාවෙන් දේශපාලනයට ඇවිල්ලා, නගර සභාවේ මම විපක්ෂ නායකවරයා හැටියට තුන් වතාවක් නගරාධිපතිවරු තුන් දෙනෙක් එක්ක වැඩ කළා. නිමල් ලාන්සා මැතිතුමා නගරාධිපතිවරයා හැටියට සිටිද්දී. ඇන්ටනී ජයවීර මැතිතුමා නගරාධිපතිවරයා හැටියට සිටිද්දී. ඒ වාගේම හර්මන් කුරේ මැතිතුමා නගරාධිපතිවරයා හැටියට සිටිද්දී, මම විපක්ෂ නායකවරයා හැටියට හිටියා. මම මේ සභාවට ආවේ පොලිස් අත්අඩංගුවේ සිටිද්දී. දෑතට විලංගු දාලා. ඒ ආපු වෙලාවේ ඉඳලාම අපට උදව් කරපු නිලධාරීන්ට විශේෂයෙන් ගරු සභාපතිතුමාට, නියෝජ්‍ය සභාපතිතුමාට, අමාත්‍යවරුන්ට, මහ ඇමතිවරු දෙන්නෙක් යටතේ අපට ඉන්න සිද්ධ වුණා. අපි ගම්වල වැඩ කටයුතු කළේ අපට දීපු ඒ ප්‍රතිපාදන නිසා. ඒවාවලට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සභා ලේකම්තුමාවත්, අපේ හැන්සාඩ් කටයුතු කරන හැන්සාඩ් සංස්කාරක වරුණ ගුණරත්න මහත්මයාවත්, සම්බන්ධීකරණ නිලධාරී ලසිත් විතාන මහතාවත් ආදරයෙන් ගෞරවයෙන් සිහිපත් කරනවා. මොකද, අපි මෙතැනට ආවේ ළදරුවෝ හැටියට. සමහර විට කථාවක් කරද්දී අපි කථාව මැද්දෙන් යනවා. ඒ වාගේම අපි යමක් ඇහුවාම අපට අවශ්‍ය කරන උපදෙස් දීලා ශක්තියක් වුණා, අත්වැලක් වුණා මේ ගමන එන්න. අපි ගම්වලට වැඩ කළේ මහ ඇමතිතුමා දුන්න සල්ලිවලින්. ඒකත් අපි මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. මේ අවුරුදු තුන ඇතුළත ජාතික දේශපාලන තලය තුළ අපට ඇත්තටම අවංකවම යමක් ඉගෙන ගන්න පුළුවන් වුණා කියලා මම හිතනවා. මැතිවරණය කල් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අපි පසුව පොඩි කාලයක් දෙනවා. ඔය සම්බන්ධව කථා කරන්න.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

එහෙම නම් ගොඩක් ස්තුතියි. මේ වැය ශීර්ෂයට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මොකද, සමුගන්නා දෙන්නෙක් ඉන්නවා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ. ඒකේ දාලා නැහැ. මේකෙන් ඉවර කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නම් ඉවර කරන්න.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

සියලුම දෙනාට ගෞරවනීය ස්තුතිය පුද කරනවා. කැබිනට් මණ්ඩලයට, විපක්ෂ නායකතුමාට, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට. අපට ගුරුහරුකම් දීපු මේ සියලුම දෙනාට ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 09.48 ]

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා 22 ක් මේ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව ඔවුන්ගේ දැනුම තුළින්, ඔවුන්ගේ උපදෙස්, ඔවුන්ගේ යෝජනා මට ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම හිතන්නේ මම වාසනාවන්ත වෙනවා. මේ රටේ අග්‍රාමාත්‍යවරයෙකු වෙලා හිටපු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයෙකු වශයෙන් හිටියා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ඒ වාගේම අපේ වර්තමාන ජනාධිපතිතුමා මේ රටේ සෞඛ්‍ය අමාත්‍යවරයෙක් වෙලා හිටියා අපේ ආණ්ඩුවේ. ඒ වාගේම

[ගරු සුමිත්ලාල් මැන්දිස් අමාත්‍යතුමා]

අද බස්නාහිර පළාතේ - පළාතකට හරි සෞඛ්‍ය අමාත්‍යධූරය ලැබීමට මම වාසනාවන්ත වුණාය කියලා මම හිතනවා. ඒ නිසා අපි අපේ නායකයින්ගෙන් ගත්ත උපදෙස්, අනුශාසනා අනුව මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව මුළු රටේම පවතින ගැටළු සහගත තත්ත්වයන්වලට බස්නාහිර පළාතේ අපට උත්තර සපයන්න සිද්ධ වෙලා තිබෙනවා. දැන් අපේ මන්ත්‍රීවරුන්ගෙන් අදහස් පළ වුණා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් පිළිබඳව. මම අද උදේ වාහනයේ ප්‍රවෘත්ති අහගෙන එන කොට මට ඇහුණා, අපේ මධ්‍යම රජයේ අමාත්‍යාංශ ලේකම්වරයා ප්‍රකාශ කරනවා, හෙදියන් 6000 ක් අපට අඩුයි කියලා. මුළු රටටම. ඒ වාගේම වෛද්‍යවරු 2000 ක් අඩුයි කියලා. ඉතින් මේක අපට ලොකු අඩුවක්. බස්නාහිර පළාත ගත්තාම රටේ 1/3 ක් ජීවත් වන ජනතාවගේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නගා සිටුවන්න අපට වෛද්‍යවරුන්ගේ, ඒ වාගේම හෙදියන්ගේ හිඟය බොහොම තිබෙනවාය කියන එක අපට හොඳට පේනවා. ඒ නිසා ඒවාත් තියාගෙන තමයි අපි මේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නගා සිටුවන්න වැඩ කටයුතු කර ගෙන යන්නේ.

අපි පසුගිය කාලයේ මට ලැබුණු අවුරුද්දක කාලය තුළ මම තොරතුරු සොයා ගෙන, අපි මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන අඩුපාඩු සොයා බලලා, ඒ වැඩ පිළිවෙළවල්වලට අවශ්‍ය කරන පහසුකම් හුඟාක් අපි ලබා දුන්නා. විශේෂයෙන් අපේ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඩෙංගු වසංගතය. මම සෞඛ්‍ය ඇමතිවරයා වෙලා මාස හයක් යන කොට ඩෙංගු වසංගතයට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ නිසා අපි ඒ ඩෙංගු වසංගතයට මුහුණ දෙන අවස්ථාවේ අපි මේවා කර ඇරියේ නැහැ. ඒ වෙලාවේදී මන්ත්‍රීවරුන් සියලුම දෙනාගේ සහයෝගය, පක්ෂ භේදයෙන් තොරව අපට ලැබුණා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සම්පූර්ණ අනුශාසනා ලැබුණා. ඒ වාගේම අපේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉන්න සියලුම නිලධාරීන්. පළාත් අධ්‍යක්ෂතුමාගේ සිට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු, වෛද්‍යවරු සියලු දෙනාම, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා පළාත් පාලන ආයතනවලින් ලැබුණු සහයෝගය නිසා අපට මේක පොඩ්ඩක් සමනය කර ගන්න දැන් පුළුවන් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කිව්වා වාගේ, මේකට ඉදිරියේදීත් ආයිත් මුහුණ දෙන්න ඕනෑ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක සම්බන්ධ වෙලා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා පළාත් පාලන ආයතනත් එක්ක සම්බන්ධ කර ගෙන - මේ යම් වැඩ පිළිවෙළක් හදන්න කැළි කසළ ප්‍රශ්නය නිසා තමයි මේ ඩෙංගු උවදුර වැඩි වෙන්නේ. ඒ නිසා මේ කැළි කසළ ප්‍රශ්නයට විසඳුම් දෙන ගමන් අපි ඩෙංගු වසංගතය තුරන් කරන්න අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනවා.

ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා. අපේ තිබෙනවා, සෞඛ්‍ය සේවා වෛද්‍ය නිලධාරී කාර්යාල, MOH කාර්යාල 42 ක්. මේ 42 න් කොළඹ 15 ක් තිබෙනවා. ඒ වාගේම ගම්පහ 16 ක් තිබෙනවා. කළුතර 11 ක් තිබෙනවා. මේකෙන් ළමා හා මාතෘ ප්‍රතිකාර 450 කට ලබා දෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා අලුත් වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න. අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍ය නිලධාරීන්, අපේ අධ්‍යක්ෂවරුන්ගේ වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒ අවශ්‍යතාවයන් අනුව මේ සියලුම MOH කාර්යාලවල - දැන් මෙතැන කථා වුණා. හැම කථිකයෙකුම වාගේ කිව්වා. අපි ග්‍රාමීය මට්ටමෙන් මේවා දියුණු කරන්න ඕනෑය කියලා. ඒ නිසා ග්‍රාමීය රෝහල්වල පමණක් නොවෙයි මේ MOH කාර්යාලවල අවශ්‍ය කරන සියලුම උපකරණ, සියලුම පහසුකම් ලබා දෙන්න අපි ලබන අවුරුද්දේ අවශ්‍ය වැඩ කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. ඇයි අපි එහෙම කරන්නේ? බස්නාහිර පළාතේ අපට නිරෝගීමත් ජනතාවක් බිහි කර ගන්න අවශ්‍යතාවය තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාතේ අපට ලොකු වගකීමක් තිබෙනවා. අර ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී පිරිසක් ඉන්නවා. මේගොල්ලොත් මේ වැඩ පිළිවෙළට එකතු කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි තව අලුත් වැඩ පිළිවෙළක් කරනවා. දිස්ත්‍රික්ක තුනකට ග්‍රාමීය රෝහල් තුනක්. ඒ ග්‍රාමීය රෝහල්

තුනේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පමණක් නොවෙයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් එක්ක එකට සිටින වැඩ පිළිවෙළක් අපි සංවිධානය කරනවා. අපි ග්‍රාමීය මට්ටමෙන් දිස්ත්‍රික්ක තුනේ රෝහල් තුනක් යොදා ගෙන - උදාහරණයක් වශයෙන් දැනටමත් අපි හඳුනාගෙන තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමා නිතරම කියනවා, මේ වත්තල MOH එක ගැන. අපි බලාපොරොත්තු වෙනවා, ඒ වාගේ ව්‍යාපෘතියක් කරන්න. ගම්පහ දිස්ත්‍රික්කයේ. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ අපේ රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමා ඉන්න පළාත. කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා ඉන්න පළාත. බදුරලිය. අපි ඒ බදුරලිය රෝහලක් ඒ වාගේ රෝහලක් හැටියට නවීකරණය කරනවා. ඊට අවශ්‍ය ප්‍රතිපාදන අපට ප්‍රධාන අමාත්‍යතුමා දීලා තිබෙනවා.

ඒ වාගේම මේ රොහල් පිළිබඳව කථා කරන කොට අඩුපාඩු හුඟාක් තිබෙන විත්තිය අපි දන්නවා. ඒ නිසා මධ්‍යම රජයෙන් අපට විශාල සහයෝගයක් ලැබිලා තිබෙනවා, රාජිත සේනාරත්න ගරු අමාත්‍යතුමා හරහා. අවශ්‍ය කරන ප්‍රතිපාදන අපට තිබෙනවා. අපට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, කාර්මික නිලධාරීන්ගේ අඩුව. අපට මේ ඇස්තමේන්තු හදා ගැනීමේදී, ගොඩනැගිලි හදා ගැනීමේදී ලොකු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. අද බස්නාහිර පළාතට පමණක් නොවෙයි. මුළු රටේම පළාත් පාලන ආයතනවලට මේ නාගරික සංවර්ධන අධිකාරිය ඇඟිලි ගසන නිසා, මේ සැලසුම් අනුමත කිරීමේදී ලොකු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. මම ඒ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. බස්නාහිර පළාතේ අපි ප්‍රඥප්තියක් සකස් කරලා තිබුණා. මේක ඉක්මණින් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මම උදාහරණයක් වශයෙන් කියන්නේ. දැන් ගොඩනැගිල්ලක් හදන්න ගියාම එක්තරා ගොඩනැගිල්ලකට දැන් මාස හයකට වැඩියි මේ ආයතනවලින් අනුමැතිය ගන්න ගිහිල්ලා. තමුන්නාන්සේලා දන්නවා මේ පාසල් ගොඩනැගිලි හදන කොට අපි පසුගිය කාලයේ ප්‍රාදේශීය සභාවට ගියා. ප්ලෑන් එක පාස් කළා. ගොඩනැගිල්ල හැදුවා. දැන් නාගරික සංවර්ධන අධිකාරියට ගියාම පහත් බිම් එකෙන් ගේන්නය කියනවා. පරිසර එකෙන් ගේන්නය කියනවා. මේකේ ෆයිල් එක එහෙට මෙහෙට යන කොට මාස හයක් හතක් ගිහිල්ලා. අවුරුද්ද ගිහිල්ලා ඉවරයි ප්ලෑන් එක අනුමත වෙන කොට. ඒ නිසා මේවා නිවැරදි වෙන්න ඕනෑ. ශීඝ්‍ර සංවර්ධනයක් කරා යනවා නම් මේවා නිවැරදි වෙන්න ඕනෑ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි කාලයේදී මේ වැඩ කටයුතු කරන්න. ඒ වාගේම අපේ ආයුර්වේද ක්ෂේත්‍රය ගත්තාම - ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. එතුමා කිව්වා, මොල්ලිගොඩ රෝහලට ඇඳන් වගයක් ගෙනැල්ලා තිබෙනවා. ප්‍රමිතියක් නැහැයි කියලා කොමසාරිස්තුමිය කිව්වා කියලා දන්නේ නැහැයි කියලා. මම කොමසාරිස්තුමියගෙන් විමසුවා. එතුමිය කිව්වා, එහෙම කියලා නැහැ. ඇඳන් 35 ක්. විදේශීය යුවලක් ඇවිල්ලා, මාත් එක්ක ගිහිල්ලා බලලා, සුමානයෙන් ඇඳන් 35 ක් එව්වා. ඉලෙක්ට්‍රික් ඇඳන්. නොමිලයේ එව්වා. ඒ ඇඳන්වල ලක්ෂ 50 කට වැඩි වටිනාකමක් තිබෙනවා. අපට වියදම් වුණේ බස්නාහිර පළාතෙන් ලක්ෂ හතරයි. මේක අපට නිදහස් කර ගන්න. ඒ නිසා මේ ඇඳන් ටික මොල්ලිගොඩ රෝහලට පමණක් නොවෙයි. අපේ මීගොඩ රෝහල තිබෙනවා. එහෙටත් බෙදලා දීලා ඒ අවශ්‍ය කටයුතු කරනවා. ඒ වාගේම කැන්දකඩුව රෝහල ගැන ගරු ස්වාමීන් වහන්සේ සඳහන් කළා. අපි බලාපොරොත්තු වෙනවා, බස් එකක් මිලදී ගෙන දිස්ත්‍රික්ක තුනට බස් තුනක් දාලා, ආයුර්වේදයට යන්න අපහසු අයට අවශ්‍ය කරන පහසුකම් දීලා බස් තුනක් ලබා දෙන්න, ආයුර්වේද දෙපාර්තමේන්තුවට ඒ රෝගීන්ව ප්‍රවාහනය කරන්න. ඉතින් ඒ වාගේ කටයුතු ප්‍රමාණයක් අපි කරනවා.

ඒ වාගේම මී උණ පිළිබඳව. මී උණ පිළිබඳව ගත්තාම ඇත්ත වශයෙන්ම ගොවියෝ කුඹුරට බහින්නේ නැහැ. අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඉන්නවා. මම යෝජනා කරනවා. අපට පුළුවන් මේකට ප්‍රතිකර්මයක් දෙන්න. බෙහෙත් පෙත්ත දුන්නාම ගොවියාගේ වකුගඩු නරක් වෙන්න බලනවා. ඒ නිසා අපි බෙහෙත් පෙත්ත නොදී අවශ්‍ය කරන මේස් කුට්ටමක්, තාක්ෂණයෙන් දියුණු මේස් කුට්ටමක් ලබා දෙන්න අපි අවශ්‍ය පහසුකම් සලසනවා, බස්නාහිර පළාතේ ගොවියන්ට. ඒක ගරු ඇමතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා මම ඒ වැඩ පිළිවෙළ කරනවා. ඒ නිසා මම අපේ අනෙකුත් ආයතන, සමාජ සේවා දෙපාර්තමේන්තුව. ඒ වාගේම අපේ පරිවාස

[ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා]

දෙපාර්තමේන්තුව. බොහොම හොඳින් වැඩ කටයුතු කර ගෙන යනවා. ඒ නිසා අපි ඉදිරියේදී මේ වැඩ පිළිවෙළ තවත් ඉදිරියට ගෙනියනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී ස්තුති කරනවා. අවස්ථාවක් කර ගන්නවා. අපේ අමාත්‍යාංශයේ නව ලේකම්තුමා හොඳ සංවර්ධන සැලැස්මක් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම අලුත් අධ්‍යක්ෂවරයෙක් ඇවිල්ලා ඉන්නවා. හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. එතුමා බොහොම තරුණයි. ඉක්මනට පෙන්ෂන් යන්නේ නැහැ. වයස තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ බලාපොරොත්තුව අපි ඉෂ්ට කරනවා. ඒ වාගේම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු. අපේ අමාත්‍යාංශයේ නිලධාරීන්. සැලසුම් අංශයේ සියලුම නිලධාරීන්. කම්කරුවෝ පවා අපට අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම තව ප්‍රකාශයක් කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා කාලය ඉවරයි. තත්පර ගණනක්වත් නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

බොහොම ස්තුතියි. තව තත්ත්පරයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න බැහැ ගරු ඇමතිතුමා. ඔබතුමා කාලය තියා ගන්න ඕනෑ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒ වාගේම සියලුම සේවකයින් ස්ථිර කරනවාය කියන එකත් කියනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමන්ලාගේ කාලය හැමෝටම බෙදනවා. කථා කරන්න ගියාම ඇමතිතුමන්ලාට කාලය මදි. ඒකයි වෙන්නේ.

***පූ.භා. 09.59 ට, අංක 105, 113, 114, 115 හා 116 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 105, 113, 114, 115 and 116 Was concluded at 09.59 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 105, 115, 116 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

*ඊට අනුකූලව,*

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 105 was proposed and adopted.*

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 113 was proposed and adopted.*

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 114 was proposed and adopted.*

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 115 was proposed and adopted.*

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*The question of the amount stated in Head No. 116 was proposed and adopted.*

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමා මගේ නම කියපු හින්දා. කොමසාරිස්තුමිය සම්බන්ධයෙන් ඇහුවේ. ප්‍රමිතිය සම්බන්ධයෙන් නොවෙයි. ඇහුවාට පස්සේ එතුමිය කිව්වේ, ඒ පිළිබඳව කියන්න දන්නේ නැහැයි කියලා. ප්‍රමිතය සම්බන්ධව මොනවත් කිව්වේ නැහැ. කිව්වේ, එතුමිය ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කියන්න දන්නේ නැහැ කියලා විතරයි.

# 2018 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය

THE APPROPRIATION STATUTE RELATING TO THE FINANCIAL STATEMENT - 2018

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය." යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධ සාකච්ඡාව දැන් ආරම්භ වෙනවා. මෙම සාකච්ඡාව පොදු වැදගත්කමකින් යුත් පරිපාලන ප්‍රතිපත්ති හා අදාළ කරුණුවලට පමණක් සීමා විය යුතු බව රීති අංක 51(3) හි දැක්වෙනවා. අනවශ්‍ය එක එක වල්පල් දොඩවන්න යන්න එපා. අදාළ දේ විතරක් කථා කරන්න. මම පළමුවෙන්ම විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය ආරම්භ කිරීමට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.02 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේක ප්‍රජාතන්ත්‍රවාදය ගැන ආයිත් අටුවා ටීකා කථා කරන්න වෙලාවක් නොවෙයි. හැබැයි, කෙසේ වෙතත් අපේ මේ ගරු මන්ත්‍රීවරු 104 දෙනෙකු මෙතැනට එන්නේ තමන්ව පත් කර ගත්ත ඒ ජනතාවගේ අවශ්‍යතා, ඕනෑ එපාකම් බලලා ඒ අය වෙනුවෙන් දෙන කොටස අරගෙන යන්න. මේක තමයි ඇත්ත. ඒ නිසා එවැනි අවස්ථාවලදී මේ හැම මන්ත්‍රීවරයෙකුටම තිබෙනවා, සමාන අයිතිවාසිකමක්. හැමෝටම මේ සමානව සම්පත් ටික බෙදිලා යන්න ඕනෑ. මම හැම අවස්ථාවකදීම මතක් කරන කාරණයක්. ඒ නිසා අපි දන්නවා. කිසියම් වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් අපි දක්වන ප්‍රතිචාරය, මතය, විවේචනය මත ලබා දෙන ප්‍රතිපාදන හෝ වෙනත් පහසුකම් වෙනස් වෙන්න බැහැ. විචලනය වෙන්න බැහැ. මොකද ඒකට හේතුව, අපි හැමෝටම වගකියන පිරිසක් ඉන්නවා. ඒ තමයි අපට ඡන්දය දුන් ජනතාව. ඒ අය වෙනුවෙන් අපි හැමෝටම තිබෙන්නේ සමාන වගකීමක්. ඒ නිසා ඒ වගකීම ආයිත් සුළුකොට තකන්න බැහැ. ඒ නිසා ගිය වසරේ වාගේ සමහර තැන්වලදී - ගිය වසරේදී අපි දැක්කා සමහර ඇමතිවරු, තම තමන්ගේ හෘදය සාක්ෂිය ඒක දන්නවා. සමහර මන්ත්‍රීවරුන්ට සැලකුවේ නැහැ. සමහර මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව නොසලකා හැරිය අවස්ථා අපි දැක්කා. ඒ නිසා මේ විවේචනය කළයි, එහෙම නැත්නම් හොඳ නරක පෙන්වලා දුන්නාය කියලා ඕකා ඊළඟ අවුරුද්දේ එයිනේ මගෙන් ඉල්ලාගෙන කියලා කියන්න තරම් තත්ත්වයට වැටෙන්න එපාය කියලා මම සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. ඒක මම හිතන්නේ ජනතා සේවකයෙකුට ගැලපෙන්නේ නැහැයි කියලයි මගේ හැඟීම.

ඒ නිසා දවස් හයක් තිස්සේ අපි කථා කළා. අඩුපාඩු කිව්වා. හොඳ නරක කිව්වා. නොකළ යුතු දේ ගැන කිව්වා. අවසානයේ විසර්ජන ප්‍රඥප්තියට ඒ කියන්නේ, අපි අවසරය දෙන්න සූදානම් වෙනවා. අපි දන්නවා. 2018 දෙසැම්බර් 31 දක්වා මේ සභාව ඉදිරියට යයිද? නොයයිද කියලා දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මීළඟ පළාත් සභාවට එක් වෙයිද නැද්ද දන්නේ නැහැ. මේ යථාර්ථය අවධානම තිබෙනවා. කෙසේ වෙතත් අපි ලබන වර්ෂයේදී රුපියල් මිලියන 71,645 ක් වියදම් කරන්න අවසර දෙන්නයි හදන්නේ. මම කියන්න කැමැතියි. 2016 මහ බැංකු වාර්තාවේ කියනවා මෙන්න මෙහෙම දෙයක්. මොකක්ද? "පළාත් සභා මධ්‍යම රජයේ අයවැය මත දක්වන රැඳියාව අවම කර ගැනීම සඳහා පළාත් සභාවල ආදායම් එක්රැස් කිරීම, ධෛර්යවත් කිරීම අත්‍යවශ්‍ය වේ" කියලා. මේකෙන් හැඟී යන්නේ මොකක්ද? අපි ප්‍රමාණවත් තරම් අපේ වියදමට තරම්වත් අපි හම්බ කරනවා වෙනුවට, ආදායම් උපයනවා වෙනුවට අපි මධ්‍යම රජයේ මුදල් මත යැපෙන්න බලාගෙන ඉන්නවා කියලා. ඒ කියන්නේ, මේකෙන් ගම්‍ය වෙන්නේ අපට යම් අවස්ථාවක් තිබෙනවා. ඉඩකඩක් තිබෙනවා. හැකියාවක් තිබෙනවා. අපේ ආදායම වැඩි කර ගන්න කියන එක. අපි දන්නවා. ලබන වර්ෂයේ

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

ඇස්තමේන්තු මුළු වියදම රුපියල් මිලියන 71,645 ක්. ඒකෙන් පුනරාවර්තන වියදම රුපියල් මිලියන 59,995 යි. ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 11,650 ක්. දැන් මගේ අවධානය මේ ප්‍රාග්ධන වියදම වැඩි වීම. 2017 වර්ෂය සමඟ සසඳන විට 60% ක් බව පෙන්වනවා, අපි පුරෝකථනය කරලා තිබෙන ගණන් මිනුම් අනුව. ප්‍රාග්ධන වියදම සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස බැලුවාම 16% යි. නමුත් මම පොදු සාකච්ඡාවේදීත් පෙන්වා දුන්නා ගරු සභාපතිතුමනි, දියුණු වන ආර්ථිකයක නම් සාමාන්‍යයෙන් අඩුම තරමින් මේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය 20% ක් දක්වාවත් වර්ධනය කර ගන්න ඕනෑ. හැබැයි, ප්‍රාග්ධන වියදම වැඩි කර ගන්න නම් අපේ ආදායම වැඩි වෙන්න ඕනෑමයි. නමුත් ආදායම් වැඩි වීම් පසුගිය වසර තුළ රජයෙන් ලැබෙන NBT සහ මුද්දර ගාස්තු හැර ආදායම වැඩි වීම අපේ 23% ක්. 23% ක් කියන්නේ ප්‍රමාණවත් නැහැ. අර මම කලින් කියපු විධියට අපේ ප්‍රාග්ධන වියදම 20% ක් දක්වා වැඩි කරන්න නම් අපට වසරකට 40% ක වත් ආදායම් වැඩි කර ගන්න වෙනවා. ඉතින් 40% ක සීමාවට යන්න අපි මොකක්ද කරන්න ඕනෑ. ඒක ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. පළමුවෙන්ම අපි කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ තමයි, මීටත් වඩා වැදගත් දෙයක්. මොකක්ද? පළාත් සභාවේ මූල්‍ය හා භෞතික ප්‍රගතියක් අත් කර ගැනීම. දැන් මේ වසරේ සාමාන්‍යයෙන් දළ වශයෙන් මම හිතනවා, භෞතික හා මූල්‍ය ප්‍රගතිය 30% සීමාවේ තිබෙන්නේ. ඔක්තෝබර් 31 වන කොට තිබුණේ සමස්ත ප්‍රගතිය 24 % යි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. මේ සභාවේදී ලබන වසරේවත් අවසානය තෙක් ඉන්නේ නැතිව. දැන් අපි ඊළඟට ඡන්දයකට යන්න ලැහැස්ති වෙන්නේ. ඡන්දය කවදා තියෙයිද දන්නේ නැහැ. නිලධාරීන් දැනුවත් කරලා, ප්‍රතිපාදනවල වැඩ සටහන්වල වේගය වැඩි කළ යුතුයි. ඒ නිසා අපි මීට අමතරව මොකක්ද කරන්න ඕනෑ. මේක ඉතාම වැදගත්. ජාතික අයවැය සමඟ අපි කල්පනා කරලා බැලුවොත්, ජාතික අයවැය ඉදිරිපත් කරන වෙලාවේදී මහ බැංකුව උප රාජ්‍ය ආයතනවල අයවැය කටයුතු ගැන කියනවා මෙන්න මෙහෙම,

*"ගෙවී ගිය වසර තුළදී උප රාජ්‍ය මට්ටමේදී ප්‍රමුඛතාවය ලබා දෙන ලද්දේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යෑමට හා අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පමණයි."*

මේකෙන් තේරෙන්නේ මොකක්ද? අපි පාරවල් හදන්නයි, අධ්‍යාපනයටයි, සෞඛ්‍යයටයි විතරයි මුදල් වැය කරලා තිබෙන්නේ. මේකෙන් ගම්‍ය වෙන්නේ, අපි මීට වඩා පුළුල් සීමාවක් ඇතුළේ උප රාජ්‍ය හැටියට පළාත් සභාවල කටයුතු වඩා පුළුල් සීමාවක් ඇතුළේ, පුළුල් පරාසයක වියදම් කරන්න සිද්ධ වෙනවාය කියන එකයි. 2016 දී පළාත් මට්ටමෙන් ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කළා. අපි දන්නේ නැහැ පළාත් නායකත්වය මේවා ගැන දැනුවත්ද? කියලා අපි දන්නේ නැහැ. මේ සභාව දන්නේ නැහැ. ඒ යෝජනා මොනවාද? ඒ යෝජනා ක්‍රියාත්මක වුණාද? ඒ යෝජනා අධීක්ෂණය වුණාද කියලා ගරු සභාපතිතුමනි, අපි දන්නේ නැහැ. කොහොම වෙතත් පළාත් සභාවල අයවැය කටයුතුවල ප්‍රගතිය දෙස ආපහු හැරිලා බලන කොට පෙනෙන දෙයක් තමයි, ආදායම ඉහළ ගිහිල්ලා තිබෙනවා. මුද්දර බදු ආදායම්වලින්, ජාතිය ගොඩ නැඟීමේ බදු ආදායමෙන් මධ්‍යම රජය සිදු කළ පැවරුම් ඉහළ ගිය නිසා පළාත් සභාවල සමස්ත ආදායමේ යම් වැඩි වීමක් තිබෙනවා. 2015 සිට 2016 හා සංසන්දනය කරන කොට බිලියන 68 ඉඳලා බිලියන 77 දක්වා වැඩි වී තිබෙනවා. ඒ කියන්නේ, 13% ක වැඩි වීමක් තිබෙන්නේ. නමුත් බදු නොවන ආදායම පළාත් සභාවල සමස්තයක් හැටියට ගත්තාම 2015 සිට 2016 ට බිලියන 6.5 ඉඳලා 7.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. 20% ක ප්‍රගතියක්. අර මම කියපු කාරණයට ආයිත් එනවා. 20% න් එහාට අපට ප්‍රගතියක් අත්කර ගන්න බැරි වෙලා තිබෙනවා. රටක් හැටියට, සමස්ථයම. පළාත් සභා පද්ධතිය තුළම. ඒ නිසා මේක මේ පළාත් සභා ක්‍රමය ඇතුළේම යම් ව්‍යාජ තත්ත්වයක් තිබෙනවා.

මොකද, අපට ආදායම වැඩි කර ගන්න බැරි වෙලා තිබෙන නිසා. රට තුළ සමස්ථයක් හැටියට ප්‍රාග්ධන වියදම බැලුවාම 2015 යි 2016 යි සංසන්දනය කරන කොට, රටේම පළාත් සභාවල ප්‍රාග්ධන වියදම බිලියන 47 ඉඳලා 39 වන තෙක් අඩු වෙලා තිබෙනවා. මේක ටිකක් බරපතළ තත්ත්වයක්. ඒ නිසා මේකට හේතුව හැටියට පේන්න තිබෙන්නේ, පළාත් සභාවලට ආදායම උපයන්න තිබෙන සීමා. ඒ නිසා මේ සීමා බිඳින්නේ කොහොමද කියන එක තමයි ගරු සභාපතිතුමනි, අපි ඉදිරියේ තිබෙන අභියෝගය. ඒ නිසා මම මීට පෙර පොදු සාකච්ඡාවේදී පළමුවත් කථා කරලා, මේ කාරණය මතක් කළා. බදු සම්බන්ධයෙන් අපි

මීට වැඩිය විධිමත් වෙන්න ඕනෑ. මොකද, රට ඇතුළේ ජාතික මට්ටමෙනුත් බදු ප්‍රතිපත්තිය පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා මේ රටේ බදු ප්‍රතිපත්තිය යළි ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස් කරන තුරු මේක අත්පත් කර ගන්න අමාරුයි කියන ප්‍රශ්නය මතු වෙනවා. කෙසේ වෙතත් මේ ඉඩම් බදු පැනවීම, ඒවා යාවත්කාලීන කිරීම වාගේ කටයුතු මම හිතනවා, පළාත් සභාවට භාර දෙන්න පුළුවන්. වෙන රටවල එහෙම භාර දීලා තිබෙනවා. ඒ නිසා අපට ඒකත් කර ගන්න පුළුවන් නම් අපේ ආදායම වැඩි කර ගන්න පුළුවන්. ඊළඟට අපි දන්නවා. දැන් උදාහරණයක් හැටියට කියනවා නම්, අධ්‍යාපනයට අපට සල්ලි දුන්නා. ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියෙන්. කෙළින්ම අපට සල්ලි දෙන්නේ නැතිව ඒක ඉසුරුපායට ගිහිල්ලා එතැනින් සල්ලි ටික බෙදලා යන්න ගියාම මේ යාන්ත්‍රණයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ගැටළු රැසකට මුහුණ දෙනවා. ඒ නිසා කෙළින්ම අපේ බජට් එකට ඒ සල්ලි එකතු කරලා තිබුණා නම් මම හිතන්නේ, අපේ ප්‍රධාන අමාත්‍යතුමාත් මේකට එකඟ වෙයි. එහෙම එකතු කරලා තිබුණා නම්, අපට ප්ලෑන් එකකට පළාත් සභාව හැටියට අපට වැඩ කරන්න තිබුණා.

ඒ වාගේම සෞඛ්‍ය සම්බන්ධයෙන් වුණත් එහෙමයි. සෞඛ්‍යයට සම්බන්ධ සල්ලි ටික එහෙට ගිහිල්ලා බෙදිලා එන කොට අපට සැලසුම් සහගතව වැඩ කරන්න බැහැ. ඉතින් මේවා ප්‍රායෝගික ප්‍රශ්න. මේවා විසඳගන්න ඕනෑ කොහොමද කියන එක ගැනවත් මම හිතන්නේ නැහැ, අපට මේ වන කොට අදහසක් තිබෙනවාද කියලා. ඒ නිසා ක්‍රමවත්ව, වඩා වේගයෙන් වැඩ කරන්න පුළුවන් ක්‍රමය අපි හදා ගන්න ඕනෑ. එහි යාන්ත්‍රණය හදා ගන්න ඕනෑ. ඒ වාගේම මම කියන දෙයක් තමයි - මම ඇමතිවරුන්ටත්, මහ ඇමතිතුමාටත් මීට කලිනුත් මතක් කළා. ගරු සභාපතිතුමනි, අපි මේ දේශපාලනික වශයෙන් බදාගෙන ඉන්නේ නැතිව මේ කටයුතු, අපේ තිබෙන හැකියාවන් - මම උදාහරණයක් හැටියට කියන්නේ. අපේ අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා - මට මතකයි, කෘෂිකර්මය ගැන කථා කරන වෙලාවේදී එතුමා අපේ ප්‍රශ්න පිළිබඳව ඉතා කදිම විද්‍යාත්මක පැහැදිලි කිරීමක් කළා. ඒ වාගේම අපේ ජගත් විතාන මන්ත්‍රීතුමා ප්‍රවාහනය ගැන කථා කරන විට. ඉතා කදිම විග්‍රහයක් කළා. මේ ඇමතිවරුන්ට ඒවා සම්පත්. ඒවා සම්පත් හැටියට ප්‍රයෝජනයට ගන්න. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනා අතරේ මහා විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. අපේ ගමන ඉදිරියට යන්න අවශ්‍ය ගාමක බලය ලබා ගන්න. ඉතින් ඒ බලය ලබා ගන්න අවශ්‍ය දේවල් මම හිතනවා, අපි කළ යුතුයි කියලා. ඒ ගමන්ම මම අවධාරණය කරනවා. අපේ මන්ත්‍රීවරු මතු කරපු කාරණා. ගිය අවුරුද්දේ වාගේ ඒවා නොසලකා හරින්න එපා. පසුගිය හැන්සාඩ් වාර්තා බැලුවාම පේනවා, අපේ ගරු මන්ත්‍රීවරු මේ අමාත්‍යාංශ ඉහළට ගෙනියන්න යෝජනා කොපමණ ඉදිරිපත් කරලා තිබෙනවාද කියලා. ඒවා බලලා මේ සැරේ ඔබතුමන්ලාගේ යෝජනා බැලුවාම, ඒ කිසි දෙයක් මේ යෝජනා අතරේ නැහැ. කිසි දෙයක් සලකලා නැහැ. ඒ නිසා එහෙම වෙන්න දෙන්න එපා. අපි කොහේ හරි හෝටලයකට ගිහිල්ලා - දැන් ගිය සැරෙත් අපි සාකච්ඡා කළා. මේ සැරෙත් සාකච්ඡා කළා. විවිධ යෝජනා ගෙනාවා. හැබැයි, ඒ යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ පළාත් සභාව ඇතුළේ අපව දැනුවත් කරන්න ඕනෑ. මෙන්න මේ මන්ත්‍රීවරයා, මේ මන්ත්‍රීවරු කරපු යෝජනා අපි ක්‍රියාත්මක කරනවා. මෙන්න මේ දේ කරන්න හදනවාය කියලා අපව දැනුවත් කරලා, ඒවා ඉදිරියට ගෙනියන්න ඕනෑය කියන එක මම විශ්වාස කරනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාව ස්වාධීන වෙන්න තිබෙන ඉඩකඩ වැඩි නොකර, මීට වඩා අපේ නිදහස වැඩි නොකර, මේ වැඩේ කරන්න බැහැ. මම නිරන්තරයෙන් මතු කරන කාරණය තමයි ආර්ථික ප්‍රගතියක් අත් කර ගන්න නම්, ආදායම වැඩි කර ගන්න නම් අපි නව ව්‍යාපෘතිවලට යන්න ඕනෑ. නව සැලසුම්වලට යන්න ඕනෑ. ඒවා අපි අපේ කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් මේ වැඩේ මධ්‍යම ආණ්ඩුවට භාර දීලා හරි, එහෙම නැත්නම් රේඛීය අමාත්‍යාංශයට භාර දීලා හරි අපට බලාගෙන ඉන්න බැහැ. ඒ නිසා මේක අපේ කර ගෙන, අපට තිබෙන සීමාව ඇතුළේ, අපට ලබා දී තිබෙන බල සීමාව ඇතුළේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට තිබෙන බල සීමාව ඇතුළේ ඒක උපරිමයෙන් පාවිච්චි කරලා මම හිතනවා, අපි මේ ඉන්න තැනට වඩා එහාට යන්න ඕනෑතරම් ගත හැකි පියවර තිබෙනවා කියලා. ඒ සඳහා පියවර ගැනීමට එක්වෙන්නය කියලා, සියලු දෙනාට ආරාධනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.13 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2018 ට අදාළව ඉදිරිපත් කරපු විසර්ජන ප්‍රඥප්තියට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, මම මගේ කථාවල දිගටම මතු කරපු කාරණාත් එක්ක මූලික කාරණාවක් මට තිබෙනවා. ඒ තමයි, මේක අපි සම්මත කළාට, මේ financial mandate එකට අත්සන තියන්නේ ආණ්ඩුකාරතුමා. ඉතින් මේකේ අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගරු සභාව මහජන නියෝජිතයෝ විධියට සහභාගී වෙලා, 104 දෙනෙකු ලබා දෙන අනුමැතිය ප්‍රමාණවත් නැතිව, ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යන එක මේ පළාත් සභා ක්‍රමයට තිබෙන මූලික ගැටළුවක්. ප්‍රශ්නයක්. ඒ නිසා අනාගතයේ මේ පළාත් සභාව ස්වාධීන වෙන්න නම් මම විශ්වාස කරනවා, මේ financial mandate එකත් මේ Peoples mandate එකට යටත් විය යුතුයි. ඒ නිසා පළාත් සභාව දෙන අනුමැතියට පස්සේ නැවත වතාවක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට විසර්ජන ප්‍රඥප්තිය යවන එක, මුදල් වියදම් කිරීමේ බලය ලබා ගන්න අවසර ගන්න යවන එක පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වීමට ප්‍රශ්නයක් කියන කාරණාව මුලින්ම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි,මට තිබෙන අනික් කාරණාව තමයි. මම එදා ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ වැය ශීර්ෂය සාකච්ඡා කරන වෙලාවේ, ඒ වැය ශීර්ෂය අවසන් කරලා මේකේ ඡන්දය ප්‍රකාශ කරන වෙලාවේ ඡන්දය පාවිච්චි කිරීමෙන් වැලකී ඉඳලා මම සභාවනේ එළියට ගියා. මට ඇත්තටම එහෙම කරන්න සිද්ධ වුණේ, පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව මගේ තිබුණු හැඟීම, ඒ වාගේම පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දෙන මුදල් වියදම් නොකිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශය සැලසුම් සහගතව වැඩ නොකිරීම කියන කාරණා මත තමයි මම එළියට ගියේ. මම මේ වෙලාවේ කියන්න ඕනෑ. මම එළියට බහින කොට එක්සත් ජාතික පක්ෂයෙන් හූ කිව්වා. ඒ හූව පිළිගන්න මම ලැහැස්ති නැහැයි කියන එක මේ වෙලාවේ කියන්න ඕනෑ. මම කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය හූ කිව්වේ, මේ රටේ අනාගතයට කියලා. එක්සත් ජාතික පක්ෂය හැමදාම කෙරුවේ මේ රටේ අනාගතයට හූ කියන එක. ඒ නිසා ඒ හූව මේ රටේ අනාගතයට කියපු හූවක් විධියට සලකන්න කියන කාරණය මම කියන්නට ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පසුගිය අවුරුදු 21 ම අධ්‍යාපනය හැදුවා නම් මෙහෙම වෙන්නේ නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පසුගිය අවුරුදු 21 නොවෙයි. මුළු ඉතිහාසයේම අධ්‍යාපනය හදන්න එක්සත් ජාතික පක්ෂය මහන්සි වුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා තමයි ඒ ප්‍රශ්නය මතු වෙන්න ඇත්තේ. (බාධා කිරීම්) කරුණාකරලා ගරු මන්ත්‍රීතුමනි, තමන් කථා කරන අවස්ථාවේදී උත්තර දෙන්න. ගරු සභාපතිතුමනි, මේ අයවැය සලකද්දී අපට පේනවා, 2016 සහ 2017 කියන අවුරුදු දෙකේම අපේ අයවැයේ පෙර වර්ෂවල ඉතිරි කිරීම් කියලා, පෙර වර්ෂවල ඉතුරු වුණු සල්ලි අයවැයට අරගෙන තිබෙනවා. 2017 අවුරුද්දේ මිලියන 2500 ක්. ඒ වාගේම 2016 වර්ෂයේ මිලියන 3984 ක්. පෙර වර්ෂවල ඉතිරි කිරීම් විධියට, පළාත් සභා ආදායම් විධියට සලකලා මේ මුදල් අයවැයට දාලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ මුදල් සම්පූර්ණයෙන්ම වියදම් කිරීම සිද්ධ වෙන්නේ ඉදිකිරීම් කර්මාන්තවල. අපි ඉදිරිපත් කරන අයවැයේ සියලු මුදල් අවුරුද්ද පුරා වියදම් කරලා ඉවර කරන්න බැරි වෙනවා නම්, අපි අයවැයේ ලොකු අසාර්ථකභාවයක් ලබනවාය කියන කාරණය පැහැදිලියි. මේ ඉදිකිරීම්වල අසාර්ථක භාවයට බලපාන ප්‍රධාන කාරණාව අපි එදා කිව්වා. මේ අයවැය සම්මත කරද්දී කිසිම ඇස්තමේන්තුවක් අපි අයවැයට ඇතුළත් කරන්නේ නැහැ. ඒක තමයි මූලික වැරැද්ද. අපට පුළුවන් වෙනවා නම් ව්‍යාපෘති පෙළගස්වලා, මේ ව්‍යාපෘතිවලට අනුමැතිය ගන්න. අවුරුද්දේ ජනවාරි

මුල ඉඳලා මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් එහෙම නොවෙන නිසා අපේ අයවැයේ අති විශාල මුදලක් ඉතිරි වීම සිද්ධ වෙනවා. මේ ඉතුරු වීම අපරාධයක් විධියට අපි දකින්නේ.

ගරු සභාපතිතුමනි, පසුගිය අවුරුදු ගණනාවේම පළාත් සභාවේ ආදායම් වැඩි කරන්න අපි සමත් වෙලා තිබෙනවා. පළාත් සභාවේ ආදායම්. 2017 අවුරුද්දේ මිලියන 44,760 ක්. 2016 අවුරුද්දේ මිලියන 41,844 ක්. 2015 දී මිලියන 35,390 ක්. 2013 මිලියන 29,670 ක්. අවුරුද්දෙන් අවුරුද්ද පළාත් සභාවේ, අපේ ආදායම් වැඩි කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ පළාත් සභාව ලබන ආදායමෙන් තමයි අපි අපේ ඉතිරිකිරීම් සිද්ධ කරන්නේ. මේක තමයි බරපතළම අපරාධය.

ඊළඟ කාරණය. හැම අවුරුද්දේම අපි පරිපූරක ඇස්තමේන්තුවලට ගිහිල්ලා තිබෙනවා. ඒක සැලසුම්කරණයේ වැරැද්දක් විධියටයි අපි සලකන්නේ. අයවැය ඇස්තමේන්තු නිවැරදිව සැලසුම් කර ගන්න බැරි වෙන නිසා තමයි, පරිපූරක ඇස්තමේන්තුවලට යන්න වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, 2013 දී මිලියන 2093 ක්. ඒ වාගේම 2017 ට මිලියන 5070 ක්. 2015 දී මිලියන 7761 ක්. 2016 මිලියන 7057 ක් සහ මේ අවුරුද්දෙත් මිලියන 7139 ක පරිපූරක ඇස්තමේන්තු තුනක්, අපි පළාත් සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. පරිපූරක ඇස්තමේන්තු තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, අපට අයවැය හරියට සැලසුම් කර ගන්න බැරි වුණු නිසා. ඒ වාගේම පළාත් සභාවේ ආදායම් වැඩි වුණු කාරණයත් බලපාන්න ඇති. ඒ වාගේම රජයෙන් ලැබෙන ප්‍රධාන වැඩි වීමත් බලපාන්න ඇති. මූලික වශයෙන් අයවැය ඇස්තමේන්තුවල සිදු වුණු වරදක් නිසා තමයි මිලියන 7139 ක පරිපූරක ඇස්තමේන්තු තුනක් අපට ඉදිරිපත් කරන්න වෙන්නේ. ඒකේ අවසන් පරිපූරක ඇස්තමේන්තුව මේ අවුරුද්දට අදාළව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කළේ, මීට මාසයකටත් කලින්. ඒ නිසාම ඒ මුදල් වියදම් කිරීමේ අපහසුකමක් මතු වෙනවා. ප්‍රායෝගික තත්ත්වයන් මත. විශේෂයෙන්ම ඉදිකිරීම් කර්මාන්තවලට මුදල් දැම්මාම ඒ තත්ත්වය මතු වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි මේ වෙලාවේ යෝජනා කරනවා. අයවැය ඇස්තමේන්තු සැලසුම් කිරීම නිවැරදිව කර ගත්තේ නැත්නම් පරිපූරක ඇස්තමේන්තු හරහා අවුරුද්ද අවසාන මාසයේ ඉදිරිපත් කරන පරිපූරක ඇස්තමේන්තුවේ මුදල් අපට වියදම් කර ගන්න බැරි වෙනවා. ඒ නිසා සමස්ත අයවැය අසාර්ථක වන තත්ත්වයකට මතු වෙනවා. ඒ නිසා මේ මූලික කාරණා ටික මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මේකේදී ප්‍රධාන වශයෙන් නැවත වතාවක් මතක් කරන්න ඕනෑ. ප්‍රධාන වශයෙන් මුදල් වියදම් කර ගන්න බැරි ඉතිරි වන මුදල් තිබෙන්නේ, අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ. මේ වෙලාවේ මම නැවත වතාවක් අධ්‍යාපන ඇමතිතුමාට මතක් කරනවා. එතුමාට මහා පින්කමක් තිබෙනවා මේ වෙලාවේ කර ගන්න. ගරු සභාපතිතුමනි, මම කියන්න ඕනෑ. අපේ අධ්‍යාපන ඇමතිතුමා යහපාලනය යටතේ බලයට ආපු අධ්‍යාපන ඇමතිවරයෙක්. යහපාලනයට පින් සිද්ධ වෙන්න බලයට ආපු, අමාත්‍යාංශයට ආපු ඇමතිවරයෙක්. මම එතුමාට යෝජනා කරනවා. ගරු සභාපතිතුමනි, යහපාලනය ගෙන එන්න මූලික වශයෙන් කටයුතු කරපු අපවත්වී වදාළ මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ අපට මේ වෙලාවේ මතක් වෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාත්, වර්තමාන කථානායක කරු ජයසූරිය මැතිතුමාත් මීට අවුරුදු දෙකකට කලින් ගිහිල්ලා මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ ඉපදුනු ගමේ, උන් වහන්සේගේ ගමේ, අපේ පාදුක්කේ ආසනයේ, මායිමේ තිබෙන ගමේ සෝභිත හාමුදුරුවන්ගේ නමින් පාසලක් හදන්න ගොඩනැගිල්ලකට මුල් ගල් තියලා ආවා. මම ඉල්ලා සිටිනවා. මේ අවුරුද්දේවත් උන්වහන්සේට පින් සිද්ධ වෙන්න තමන්ට ඇමතිකම හම්බ වුණේ යහපාලනය නිසා කියලා කල්පනා කරලා, මේ ආණ්ඩුව බලයට පත් වුණේ සෝභිත හාමුදුරුවන්ට පින් සිද්ධ වෙන්න කියලා කල්පනා කරලා අඩුම තරමින් මාදුළුවාව මහා විද්‍යාලයේ සෝභිත හාමුදුරුවන්ගේ නමින් මුල්ගල් තියපු ගොඩනැගිල්ල මේ අයවැයේ මුදල්වලින් හදලා දෙන්නය කියලා මම බොහොම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ආණ්ඩුව පත් වුණේ, සෝභිත හාමුදුරුවන්ට පින් සිද්ධ වෙන්න නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක යහපාලනයෙන් කරලා දෙයි. ඔබතුමා කියන්න ඕනෑ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අවසාන වශයෙන් කියන්න ඕනෑ. පළාත් සභා ක්‍රමය මේ රටේ තවදුරටත් යථාර්ථයක් කරමින්, පළාත් සභා ක්‍රමය ස්ථාපිත වෙන්න නම්, පළාත් සභා ක්‍රමය තවදුරටත් ඉස්සරහාට යන්න නම් ඊට තිබෙන ශක්තිමත් හැකියාවන් තවදුරටත් ඉස්සරහාට තිබෙන්න ඕනෑ. පළාත් සභා ඡන්ද ක්‍රමයේ වෙනස්කමක් ඇති වෙන්නට යනවා. මේක අපි කියන්නට ඕනෑ. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ මැතිවරණ ක්‍රමය සංශෝධනය වෙන්න යන්නේ 60 යි 40 ප්‍රතිශතයෙන්. දැන් පළාත් පාලන ආයතනවල මැතිවරණ ක්‍රමය සංශෝධනය වෙලා තිබෙනවා. 60 යි 40 ප්‍රතිශතයෙන්. නමුත් පළාත් සභාවේ විතරක් 50 ට 50 ක් මැතිවරණ ක්‍රමය සංශෝධනය වෙන්න යනවා. 50% ක් මන්ත්‍රීවරු ඡන්දයෙන් පත් වෙන කොට 50% ක් මන්ත්‍රීවරු නම් කරලා පත් කරන්න යනවා. ඒ අනුව අපි පත් වන කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු 20 දෙනයි ඡන්දයෙන් පත් වෙන්නේ. මේක බරපතළ අසාධාරණයක්. අපේ පළාත් සභාවේ ඉන්න බහුතරයක් මන්ත්‍රීවරුන්ට ඡන්දයෙන් පත් වෙන්න හම්බ වෙන්නේ නැහැ. ඔය යෝජනා කරන ලැයිස්තු, සාධාරණ ලැයිස්තු විධියට අපි පිළිගන්නේ නැහැ. ඒ නිසා ඉදිරි කාලයේදී පළාත් සභා ක්‍රමයේ විකෘතියක් මතු වෙන්න පුළුවන්. මහජන නියෝජිතයෝ මහජනතාව ඡන්දය දීලා තමන්ගේ නියෝජිතයා විධියට පළාත් සභාවට පත් කරලා එවන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 50% කින් අඩු වෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මහජන නියෝජනයේ විකෘතියක් තමයි ඉදිරි කාලයේදී පළාත් සභාවල මතු වෙන්නේ. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ වාගේම එහි 30% ක් කාන්තා නියෝජනය බවට පත් කරලා තිබෙනවා. මේ රටේ කාන්තාවෝ තවමත් දේශපාලනයේ ක්‍රියාකාරීව සක්‍රියව දායක වෙන්නේ නැහැ. අපි එහෙම ක්‍රමයක් පොළොව මට්ටමේ, පල්ලෙහා මට්ටමේ පුරුදු කරලා නැහැ. මේ රටේ බහුතරයක් කාන්තාවෝ නැගෙනහිර පළාත් සභාව නියෝජනය කරන්න එන්නේ නැහැ. මේ 30% තිබුණාම නැගෙනහිර පළාත් සභාව - අපි දන්නවා. මුස්ලිම් සමාජය ඇතුළේ කාන්තාවෝ දේශපාලනයෙන් එළියට එන්නේම නැහැ. නමුත් නැගෙනහිර පළාත් සභාවේත් 30% ක නියෝජනයක් තිබෙන්නට ඕනෑ. ඒ නිසා මහජන නියෝජනයේ විකෘතියක් තමයි ඉදිරි කාලයේ පළාත් සභාවලට දකින්න හම්බ වෙන්නේ. අපේ පළාත් සභාවේත් 50% ක් නම් කරපු අයගෙන් 30% ක් කාන්තාවෝ බවට පත් වුණාට පස්සේ මේ පළාත් සභා ක්‍රමය මහජන හිත සුව පිණිස ක්‍රියාත්මක වන දේශපාලන අධිකාරියක් බවට පත් වෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මල් කට්ටිය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභානායකතුමා කියනවා වාගේම, මල් කට්ටියගෙන් පිරුණු සභාවක්. මහජනතාවගේ ප්‍රශ්න මේ සභාව ඇතුළේ සාකච්ඡා වන එකක් නැහැ. මහජනතාවගේ ප්‍රශ්න විසඳන්න ප්‍රතිපත්තිමය කාරණා මේ සභාව ඇතුළේ මතු වන එකක් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, පළාත් සභා මැතිවරණ ක්‍රමය සංශෝධනය වන කොට, ඒකේ නිවැරැදි ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වීම ආරම්භ කළේ නැත්නම්, එහෙම නිවැරදි ප්‍රජාතන්ත්‍රවාදයක් ආරක්ෂා කිරීම කෙරුවේ නැත්නම්, ඉදිරි කාලයේදී මේ දේශපාලන බල ව්‍යුහය දියාරු වෙන එක, කඩා වැටෙන එක වළක්වන්න පුළුවන්කමක් නැහැ. ඒකේ අවසන් ප්‍රතිඵලය බවට පත් වෙන්නේ මේ දේශපාලන බල ව්‍යුහයකින් ප්‍රයෝජනය ගන්න බලාගෙන ඉන්න මහජනතාවට දැවැන්ත අසාධාරණයක් සිදු වීමයි. ඒ නිසා ඉදිරි කාලයේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් මේ පළාත් සභාව ඇතුළේම මතු විය යුතුයි කියන කාරණය මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, අපි සුභ පතනවා. පසුගිය කාලයේත් මේ අයවැයත් වඩා ක්‍රියාකාරීව ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වුණේ අමාත්‍යාංශවල අපි කලින් කියපු දුර්වලතා තිබුණත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සක්‍රීය දායකත්වය, ක්‍රියාකාරී දායකත්වය හින්දා. ඒ නිසා අපි සුභ පතනවා. මේ එළඹෙන අවුරුද්දෙත් පරිපූරක ඇස්තමේන්තුවලට යන්න කල්පනා කරන්නේ නැතිව, ලැබෙන මුදල් ටික වේලාසනින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම්

හදලා, අවුරුද්දේ ජනවාරි ඉඳලාම අපි අනුමත කරන මේ අයවැයේ මුදල් ක්‍රියාත්මක මට්ටමට ගෙන එන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා කැප වෙයි කියන බලාපොරොත්තුව ඇතිව, එතුමාට සුභ පතමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.24 ]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු මහ ඇමතිතුමා ඉදිරිපත් කරන තුන්වන අයවැය ලේඛනයේ අවසාන මොහොතේදී කථාවක් ලබා දීම පිළිබඳව මම යූ. ජෝර්ජ් පෙරේරා අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත්, ගරු ඔබතුමාටත් මම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම පළාත් සභා ක්‍රමය මේ රටේ ආරම්භ වුණාට පස්සේ, බස්නාහිර පළාත් සභාව දශක තුනක කාල සීමාවක් මේ රටට විශාල කාර්යභාරයක් කරලා, මෙවර ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරන තුන් වන අයවැය ලේඛනය හරහා බස්නාහිර පළාතේ ජීවත් වන අහිංසක ජනතාවට සුවිශාල කාර්ය භාරයක් කරන්න සූදානම් වන මේ මොහොතේදී, මේ උත්තරීතර අවස්ථාවේදී මම හිතන්නේ, රටේ ජනතාව වෙනුවෙන් මේ ගෞරවනීය අවස්ථාවේදී මට අවස්ථාව දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්න මට හැකි වුණේ, 2015 සැප්තැම්බර් මාසේ 22 වැනිදා. එදා දිවුරුම් දීලා පුරා අවුරුදු දෙකයි මාස තුනක් මේ පළාත් සභාවේ රැස්වීම්වලට සම්බන්ධ වෙලා, බස්නාහිර පළාතේ සංවර්ධනයට ඒ අවුරුදු දෙකයි මාස තුන තුළ අයවැය ලේඛන තුනකට මම සම්බන්ධ වුණා. මම හිතන්නේ, සභා රැස්වීම් තියලා තිබෙන්නේ 69 යි. මම ඒ 69 ටම සම්බන්ධ වුණා. ඒ තුළින් ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල කාර්යභාරයක් කරන්න මට ශක්තිය, ධෛර්යය ලැබුණා. බස්නාහිර පළාත් සභාව කියන්නේ, මේ රටේ උත්තරීතර ආයතනයක්. අද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව බලන කොට මේ පාර්ලිමේන්තුවේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, හිටපු ජනාධිපතිතුමිය ඇතුළු ප්‍රධාන දේශපාලන නායකයෝ බිහි වුණේ, මේ පළාත් සභාවෙන්. ඉතින් අපටත් මේ පළාත් සභාව අවුරුදු දෙකයි මාස තුනක් නියෝජනය කරන්න ලැබීම පිළිබඳව මම අතිශයින්ම සතුටු වෙනවා. ඒ අවුරුදු දෙකයි මාස තුන තුළදීම මේ සභා රැස්වීම් හැම එකකටම සම්බන්ධ වෙලා, උදේ වරුවේ ඉඳන් අවසාන මොහොත දක්වාම ජනතාවගේ හඬ මම නියෝජනය කළා.

ඉතින් විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මගේ දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳව පොඩ්ඩක් මතක් කරන කොට 1994 දී තමයි මම දේශපාලන ක්ෂේත්‍රය ආරම්භ කළේ. මම එක්සත් ජාතික පක්ෂය පරාජය වුණාට පස්සේ මේ පක්ෂයේ නායක, එවකට විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මගේ ආසනය වන බියගම ආසනයට ඇවිල්ලා, මගේ ආසනයේ සංවිධායකතුමා. මම අපේ ගමේ ජාතික යොවුන් පෙරමුණ පිහිටුවන කොට එහි සභාපතිවරයා වශයෙන් පත් වුණා. ඊට පස්සේ මම යටිහේන කනිෂ්ට විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබලා, බියගම මධ්‍ය මහා විද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලබලා, කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබාගෙන, මට රැකියාවක් නොමැතිව මම ගෙදර ඉන්න කොට එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණට මම බැඳුනා. මුල් වතාවට රනිල් වික්‍රමසිංහ මැතිතුමා බියගම ආසනයට ඇවිල්ලා 2002 පළාත් පාලන මැතිවරණයට යන මොහොතේදී මමයි, - මෙම පළාත් සභාවේ හිටපු අධ්‍යාපන ඇමති සුරනිමල රාජපක්ෂ මැතිතුමාව මතක් කරන්න ඕනෑ. අපි කතරගම හිටියේ. ඒ කතරගම ඉන්න කොට සුරනිමල රාජපක්ෂ මැතිතුමා මට කිව්වා සම්පත්, උඹ ඡන්දෙ ඉල්ලහන් කියලා. ඉතින් මම මුල්ම පළාත් පාලන මැතිවරණයට 2002 දී තරඟ කරලා මට සමස්ත බියගම ආසනයේ ජනතාව මුල්ම වතාවට ප්‍රාදේශීය සභාවේ වැඩිපුරම මනාප ලබා දීලා, මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් හිටපු ගුණසිරි ජයනාත් මැතිතුමාව පරාජයට පත් කරලා, මට බියගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් පත් වෙන්න අවස්ථාව ලැබුණා. මම ඒ අවස්ථාව ඉතාමත්ම උත්තරීතරව මතක් කරනවා. දෙවැනි වතාවේ 2006 පළාත් පාලන මැතිවරණයේදී ලංකාවේම ප්‍රාදේශීය සභා එක්සත් ජාතික පක්ෂයට ආවේ පහයි හෝ හයයි. ඒ හය තුළ නැවතත් බියගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් පත් වෙලා පුරා අවුරුදු නවයක් බියගම ප්‍රාදේශීය සභාව මෙහෙයවන්න මට ශක්තිය ලැබුණා. 2011 දී පළාත් පාලන මැතිවරණයට මුහුණ දුන්නා. එක්සත් ජාතික පක්ෂය ඡන්ද 2000 කින් පරාදයි. නමුත් ඒ මැතිවරණයේදී මගේ ආදරණීය බියගම ජනතාව එක්සත් ජාතික පක්ෂයට

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

ලංකාවෙන්ම වැඩිම මනාප ලබා දුන්නේ මට. අපේක්ෂකයෙකු වශයෙන් වැඩිම මනාප මට ලබා දීලා මම 2011 සිට 2015 දක්වා බියගම ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා වශයෙන් සිටියා. ඊට පස්සේ පළාත් සභා මැතිවරණය 2014 දී එන කොට මට තරඟ කරන්නය කියලා පක්ෂයෙන් ඉල්ලීමක් කළා. මම ඒ පක්ෂයේ ඉල්ලීම තුළ තරඟ කළා. මම ගම්පහ දිස්ත්‍රික්කයේ 12 වන තැනට ආවා. මුල් 10 දෙනා අතරට මට එන්න හම්බ වුණේ නැහැ. ඒ කාලේ අපි දරුණු පරාජයක් වුණා. 12 වැනියාට ඇවිල්ලා පසුගිය 2015 සැප්තැම්බර් 22 වැනිදා සිට මේ දක්වා මම පළාත් සභාව නියෝජනය කළා. ඒ පළාත් සභාව නියෝජනය කරන කාල සීමාවේදී මට මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු ඇමතිවරුන් පස් දෙනාම මම හිතනවා, ඉතාමත්ම කිට්ටුවෙන් සම්බන්ධතා පවත්වලා, මට දෙන්න පුළුවන් උපරිම සහයෝගය, ශක්තිය ලබා දුන්නා. මේ අවස්ථාවේදී මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා, විශේෂයෙන්ම ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා. එතුමාගේ උපදේශක කාරක සභාවේ තමයි මම ඉන්නේ. මතක් කරන්න ඕනෑ. එතුමා හැම තිස්සේම අපට විශාල කාර්ය භාරයක් කළා. අපි කරන හැම යෝජනාවකටම එතුමා විශාල ශක්තියක් දුන්නා. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යවරයා. මම හිතන්නේ, අධ්‍යාපන ඇමතිතුමා ඉතාමත්ම ළඟින් ඇසුරු කරපු පුද්ගලයෙකු වශයෙන් ඔබතුමාගේ මම හිතන්නේ, ඒ දේශපාලන ගමන කටුකයි. කම්කටොළුයි. මම මේ පළාත් සභාවේ හිටපු අධ්‍යාපන ඇමති සුරනිමල රාජපක්ෂ මැතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී වශයෙන් කලක් කටයුතු කළා. අධ්‍යාපන ඇමතිවරු විශේෂයෙන්ම ඊළඟ මැතිවරණයේදී පරාදයි. ඒක තමයි මේ රටේ ඇත්ත කථාව. සුළු දෙනයි ඉතිරි වෙලා හිටියේ. ඒ කියන්නේ, පාසල්වල ළමයින් දාන්නේ නැත්නම් මිනිස්සුන්ගේ කලකිරීමක් තිබෙනවා. ලියුම් දෙන්නේ නැත්නම් කලකිරීමක් තිබෙනවා. ඒ නිසා ඒක ඔබතුමාට පමණක් නොවෙයි. රටේම තිබෙනවා. ඒ නිසා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගවලට මම ස්තුති කරනවා. මම මගේ සහයෝගය ලබා දුන්නා.

ඒ එක්කම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අතිශයින්ම ස්තුති කරනවා. මම ඒ අයවැය ලේඛන තුනේදීම සෑම දෙයකටම අත උස්සලා මම සහයෝගය ලබා දුන්නා. නමුත් අවසාන අවස්ථාවේදී මට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයටත් කථා කළා. නමුත් මට විනාඩි දෙකක තුනක අතපසුවීමක් වෙලා මට එතුමාට ඡන්දය දෙන්න එන්න හම්බ වුණේ නැහැ. මම ඒකට කනගාටු වෙනවා. මගේ හෘදය සාක්ෂියට එකඟව ඒ අවුරුදු කිහිපය තුළදීම මේ පළාත් සභාවට විශාල කාර්ය භාරයක් කළා. ඒ නිසා මම අද මේ කරන කථාවේදී - මේ මගේ අවසාන කථාව. මේ පළාත් සභාව තුළ, පළාත් සභා ක්‍රමය තුළ අවුරුදු දෙකයි මාස තුනක් මට අත්දැකීම් සමුදායක් ගත්තා. පළාත් සභා නීති රීති, පළාත් සභා සම්ප්‍රදාය, පළාත් සභාවේ තිබෙන ගැටළු, පළාත් සභාවේ උපදේශක කාරක සභා ක්‍රමය පිළිබඳව මගේ දේශපාලන ජීවිතයට විශාල පන්නරයක් ලබා ගත්තා. විශාල ශක්තියක් ලබා ගත්තා. ඒ තුළින් මගේ ඉදිරි දේශපාලන ක්ෂේත්‍රය මම හිතනවා - අපේ පක්ෂයෙන් මගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. එළඹෙන පළාත් පාලන මැතිවරණයේදී මට නැවත වතාවක් බියගම ප්‍රාදේශීය සභාවට තරඟ කරන්නය කියලා. ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්න බැහැ. මගේ පක්ෂයේ නායක අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා, මගේ ආසනයේ සංවිධායක ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමා ඇතුළු සියලු දෙනාගේම ඉල්ලීම මත මෙවර බියගම ප්‍රාදේශීය සභාවට මම තරඟ කරනවා. සාම්ප්‍රදායිකව එහෙම තරඟ කරන කොට මේකෙන් ඉල්ලා අස් වෙන්න ඕනෑ. ඒ නිසා ඒ පුරා අවුරුදු දෙකයි මාස තුන තුළ මම පළාත් සභාව තුළ කරපු ජනතා මෙහෙවර වෙනුවෙන් මම අතිශයින්ම සතුටු වෙනවා. මේ පළාත් සභාව මෙහෙය වීමේදීත් මට විශාල කාර්යභාරයක් කරපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන සියලුම ඇමතිවරු.

ඒ එක්කම විශේෂයෙන් ප්‍රධාන ලේකම්තුමා, ඒ එක්කම සභා ලේකම්තුමා අපට විශාල ශක්තියක් ලබා දුන්නා. විශේෂයෙන්ම සභා ලේකම්තුමා අපේ බියගම මැතිවරණ කොට්ඨාශයේ පදිංචි පුද්ගලයෙක්. එතුමා අපට විශාල ශක්තියක් වුණා, මේ වැඩ පිළිවෙළ මෙහෙයවන්න. ඒ නිසා මේ ගෞරවනීය අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාව කියන්නේ, මේ රටේ උත්තරීතරම පළාත් සභාවක්. මේ පළාත් සභාව තුළ මගේ ක්‍රියාදාමය, මගේ ශක්තිය මෙහෙයවලා මගේ ආසනයේ ජනතාවට මට විශාල කාර්යභාරයක් කරන්න හැකියාව ලැබුණා. ඒ ලැබුණේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන සියලුම මැති ඇමතිවරුන්ගේ සහයෝගයෙන්.

ඒ නිසා විශේෂයෙන්ම මේ ගෞරවනීය අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ. මගේ ආදරණීය දෙමව්පියෝ, මගේ ආදරණීය බිරිඳ, මගේ ආදරණීය දරුවන් ඒ සියලු දෙනාම දේශපාලන ක්ෂේත්‍රයට එන්නට මට විශාල ශක්තියක් සහ සහයෝගයක් වුණා. ඒ නිසා මේ අවස්ථාවේදී අපට හැමදාම දේශපාලන ක්ෂේත්‍රයේ තනතුරුවලට එන්න බැහැ. අපි දිනනවා. පරාද වෙනවා. අපි විවිධ දේවල් කරලා මේ දේශපාලන ක්ෂේත්‍රයේ ඉස්සරහාට ආවා. විශාල කම්කටොළු මැද මේ වාගේ ආයතනයකට ඇවිල්ලා ඒ තුළ විශාල කාර්යභාරයක් කරන්නට හැකි වීම පිළිබඳව මම තනියෙන් කල්පනා කරනවා නම්, මට විශාල ශක්තියක්. ඒ නිසා අපි මෙතැනින් ඉල්ලා අස් වුණාය කියලා, මේ පළාත් සභාවට අපි අදින් පස්සේ ආවේ නැහැයි කියලා අපට ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා, අපේ අධ්‍යාපන ඇමතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමා, මහා මාර්ග ඇමතිතුමා ඒ සියලු දෙනාවම අපි මගදී දැක්කොත්, අපේ සහෝදර මන්ත්‍රීවරු අපි හිනා වෙලා කථා කරලා අපට සහයෝගය ලබා දෙන්න. ඒ නිසා ඒ පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා - මම එක්සත් ජාතික පක්ෂය පරාජයේ ඉඳලාම පක්ෂය හැර දාන්නේ නැතිව, ඒ පක්ෂය නියෝජනය කරමින් කටයුතු කළා. ඒ නියෝජනය කරන කොට මම හිතන්නේ, එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, අපි පක්ෂය තීන්දුවක් අරගෙන තිබෙනවා, මේ පළාත් පාලන මැතිවරණයේදී බියගම ප්‍රාදේශීය සභාව, එක්සත් ජාතික පක්ෂයට ජයග්‍රහණය කරන්න පුළුවන්. ඒ ජයග්‍රහණ කිරීමේදී මට ඒ කණ්ඩායමට නායකත්වය දෙන්නය කියලා කිව්වා. ඉතින් ඒ කණ්ඩායමට නායකත්වය ලබා දීලා අග්‍රාමාත්‍යතුමාට, එක්සත් ජාතික පක්ෂයට ශක්තියක් වෙන්න මගේ ආසන සංවිධායක ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමාට ශක්තියක් වෙන්න, මේ පළාත් පාලන මැතිවරණයට මම තරඟ කරනවා.

මගේ සහෝදර සියලුම මන්ත්‍රීවරු පසුගිය කාල සීමාව තුළදී මම හිතන්නේ, මට විශාල ශක්තියක් වුණා. විශේෂයෙන්ම අපේ විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා. එතුමා මට උපදෙස් දුන්නා. ඒ එක්කම අපේ මහ ඇමතිතුමා මට උපදෙස් දුන්නා මම මේ තරඟ කරන මැතිවරණය පිළිබඳව. ඒ එක්කම අපේ තව ඇමතිවරු මට උපදෙස් දුන්නා. මට අනුශාසනා කළා. මට උපදෙස් දුන්නා මේ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවාය කියලා. ඒ එක්කම ජෝර්ජ් පෙරේරා මැතිතුමා. ඒ එක්කම ජනතා විමුක්ති පෙරමුණේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාව මම මතක් කරන්න ඕනෑ. සමහර අවස්ථාවලදී මම කථා කරන කොට මට උපදෙස් දුන්නා. ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව මගේ තිබුණු ආකල්පය එතුමා වෙනස් කළා. එතුමා ළඟ ඉඳගෙන සමහර අවස්ථාවලදී මට උපදෙස් දුන්නා මෙහෙම කථා කරන්න කියලා. ඒ නිසා එතුමාවත් මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරනවා.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය මේ අවස්ථාවේදී පළාත් පාලන මැතිවරණයට තරඟ කරන මේ මොහොතේදී හෙට මම අපේ පක්ෂය වෙනුවෙන් බියගම නාම යෝජනා පත්‍ර භාර දෙනවා. ඊට කලින්, අද ගරු සභාපතිතුමාට, මම මගේ ඉල්ලා අස්වීමේ ලිපිය භාර දීලා, මම මේ පළාත් සභාවෙන් ඉවත් වුණත් පළාත් සභාවේ හිටපු අවුරුදු දෙකහාමාර තුළ මට ලබා දුන්න ශක්තිය, ධෛර්යය මගේ ජීවිතයට විශාල පන්නරයක් වුණා. ගරු සභාපතිතුමනි, ඒ නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෙකු වශයෙන් ඔබතුමා කරපු මෙහෙය අපි දන්නවා. ඔබතුමා දේශපාලන භේදයකින් තොරව ගම්පහ දිස්ත්‍රික්කයට විශාල කාර්යභාරයක් කරන දේශපාලන නායකයෙක්. ඔබතුමාත් මට ලබා දුන්න ශක්තිය, සහයෝගය මම ඉතාමත්ම ගෞරවයෙන් මතක් කරනවා. ඒ වාගේම මේ සභාවේ ඉන්න සියලුම සේවකයෝ, විශේෂයෙන්ම අපේ සභා ලේකම්තුමා ප්‍රධාන, ඒ එක්කම අපේ සම්බන්ධීකරණ නිලධාරී මහත්මයා, ප්‍රවෘත්ති නිලධාරී මහත්මයා, නිලධාරීවරු, මෙතැන ඉන්න සුළු සේවකයාගේ ඉඳලා ඒ සියලුම කාර්ය මණ්ඩලය, මාධ්‍ය කාර්ය මණ්ඩලය අපට විශාල ශක්තියක් දුන්නා. ඒ එක්කම අපට තේ එක ලබා දෙන කැන්ටිමේ සේවකයා පවා අපට විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ සියලුම දෙනා මේ ගෞරවනීය අවස්ථාවේදී මතක් කරනවා.

අවසාන වශයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයේ සියලුම අමාත්‍යවරු ඇතුළු ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ, අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් එක ඉල්ලීමක් මට කරන්න තිබෙනවා. අපි දේශපාලන පක්ෂවලට බෙදිලා අපි තරඟ කරලා, මේ සභාවට එනවා. අපි දැක්කා, පසුගිය කාලයේ

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

ඒ සභාවලට එන කොට මේ සභාව තුළ අපි ගොඩක් දරන්නේ, දේශපාලන පක්ෂවල මතවාදය විතරයි. එක්සත් ජාතික පක්ෂය. ඒකාබද්ධ විපක්ෂය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. ජනතා විමුක්ති පෙරමුණ. නමුත් ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් ගොඩක් අඩුවෙන් හඬ නගන්නේ. ගොඩක් දකින්නේ තමන් දරන දේශපාලන පක්ෂයේ අදහස. ඒ නිසා අපි බස්නාහිර පළාත් සභාව තුළ - මගේ පෞද්ගලික අදහස. ඒ කරපු කාර්යභාරය අති විශිෂ්ටයි. ඊළඟ පළාත් සභාව වෙන කොට මේකේ සංයුතිය සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා. මම හිතන්නේ, මේකට එනවා 25% ක් 30% ක් කාන්තාවෝ. අද ඉන්නේ කාන්තාවෝ හතර පස් දෙනයි.

ඒ නිසා මේ පළාත් සභා ක්‍රමය ඊළඟ මැතිවරණයේදී සම්පූර්ණයෙන් විප්ලවයක් වෙනවා. මම හිතන්නේ, අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මහජන ඡන්දයෙන් ඉතා සුළු ප්‍රමාණයයි එන්නේ. ඒ නිසා විවිධාකාර ගැටළු එයි. මගෙත් පෞද්ගලික අදහස මේ මැතිවරණ ක්‍රමය නම් අපි අනුමත කරන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා ඒ කෙසේ වෙතත් පාර්ලිමේන්තුවේ අනුමත කරලා තිබෙනවා. ඒ අදාළ ආයතනවලින් අනුමත කරලා තිබෙනවා. අපි එකතු වෙලා මේ පළාත් සභාව තුළ විශාල කාර්යභාරයක් කරන්නට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන සියලුම දෙනාටම ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා. එක්සත් ජාතික පක්ෂයේ අපේ ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ප්‍රධාන සියලුම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේ ඉන්න අමාත්‍යවරු පස් දෙනා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ටත්, ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ටත්, ජනතා විමුක්ති පෙරමුණේ සියලුම මන්ත්‍රීවරුන්ටත්, අනික් සියලුම මන්ත්‍රීවරුන්ටත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් බියගම ප්‍රාදේශීය සභාව එළඹෙන පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ජයග්‍රහණය ගෙන එන්නට, මම මේ පළාත් සභාවේ මගේ කරන අවසාන කථාවට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පළ කරනවා.

අවසාන වශයෙන් මගේ දේශපාලන ක්ෂේත්‍රයට ශක්තියක් වුණු මගේ දෙමව්පියෝ, මගේ සහෝදරයෝ, මගේ ඥාති පරපුර, මගේ බිරිඳ, මගේ දරුවන් දෙදෙනා, ඒ එක්කම මට මේ දේශපාලන ක්ෂේත්‍රයට අවතීර්ණ වන්නට ශක්තිය ලබා දුන්න මේ පළාත් සභාවේ හිටපු පළාත් සභා මන්ත්‍රී සීමන් බාලසිංහ මැතිතුමා. මේ පළාත් සභාවේ හිටපු අමාත්‍යවරයෙකු වන අභාවප්‍රාප්ත සුරනිමල රාජපක්ෂ මැතිතුමා. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමා. අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඒ සියලු දෙනාටම මම මගේ ගෞරවය පළ කරනවා. පුරා අවුරුදු දෙකයි මාස තුනක් මේ උත්තරීතර සභාවේ බියගම ජනතාව වෙනුවෙන්, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් හඬ නගන්නට මට අවස්ථාව ලබා දුන්නු මගේ ආදරණීය සියලුම ඡන්ද දායකයින්ට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. තමුන්නාන්සේලා සියලු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරනවා. තෙරුවන් සරණයි. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා අද දවසේ අපේ පළාත් සභාවෙන් ඉවත් වෙනවා. ඇත්ත වශයෙන්ම මම දකින්නේ, එතුමාගේ ඉවත් වීම අපට බරපතළ පාඩුවක්. මොකද, මම දකිනවා. මගේ දර්ශන පථයට හැමදාම ලක් වන මන්ත්‍රීවරයෙක් තමයි එතුමා. හැමදාම එතුමා උදේ නවයහමාර වෙන කොට ආසනයට ඇවිල්ලා අවසානය දක්වාම සභා ගර්භයේ ඉන්න මන්ත්‍රීවරයෙක්. එහෙට මෙහෙට දුවන පනින බාධා කරන, අපේ අනික් ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා වාගේ බාධා කරන එක්කෙනෙක් නොවෙයි. එතුමා බොහොම වැදගත් මන්ත්‍රීවරයෙක්. ඇත්ත වශයෙන්ම අපි අගය කරන්නට ඕනෑ. ඒ වාගේම එතුමා හැම විවාදයකටම සම්බන්ධ වුණා. මම දැක්කා, මේ අයවැය විවාදයේදී එතුමා අමාත්‍යාංශ පහටම සම්බන්ධ වුණා. එතුමා හොඳ අදහස් ප්‍රකාශ කළා. ඒ වාගේ මන්ත්‍රීවරු අපේ පළාත් සභාවෙන් ඉවත් වීම මම හිතන්නේ, බරපතළ පාඩුවක්. සභාව අරගෙන යන කොට ගණපූරණය වාගේ ප්‍රශ්න මතු වෙනවා. නමුත් එතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙකු ඉන්නවා. ගම්පහ දිස්ත්‍රික්කයේම දෙදෙනෙකු අපෙන් ඉවත් වුණා. මීගමුව ආසනය නියෝජනය කරන අපේ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කරලා කිව්වා, එතුමා ඉවත්

වෙනවාය කියලා. මට ලිපි ලබා දෙයි. මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාත් මෙම පළාත් සභාවෙන් ඉවත් වෙනවා. ඒ දෙදෙනාම ගම්පහ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයෙන් පත් වුණත්, ඉතාම ළෙංගතු මන්ත්‍රීවරු දෙන්නෙක්. සහෝදරත්වයෙන් හැමදාම කථා බහ කරනවා. ඒ නිසා මම අවංකවම එතුමාට සුභ පතනවා. එතුමාගේ ඉදිරි දේශපාලන ගමන ඉතාමත්ම සර්වප්‍රකාරයෙන් සාර්ථක වෙලා, එතුමාට මේ බියගම ප්‍රාදේශීය සභාව නොවෙයි. ඊටත් එහාට යන්න, එතුමාට පාර්ලිමේන්තුවට යන්න සුදුසුකම් තිබෙනවා. උගත් මන්ත්‍රීවරයෙක්. උපාධිධාරී මන්ත්‍රීවරයෙක්. අපි දකිනවා, එතුමාට ඒ ශක්තිය තිබෙනවා. අවසාන වශයෙන් ඔබතුමාටත්, අපේ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාටත් සුභ පතනවා. එතුමන්ලා දෙපළගේම දේශපාලන ජීවිතය ඉතාමත්ම වාසනාවන්ත වෙලා ප්‍රාදේශීය සභාව නොවෙයි. මහ නගර සභාව නොවෙයි. පළාත් සභාව නොවෙයි. ඊටත් ඉහළට යන්න, අපේ උත්තරීතර පාර්ලිමේන්තුවට යන්න ඔබතුමන්ලාට වරම් ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම මේ අවස්ථාවේදී ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair*

**ගරු රන්දීර් රොඩ්රිගෝ**
Hon. Randeer Rodrigo

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඔබතුමාට යොමු කරන්න තිබෙනවා. 2017 ඔක්තෝබර් 23 වැනිදා දිවුලපිටිය බල්ලපාන ප්‍රදේශයේදී එක්තරා අවාසනාවන්ත සිද්ධියක් ඇති වුණා. ඒ සිද්ධිය මාධ්‍ය මගින් වාර්තා වුණේ, ඉතාමත් විකෘති ආකාරයකින්. සත්‍ය සිදුවීම හා පසුබිම් කාරණා, රට හමුවේ තැබූ කාරණාවලට වඩා හාත්පසින්ම වෙනස් වුණා. ප්‍රතිඵලය වූයේ, මා පොලිස් විශේෂ කාර්ය බලකායේ අත්අඩංගුවට පත් වීමයි. අත්අඩංගුවට ගැනීමෙන් පසුව සංවිධානාත්මක අපරාධ කොට්ඨාශය ක්‍රියා කළ ආකාරය ප්‍රශ්නකාරී එකක් වුණා. මාගේ මූලික අයිතිවාසිකම් මෙන්ම මන්ත්‍රීවරයෙකු ලෙස මාගේ වරප්‍රසාද කඩ වන ආකාරයෙනුයි පොලීසියේ නිලධාරීන් හා මාධ්‍ය ක්‍රියා කළේ. මේ සිද්ධියේ සැබෑ තොරතුරු සහිත මාගේ ප්‍රකාශය සභාගත කිරීමට[1] ඔබතුමාගේ අවසරය මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ප්‍රකාශය සභාගත කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රකාශය කරන්න පුළුවන් නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඕනෑ නම් ප්‍රකාශය කියවන්නත් පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම හිතන්නේ උසාවි - ඔබතුමා සභාගත කරන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ප්‍රකාශ කළාම ඒක හොඳයි නේ? මාධ්‍යයට ඔක්කෝටම දැන ගන්න පුළුවන් නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේක අධිකරණයට ගිහිල්ලා තිබෙන කටයුත්තක් නිසා. ඒකයි කිව්වේ සභාගත කරන්න කියලා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අසාධාරණයක් නේ? ඒ මාධ්‍යයෙන් දුන්න එක නොවෙයි නේ වෙලා තිබෙන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පුළුවන් තරම් ඉක්මණින් කියන්න.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු රන්දීර් රොඩ්රිගෝ**
Hon. Randeer Rodrigo

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිද්ධිය වුණේ පසුගිය ඔක්තෝබර් 23 වැනිදා බල්ලපාන ප්‍රදේශයේදී. මම මාගේ පෞද්ගලික කටයුත්තක් සඳහා එම ප්‍රදේශයට ගිය අවස්ථාවේදී මාත් සමඟ වෑන් රථයක මාගේ හිතවතුන් පස් දෙනෙකු ඒ අවස්ථාවේදී හිටියා. අපි බල්ලපාන ප්‍රදේශයේ ඉඳලා දිවුලපිටිය ප්‍රදේශයට පැමිණෙන අවස්ථාවේදී ඒ ගමන් ගත් මාර්ගයේ, අපි ගමන් ගත් වාහනයට ඉදිරියෙන් තවත් ත්‍රීරෝද රථයකුත් ඊට ඉදිරියෙන් කොළ පාට වෑන් එකකුත්, ඊටත් ඉදිරියෙන් කළුපාට ජීප් රථයකුත් ගමන් කළා. සාමාන්‍ය ආකාරයට අපිත් පාරේ යන ආකාරයටම මේ වාහන පිටුපස අපි ගමන් කරමින් සිටියදී, ක්ෂණයකින් ඉදිරියේ තිබුණු කළු පාට ජීප් රථය නැවැත්වුවා. ඒත් එක්කම ඊට පිටිපස්සේ තිබුණු කොළ පාට වෑන් රථයත් නවත්වනවාත් එක්කම අපට ඉදිරියෙන් තිබුණු ත්‍රීරෝද රථය මේ වෑන් එකටයි, ජීප් රථයටයි ඉස්සර කරලා නවත්වන අතරතුරේ, අපි ගමන් ගත් වාහනයට ඉස්සර කිරීමට අපට ඉඩ නොතිබුණු නිසා අපිත් ඒ වාහනය පිටිපස්සෙන් නැවැත්වුවා. ඒ ක්ෂණයකින්ම පාරේ දකුණු පස රතු පැහැති කමිසයක් ඇඳගෙන සිටි පුද්ගලයෙක් අප ඉදිරියේ තිබූ ඒ කොළ පාට වෑන් රථය ළඟට ඇවිදගෙන පැමිණියා. ඒ පැමිණෙන අවස්ථාවේදීම කොළ පාට වෑන් රථයේ දොරවල් ඇරගෙන විශේෂ කාර්ය බලකායේ, STF ඒකකයේ නිලධාරීන් පිරිසක් එළියට පැනලා මේ පුද්ගලයා අල්ලා ගැනීමට තැත් කළා. ඒ අවස්ථාවේදී ඒ පුද්ගලයා දුවන්න උත්සාහ කරලා, ටිකක් දුර දුවන කොට මේ විශේෂ කාර්ය බලකායේ පුද්ගලයෝ ඒ පුද්ගලයාට පිටිපසින් වෙඩි තිබ්බා. ඒ පුද්ගලයා වෙඩි කා ගෙන දිව්වා. මීටර් 10 ක් විතර ගිහිල්ලා ඒ පුද්ගලයා වැටුණාම විශේෂ කාර්ය බලකායේ සොල්දාදුවෝ ළඟට ගිහිල්ලා ඔලුවට වෙඩි තියනවා, අපි සියැසින් දුටුවා.

මේ අවස්ථාවේදී අපි ගමන් ගත් වාහනයේ අපි පස් දෙනාම මේ වෑන් රථයේ හිටියේ. මේ සිද්ධිය අපි හැම කෙනෙකුම සියැසින් දුටුවා. නමුත් අපි වාහනයෙන් බැස්සේවත්, මුකුත් කළේවත් නැහැ. අපි වාහනය ඇතුළටම වෙලා හිටියේ. ඒක වෙනවාත් එක්කම අපි පිටුපසින් ආපු තවත් කොළ පාට STF වෑන් රථයක් ඇවිල්ලා අපේ වෑන් රථයට හරස් කරලා අපෙන් ප්‍රශ්න කළා. අපට තුවක්කුව එල්ල කරලා, අපව බිම නිදි කරලා අපෙන් ප්‍රශ්න කළා. පාතාලයේ නිලන්ත නමැති පුද්ගලයා උඹලත් එක්ක ඉන්නවා. ඌ කෝ කියලා ඇහුවා. අපි අපේ හැඳුනුම්පත් දුන්නා. අපි ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළා අපි මේ වෙනත් ගමනක් ගිහිල්ලා එන අවස්ථාවක්. අපේ ඉස්සරහා සිදුවීමක් වුණා. මේ සිදුවීම නිසා අපට පාරේ අවහිරතාවයක් ඇති වුණු නිසා අපට යන්න බැරි වුණාය කියලා අපි ප්‍රකාශ කළා. දිගින් දිගටමත්. නමුත් ඒ කිසිම ප්‍රකාශයක් ඔවුන් ගණන් ගත්තේවත් නැහැ. පසුව අපිව දිවුලපිටිය පොලිස් ස්ථානයට එක්කගෙන ගිහිල්ලා දිවුලපිටිය පොලිස් ස්ථානයේ සංවිධානාත්මක අපරාධ ඒකකයට අපිව භාර දීලා, අපි ළඟ ව්‍යාජ පිස්තෝලයකුයි, ජීව අත් බෝම්බයකුයි අපේ වාහනයේ තිබෙනවාය කියලා අපේ නමට B Report එකක් හදලා, අපිව පහුවදා ප්ලාස්ටික් පිස්තෝලයක් සමඟ, ව්‍යාජ පිස්තෝලයක් සමඟ බෝම්බයක් තිබෙනවාය කියලා අපිව පසුවදා අධිකරණයට ඉදිරිපත් කළා. අධිකරණයෙන් අපව බන්ධනාගාරගත කළා. අපි හය දෙනාවයි, අපේ වාහනයයි. පළමු වන B Report එකේ මේක ව්‍යාජ පිස්තෝලයක් සහ ජීව අත්බෝම්බයක් බවට ප්‍රකාශ කළා. දෙවැනි කැඳවීම අවස්ථාවේදී ඇත්ත පිස්තෝලයක් සහ අත් බෝම්බයක් කියලා ප්‍රකාශයක් කළා. තුන් වන උසාවි දිනයේදී පිස්තෝල දෙකක් සහ අත්බෝම්බයක් කියලා B Report එක වාර්තා කළා. ඔබතුමන්ලා දකිනවා. මේ තත්ත්වය නිසා මම දැනටත් බන්ධනාගාරගත වෙලා සිටින්නේ. මේක තමයි ඇත්ත තත්ත්වය. මේක තමයි මේ ස්ථානයේ සිදු වුණු ඇත්ත සිදු වීම. නමුත් මාධ්‍යවලින්, පුවත්පත්වලින් ඉතාමත් වැරදි ලෙස නොයෙකුත් වාර්තා මේකට ප්‍රකාශ කරලා තිබෙනවා. ඒක නිවැරදි කිරීම සඳහා ඔබතුමාගේ අවධානය මට මේ අවස්ථාවේදී යොමු කරලා දෙන්න. පත්තරවල දාලා තිබෙන්නේ, *"දිවුලපිටියේ STF පාතාල සටන. පාතාල කල්ලි තුනක් සමඟ රන්දීර් සබඳතා හෙළිවේ."* ඒත් එක්කම ගරු අගමැතිතුමා මේ පිළිබඳව වාර්තාවක් ඉල්ලලා තිබෙනවා. ගරු අගමැතිතුමාගේ වාර්තාවට මම මගේ පෙරකදෝරු -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා පත්තරේ නම කියන්න.

**ගරු රන්දීර් රොඩ්රිගෝ**
Hon. Randeer Rodrigo

මව්බිම. අනික් එක රිවිර පත්තරේ. ඒත් එක්කම අන්තර්ජාලයේ නොයෙකුත් මඩ, නොයෙකුත්

පාර්ලිමේන්තුව නියෝජනය කරන ඇමතිවරුන්, ඇමතිවරියන්ගේ පින්තූර දාලා, මගේ පින්තූර දාලා නොයෙකුත් මඩ ගහලා නොයෙකුත් දේවල්. අපි නිධන් හොරකම් කරන්න ගියා. නිධන් හොරකම් කර ගෙන ආපු කල්ලියක්, අපි ගිහිල්ලා ඒක හොරකම් කරන්න ගියාය කියලා නොයෙකුත් දේවල් ප්‍රකාශ කරමින්, මගේ කීර්ති නාමයට බලපෑමක් ඇති කරලා තිබෙනවා. මේක නිරාකරණය කරලා දෙන්නය කියලා ඔබතුමාගෙන් මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.50 ]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ස්තූතිවන්ත වෙනවා, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත්, ඔබතුමාටත් විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. අපේ පළාත් සභාවේ ආදායම හැටියට බිලියන 71 ක අයවැයක් තමයි ඉදිරිපත් කළේ. මේක තුළ පුනරාවර්ථන වියදම් බිලියන 59 ක් තිබෙන අතර, ප්‍රාග්ධන වියදම බිලියන 11 ක් පමණ වෙනවා. අපි අයවැය අවස්ථාවේදීත් සඳහන් කරපු ආකාරයට ප්‍රාග්ධන තත්ත්වයන් වඩා ශක්තිමත් කර ගෙන, පළාත් සභාව ශක්තිමත් කරමින්, ඒ තුළින් ජනතාවට වඩාත් සේවයක් කරන්න මේ සභාවේ වැඩ පිළිවෙළක් ඇති කර ගත යුතුයි කියන අදහස තමයි අපි නැවතත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න විශේෂයෙන්ම බලාපොරොත්තු වෙන්නේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා සඳහන් කළා, එතුමා පළාත් සභාව තුළ තිබෙන ස්ථාවර තැන්පතු මුදල් අධ්‍යාපන කටයුතුවලට ලබා දෙන්න සූදානම් වෙනවාය කියලා. අපි ඒක අගය කරනවා. ඒ වාගේම අපි එතුමාට යෝජනා කරනවා. නැවත වතාවක් පළාත් සභාවේ ආදායම් මාර්ග වැඩි කර ගැනීම සඳහා, පෞද්ගලික ආයෝජනයන් සඳහා වැඩ පිළිවෙළකට මේ පළාත් සභාව ඇතුළත් වෙන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේ නැවත ඉදිරිපත් කරනවා. මොකද, රජයේ වැඩ පිළිවෙළ වෙන්නෙත්, සම්මුතිවාදී ආණ්ඩුවේ යහපාලන වැඩ පිළිවෙළ තුළ ඉදිරිපත් වෙලා තිබෙන්නේත්, එවැනි පොදු පෞද්ගලික ආයෝජනයන් තුළින් රට ගොඩ නගා ගැනීමේ වැඩ පිළිවෙළකටයි. ඒ සඳහා අපේ පළාත් සභාවත් ඒ හා සමගාමීව කටයුතු කරන්න ඉදිරිපත් වෙන්නය කියන ඉල්ලීම විශේෂයෙන්ම කරනවා.

ඒ වාගේම අපේ ආදායම වැඩි කර ගැනීම සඳහා අපේ බදු ආදායම් විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වෙනවා. දැනට වක්‍ර බදු වැඩි ප්‍රමාණයක් අය කිරීම තමයි සිද්ධ වෙන්නේ. හැම බඩුවකටම වැට් එක ඇතුළු නොයෙකුත් බදු එකතු වීම තුළ. මෙම වක්‍ර බදු අය කිරීමේ ප්‍රමාණය අඩු වෙලා, සෘජු බදු ඒ වෙනුවෙන් වඩාත් වැඩි ප්‍රමාණයක් එකතු කර ගැනීමේ වැඩ පිළිවෙළකට යන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. ආණ්ඩුවක් හැටියට, රටක් හැටියට දැනට යෝජනා වෙලා තිබෙනවා, සියලුම දෙනාට බදු ලිපිගොනුවක් ඇතුළත් වෙන්න ඕනෑය කියලා. මම දැකලා තිබෙනවා. අපේ ගෙදරට ඊයේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශයක් ගිහිල්ලා දීලා තිබුණා. මේ මැතිවරණය මුල් කර ගෙන. ඒකෙත් මේ බදු යෝජනා විවේචනයට ලක් කරලා තිබුණා මේක මහජනතාවට අලුතෙන් පටවන්න යන බරක් කියලා. රට හැදීම වෙනුවෙන් ඔවුන් ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ තුළ ඔවුන්ව විවේචනයට ලක් කරලා තිබුණා. නමුත් අපි විශ්වාස කරන්නේ, රටක් වුණාම රටක් ගොඩ නගන්න ක්‍රමවත් බදු ක්‍රමයක් තිබෙන්න ඕනෑ. බදු ගිණුමක් කෙනෙකුට ඇති වුණාය කියලා ඒකේ සඳහන් වෙන්නේ නැහැ සියලුම දෙනාට බදු අය කරන්න සිදු වෙනවාය කියලා. නමුත් බදු ගිණුමක් ඇති වෙලා සියලු දෙනා එවැනි ජාලගත ක්‍රමයකට ඇතුළත් වීම වැදගත් වෙනවා. ඒක තමයි දියුණු රටවල්වල ක්‍රමවේදය වෙන්නේ. ඒ තුළ බොහෝ වංචාවන්, වැරදි හදා ගන්න, ඒවා අඩු කර ගන්න, ඒක ශක්තිමත් වෙනවා. ඒ නිසා අපි හිතනවා, එවැනි බදු ජාල ක්‍රමයක් ඇති කරලා සෘජු බදු වැඩි ප්‍රමාණයක් අය කර ගැනීමට. අපේ රටේ එහෙම තත්ත්වයක් නැහැ. ඒ සඳහා වැඩ පිළිවෙළක් ඇති වෙන්න ඕනෑය කියලා අපි විශේෂයෙන්ම කල්පනා කරනවා.

ඒ වාගේම පළාත් සභා ක්‍රමය වඩාත් ශක්තිමත් වෙන්න ඕනෑය කියන තැන තමයි අපි ඉන්නේ. පළාත් සභා ක්‍රමය වඩා ශක්තිමත් වීම තුළ බලය පහළට බෙදීගෙන ගිහිල්ලා, ඒ පහළට බෙදී ගෙන යන බලය තුළ ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් කරන්න, සංවර්ධනය වඩාත්

[ගරු කීර්ති කාරියවසම්]

වේගවත් කරන්න ඉඩකඩ ඇති වෙනවාය කියන විශ්වාසය අප තුළ තිබෙන්නේ. අපි ඒ වෙනුවෙන් මේ පළාත් සභාව ඉදිරි වර්ෂයේදී ආණ්ඩුවේ වැඩ පිළිවෙළත් එක්ක එකට එකතු වෙමින් කටයුතු කරාවි කියලා අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ අපි අද සම්මත කරන අයවැය ලේඛනයත් ඒක ක්‍රියාවට නැගෙන්නේ ඇත්තටම ආණ්ඩුකාරවරයාගේ අත්සන තැබීමෙන් පස්සෙයි. ආණ්ඩුකාරවරයාට මේ තිබෙන 13 වන සංශෝධනයේ බලතල තුළ ජනාධිපතිවරයාටවත් නොමැති යම් යම් බලතල ඇතුළත් වෙලා තිබෙනවා. අපි පුද්ගලිකව ආණ්ඩුකාරවරයා පිළිබඳව නොවෙයි. නමුත් ආණ්ඩුකාර තනතුර පිළිබඳව මහජන මතයට, මහජන ප්‍රජාතන්ත්‍රවාදී අදහසට ඉහළින් යන්න පුළුවන්කමක් තිබෙන්න බැහැයි කියන තැන තමයි අපි ඉන්නේ. ඒක වෙනස් වෙන්න ඕනෑය කියන අදහස අපි විශේෂයෙන්ම සඳහන් කරනවා. ඒ වාගේම පළාත් සභා සම්බන්ධයෙන් අලුතෙන් ඉදිරිපත් වෙලා තිබෙන මැතිවරණ නීතිය තුළ 50 ට 50 ක්‍රමයක් තමයි යෝජනා වෙලා තිබෙන්නේ. මේක ඉතාමත්ම ප්‍රජාතන්ත්‍රවාදයට අසාධාරණයක් වන තැනක තමයි මේ ඡන්ද ක්‍රමය යෝජනා වෙලා තිබෙන්නේ. ඒ නිසා රට හැටියට ගත්තොත් ව්‍යවස්ථාව තුළ දැනට යෝජනා වෙලා තිබෙන්නෙත් 60% යි 40% යි. ප්‍රාදේශීය සභා තුළත් තිබෙන්නේ, එවැනි තත්ත්වයක්. ඉතින් පළාත් සභාවලට පමණක් එවැනි වෙනසක් ඇති වෙන්න බැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා, එය වෙනස් කර ගැනීමට අපේ පළාත් සභාව මැදිහත් වෙන්න ඕනෑය කියන කාරණාව අපි විශේෂයෙන්ම සඳහන් කරනවා.

ඒ වාගේම අපි අධ්‍යාපනය ගැන කථා කරපු අවස්ථාවේත් විශේෂයෙන්ම සඳහන් කළා, තාක්ෂණ විෂය හැටියට අධ්‍යාපනය ඉදිරියට යන අවස්ථාවේ තාක්ෂණ විශ්ව විද්‍යාලයක් පළාත් සභාව යටතේ පිහිටුවන්න ආරම්භ වෙන්නය කියලා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් පළාත් සභාව ඇති කරන්න කටයුතු කරයි කියලා. ඒ වාගේම ළඟදී පත් වන ප්‍රාදේශීය සභා මැතිවරණයේදී අලුත් මන්ත්‍රීවරුන් බිහි වෙනවා. පත් වෙනවා. අපි මන්ත්‍රීවරුන්ට විතරක් දොස් කියලා විතරක් ප්‍රමාණවත් නැහැ, ඒ අය දූෂණයට එකතු වෙනවාය. හරියට කටයුතු කරන්නේ නැහැයි කියලා. ඔවුන් සඳහා හොඳ පුහුණුවක් ලබා දෙන්න මේ පළාත් සභාව වහාම මැදිහත් වෙන්න ඕනෑය කියන කාරණාව නැවතත් සඳහන් කරන්න බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා පසුගිය කාල සීමාව තුළ ඒ වාගේම අපේ අනෙකුත් ඇමතිවරුන්, අපේ මහා මාර්ග ඇමතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා, කෘෂිකර්ම ඇමතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමා, මේ සියලු දෙනාම අපට විශාල සහයෝගයක් දුන්නා. අපේ ගම් ප්‍රදේශවල අපට විවිධ කටයුතු කරන්න. විවිධ සංවර්ධන කටයුතු කරන්න. අපි ඒ අයට මේ අවස්ථාවේදී අපේ ස්තුතිය විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමා, සභා ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු ඒ සියලුම රාජ්‍ය නිලධාරීන්ටත් අපේ ගෞරවය මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. අවසාන වශයෙන් අපේ පළාත් සභාවේ මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාත් මේ පළාත් සභාවෙන් ඉල්ලා අස් වෙලා ඔවුන් ප්‍රාදේශීය පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙන්න සූදානම් වෙනවා. ඔවුන්ගේ දේශපාලන ගමන්මග තව තවත් ශක්තිමත් වේවා! සාර්ථක වේවායි! කියලා ප්‍රාර්ථනා කරනවා. ලබන්නා වූ නව වසර සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.58 ]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධව මේ විවාදයට සම්බන්ධ වීමේදී අපි දන්නවා. 2018 ජනවාරි 01 වැනිදා සිට මේ වියදම් පොදුවේ අනුමත කරනවාද නැද්ද කියන කාරණය තමයි මේ විසර්ජන ප්‍රඥප්තියේදී සලකා බලන්නේ. ඒ නිසා මේ සමස්ථ අයවැය සම්බන්ධව ප්‍රතිපත්තිමය එකඟතාවය බලන එක තමයි මේ විසර්ජන ප්‍රඥප්තියේදී සිද්ධ වෙන්නේ. අපි දන්නවා. මූල්‍ය බලය තිබෙන පාර්ලිමේන්තුව හා පළාත් සභා අයවැය වෙන් කොට හඳුනා ගන්න අපට හැකියාවක් නැහැ. මොකද, පළාත් සභා කියලා කියන්නේ, තවමත් තමන්ටම ස්වාධීනව ආදායම් උත්පාදනය කර ගන්න අපොහොසත් වුණු, පාර්ලිමේන්තුව ලබා දෙන්නා වූ මුදල් මත කටයුතු කරන්නා

වූ ආයතනයක් බවට තවමත් අපි පත් වෙලා තිබෙනවා. ඒ නිසා කල්පනා කරලා බලන්න. මේ සමස්ත අයවැය දිහා බැලීමේදී මේ සම්ප්‍රදායික අයවැයකින් ගැලවීමට අපි කොයි තරම් දුරට මේ අයවැය හරහා සමත් වෙලා තිබෙනවාද කියලා. දැන් ඇත්තටම මේ අයවැය සම්බන්ධ පොදු සාකච්ඡාව අවසාන වෙලාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කරපු කථාවේදී එතුමා එක මොහොතකදී උදාහරණයකට අරගෙන කිව්වා, මේ අයවැය ඉදිරිපත් කරන්න පුළුවන් ඉසුරට. හැබැයි, මේ ඉසුරට පුළුවන් වූ අයවැය නිපුණ ආරච්චිට මේක ඉදිරිපත් කරන්න බැහැයි කියලා. ඒ නිසා ඉසුරට පුළුවන්, අපට බැරි අයවැයක් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතකොට ඒ මුකුත් නොවෙයි. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ අයවැය ඉදිරිපත් කරන්න බැහැ. මොකද, මේක සාම්ප්‍රදායික අයවැයක්. මෙවැනි සාම්ප්‍රදායික අයවැයකින් අපට මේ තිබෙන තත්ත්වයන් ජයග්‍රහණය කරන්න බැහැ. මේ අයවැය විවාදය යන අතරතුර අපි දැක්කා. මේ අමාත්‍යාංශ වැය ශීර්ෂ සාකච්ඡාවලදී දිගටම ගිය එකක් තමයි, මේ අමාත්‍යාංශ පහෙන් හතරකම සිද්ධ වුණේ, ඇමතිවරු ඇගයීමක්. ඇමතිවරු ඇගයීම විතරක් නොවෙයි. කාර්ය මණ්ඩල, අමාත්‍ය කාර්ය මණ්ඩල ඇගයීමක්. නැත්නම් මේ සාමාන්‍ය නිලධාරීන් අගය කිරීමක් නොවෙයි. පොදුවේ අපේ මන්ත්‍රීවරුන්ගෙන් සිද්ධ වුණේ, ඇමතිවරු ඇගයීම හා ඒ සමහර අමාත්‍යාංශවල කාර්ය මණ්ඩල ඇගයීමක්. බොහොම ලොකුවට මෙහිදී සිදු වුණා. එක ඇමතිවරයෙකුට ඒක අදාළ වුණේ නැහැ. මොකද, ඒ ඇමතිතුමාට හැන්ද හුරු නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සමහර අමාත්‍යාංශවල එහෙම නොවෙයි. ඇමතිතුමාට හැන්ද හුරු නැති වුණත්, ටිකක් අර කාර්ය මණ්ඩලයට හැන්ද හුරුයි. ඒ නිසා ඒකෙන් ලැබුණු දෙයක් තිබෙනවා. ඒ නිසා මේ සමස්ත අයවැය ඇතුළේම ගියේ මේ අයවැයේ තිබෙන සාධනීය කාරණයක් හෝ මේ අයවැයේ තිබෙන නිශේධනීය කාරණයන් සම්බන්ධව නොවේ. ඇත්ටම අපට පුළුවන් දේ බැරි දේ මොකක්ද කියන එක විග්‍රහ කරනවාට වඩා, 2018 දී පොඩි සැකයකුත් තිබෙනවා නේ අප්‍රේල්, මැයි විතර වෙන කොට මැතිවරණයකුත් එයි කියලා. ඒ නිසා පුළුවන් තරම් ඒ සමහර සමහර ඇමතිවරුන්ගේ මසාජ් කිරීම් කරන එක, සමහර විට අපට හිතාගන්න බැරි විධියට, අහගෙන ඉන්න බැරි විධියට කකුල් මසාජ් කිරීම, තැලීම කියන ජාතියටත් ගියා. මම මේ කියන්නේ, අපට දැනුනු දේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අර මසාජ් ක්ලිනික්වලට ගිහිල්ලා නොවෙයි නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. ඇමතිතුමා දැන් මෙතැන ඉඳගෙන හිටියාට ඇමතිතුමාගේ ඔලුව නිකම් මසාජ් වෙනවා වාගේ එකක් වෙනවා ඒ කථාව ඇතුළේ. ඇඟ තැලෙනවා වාගේ එකක් වෙනවා ඒ කථාව ඇතුළේ. මම මේ කියන්නේ, ඒකයි. ඔන්න ඕක තමයි මේකේ වුණේ. එතුමාට හැන්ද අතට ගන්න කොටම වෙව්ලනවා. මොකද, මම හිතන විධියට ඒ ඇමතිතුමා මොකක්ද එකකට භය වුණා. එක මොහොතක. ඒ භය වීම එතුමාගේ තවමත් තිබෙනවා. ඒ නිසා එතුමා හැන්ද අතට ගන්නේම නැහැ. ගත්තොත් අත වෙව්ලනවා. තව අපේ ඇමතිවරු ඉන්නවා. එතුමන්ලා හැන්ද අතට ගන්න යන්නේ නැහැ. හැබැයි, මේක තේරුම් අරගෙන එතුමාගේ කාර්ය මණ්ඩලය හැන්ද අතට අරගෙන බෙදනවා. හැබැයි, සමහර වෙලාවට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම බෙදලත් නැහැ. සමහර වෙලාවට අර කඩලකාරයාගේ කඩල බේසම ඉවර වෙන්නේ නැහැ නේ? බෙදනවා. බෙදනවා. බෙදනවා. ඉවරයක් නැහැ. අපි හිතන්නේ, මෙපමණ බෙදන්න මේ බේසමේ කඩල තිබෙනවාද කියලා. නමුත් කොපමණ බෙදුවත් බේසමේ කඩල තිබෙනවා. ඇයි? ගොට්ට ගහනවා බොහොම දිගට. දිග ගොට්ටක් ගහනවා. යටම තිබෙන්නේ බොහොම හීනියට. යටම තිබෙන්නේ එක ඇටයයි. එතැන ඉඳන් තමයි උඩට තිබෙන්නේ. දැන් කඩලකාරයාත් මොකද කරන්නේ? පොඩි හැන්දක් තියාගෙන මේකෙන් දහ පහළොස්වරක් බෙදනවා. දැන් අපි හිතන්නේ, මේ ගොඩක් දානවාය කියලා. බලන කොට ඒ ගන්න කඩලවලින් භාගයක් හැලිලා ඇට දෙක තුනයි වැටෙන්නේ. අන්න ඒ ජාතියටත් බෙදපු ආකාරයකුත් තිබුණා. අපි හිතන්නේ, මේ බෙදන්න හදන විධියට හොඳට බෙදලා දායි කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මැජික් එකක් වාගේද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අන්න එහෙම තමයි. ඒ කියන්නේ, ජේන්න. පෙනුම සහ හරය කියන දෙක අතර වෙනසක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඕක තමයි වුණේ. ඒ නිසා මම හිතන්නේ, ඒ මට්ටමින්වත් බෙදා ගැනීමේ වුවමනාවක් මේ අතර තිබුණා. ඉතින් ඒ නිසා ඇත්තටම මේ අයවැයට මේ විසර්ජන ප්‍රඥප්තියට අපට එකඟ වෙන්න හැකියාවක් නැත්තේ අර මධ්‍යම ආණ්ඩුවෙන් වෙන් වන ආකාරයත් එක්ක - දැන් අපි දන්නවා, මේ පළාත් සභාවේ මූල්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒක හරි. අපි ඒක පිළිගන්නවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ මුදල් උත්පාදනය කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. හැබැයි, ඒ කිසිවකට තවමත් කවුරුවත් අත ගහලා නැහැ. මේකේ හිටපු කිසිම මහ ඇමතිවරයෙක් අත ගහලා නැහැ. ඒක ටිකක් විප්ලවීය කාර්යයක් තමයි. ඒකයි මම කියන්නේ, මහ ඇමතිතුමා ඉදිරිපත් කරන අයවැයක් අපට ඉදිරිපත් කරන්න බැහැයි කියලා. ඒක ටිකක් විප්ලවීය කාර්යයක්. මම හිතන්නේ නැහැ ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාට ඒ කාර්යය කරන්න පුළුවන් කියලා. හැබැයි, ඒක කළ යුතු එකක් හැටියට තිබෙනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැරිද කොමිටියක් දාලා JVP එකට ඒක භාර දෙන්න ඕක හදලා දෙන්න කියලා. මම ඇත්තට කියන්නේ. එතකොට යෝජනා ටිකක් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දෙන්න කෝ. පුළුවන් නම් දෙන්න කෝ. හැබැයි, අපි ලාභයට ගන්නත් කැමැති මිනිස්සු නොවෙයි. ඒක වෙන්නේ නැති එකක් මෙතුමා යෝජනා කරන්නේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒක අභියෝගයක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් අර මධ්‍යම ආණ්ඩුවේ ඒ තිබෙන තත්ත්වයන්ට ටිකක් එහාට ගිය වැඩකට මේකේ අත ගහන්න ඕනෑ. ඒ වාගේම තමයි මේකේ තිබෙනවා, මුදල් උපයා දෙන්න සොයා ගත්ත ක්‍රමය තිබෙනවා. එක මොහොතක අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා, අඩුම ගණනේ මේ ඉඩම්වල බද්ද හරියට ගන්නය කියලා. ඒ වෙලාවේත් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා නැගිටලා කිව්වේ ඒවා අපට අයිති දේවල් නොවෙයි. අන්න එහෙම සූදානමක් සහිත පළාත් සභාවක, අර අපි කියන ආකාරයේ අයවැයක් මේ පළාත් සභාවේ ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ නිසා අපට තිබෙනවා, මේකේ ප්‍රතිපත්තිමය ගැටළුවක්. ඒ නිසා ඒ ප්‍රතිපත්තිමය ගැටළුව මත මේක හරියට, දැන් මධ්‍යම ආණ්ඩුවේ ආනයන අපනයන ආර්ථිකයක් වෙනුවට, රටේ දේපළ විකුණලා, ආනයනයටත් සීමා වුණු ආර්ථිකයක් බවට පත්වෙලා තිබෙනවා. පොල් නැත්නම් පොල් ගේනවා. එළවළු නැත්නම් එළවළු ගේනවා. හාල් නැත්නම් හාල් ගේනවා. එවැනි තත්ත්වයකට අපේ ආර්ථිකය වැටිලා තිබෙනවා නම් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ වුණාට කිව්වේ නීල හරිත ආර්ථිකයක් කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එවැනි තත්තවයක් ඇතුළේ මෙවැනි අයවැයකට එහා එකක් එතුමන්ලාට ඉදිරිපත් කරන්නත් බැහැ. ඒ නිසා එවැනි සම්ප්‍රදායික අයවැයකට අපට එකඟ වෙන්නත් බැහැයි කියන එක ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[පූ.භා. 11.06 ]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 විසර්ජන පනත් කෙටුම්පත සඳහා අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. මගේ මිත්‍ර මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී අපේ මාදුළුවාවේ සෝභිත නායක ස්වාමීන් වහන්සේ පිළිබඳව සඳහන් කරනු ලැබුවා. ඒ වාගේම අද අපට ඉතාම සුවිශේෂ දිනයක්. අනුවේදනීය දිනයක්. ඒ තමයි අපේ පූජනීය ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේ දැයෙන් සමුගෙන අදට වසර 14 ක් සපිරෙනවා. උන් වහන්සේ මීට වසර 14 කට මේ රට තුළ ඇති කරපු ඒ බෞද්ධ පුනරුදය.

ඒ වාගේම දැයම පුබුදුවාළු උන්වහන්සේගේ ඒ රන් ස්වරය, උන් වහන්සේගේ ධර්ම කථිකත්වය පිළිබඳව අමුතුවෙන් සඳහන් කරන්න ඕනෑ නැහැ. අපි සියළු දෙනාටම උන් වහන්සේ කරපු ඒ ජාතික මෙහෙවර, ශාසනික මෙහෙවර මේ මොහොතේදී සිහිපත් වෙනවා. ඒ පිළිබඳව ජාතික හෙළ උරුමය විධියට අපගේ ගෞරවනීය ඒ අපවත්වී වදාළ පූජ්‍ය ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේව සිහිපත් කරනවා.

විශේෂයෙන් අද මේ සභාවේ මම හිතන්නේ, අපේ නික්ම යන සහෝදර මන්ත්‍රීවරුන් දෙපළක් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයේ. මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා. ඒ මන්ත්‍රීවරුන් දෙපළටත් මගේ සුභපැතුම් මේ වෙලාවේ එක් කරන්න කැමැතියි. එතුමන්ලාගේ ඒ දේශපාලන අභියෝගය ජය ගන්න ශක්තිය, ධෛර්යය ලැබේවායි කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම මගේ මේ දෙපසින්, එක්කෙනෙක් ගිහිල්ලා. එක්කෙනෙක් තමයි අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. මගේ වම් අත පැත්තෙන් ඉන්නවා. මගේ දකුණු අත පැත්තෙන් ඉන්නේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා. මේ දෙපළගේම අදහස් දිහා බැලුවාම මට පේනවා. කිසියම් විධියකට මේ පළාත් සභාව ඇතුළේම ඉන්නවා මේ පළාත් සභාව තව තවත් ශක්තිමත් කරලා, බලතල තවත් වැඩි කර ගෙන, මූල්‍ය බලතල තව තවත් වැඩි කර ගෙන, ස්වෛරීත්වය, ස්වාධීනත්වය ප්‍රකාශ කරන පළාත් සභාවක් බවට මේ සභාව පත් විය යුතුයි කියන අදහස, සංකල්පය එතුමන්ලාගේ මේ මතවාදය තුළ ඉතාම ගැඹුරින් මුල් බැස ගෙන තිබෙනවාය කියන එක මට පෙනී යනවා. දැන් එතුමාට විශාල හිත් අමාරුවක් තිබෙනවා, ආණ්ඩුකාරතුමාට මේ මූල්‍ය බලය සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන්. මම පැහැදිලිව කියන්න ඕනෑ. ආණ්ඩුකාරතුමාට මේ බලය ගලාගෙන එන්නේ කොහෙන්ද? එතුමාට මේක පිටින් ගලාගෙන එන එකක් නොවෙයි. මේ රටේ සෘජු මහජන ඡන්දයෙන් තේරී පත් වන ජනාධිපතිවරයාගේ බලය තමයි ආණ්ඩුකාරවරයාට ගලාගෙන එන්නේ. එහෙම නැතිව ආණ්ඩුකාරවරයා කියන්නේ, නිකම්ම නිකම් තනි පුද්ගලයෙක් හෝ පරිපාලන නිලධාරියෙක් පමණක් නොවෙයි. ඒ බලය ලබා එන්නේ මේ රටේ මහජනයාගේ සෘජු ඡන්දයෙන් තේරී පත් වන ජනාධිපතිවරයාගෙන් ගලා එන බලයයි, මේ ආණ්ඩුකාරවයා සතුව තිබෙන්නේ. ඒකයි මේ අභියෝගයට ලක් කරන්නේ. ඒක තමයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගෙත්, ඒ වාගේම මගේ මිත්‍ර කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාගෙත් එතුමන්ලාගේ දේශපාලන අදහස්, මතවාද ඒ වාමාංශික අදහස් පිටුපස තිබෙනවා. අද මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ජනවාර්ගික ප්‍රශ්නයට තිබෙන එකම විසඳුම මේ බලය වැඩි වැඩියෙන් බෙදන එක කියලා. බලය බෙදුවාය කියලා රටේ ප්‍රශ්න සියල්ල විසඳෙන්නේ නැහැ. මේ සියල්ලට වඩා අපට වැදගත් වෙන්නේ රටේ ස්ථාවරභාවය. එහෙම නම් ස්ථාවර භාවය අපි ආරක්ෂා කර ගන්න ඕනෑ.

ඒ නිසා තමයි පසුගිය වැය ශීර්ෂයකදී මම අවධාරණය කරලා පෙන්නුවේ, මේ අපට ආණ්ඩුකාරවරයා පිළිබඳව කථා කරන්න වෙන අවසාන අවස්ථාවද කියලා. එක අතකින් ආණ්ඩුකාරවරයාගේ ගුණ ගායනා කරන ගමන් අනික් පැත්තෙන් ආණ්ඩුකාරවරයාගේ අත අඹරවලා, ආණ්ඩුකාරවරයා දුර්වල කරන යෝජනා මේ පළාත් සභාව ඇතුළේ ඉන්න අපේ මන්ත්‍රීවරු, ඇමතිවරු, මහ ඇමතිවරු යෝජනා කරලා තිබෙනවා. ඒක ගැන මම කනගාටු වෙනවා. මේ රටේ එක්සත්භාවය, ඒකීයභාවය රැක ගන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ, මේ පවතින විධායක ජනාධිපති ධූරය යටතේ ආණ්ඩුකාරවරු නව දෙනෙක් සිටීම තුළ. ඒක මම නොවෙයි කිව්වේ. ෂර්වානන්ද විනිශ්චයකාරතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ සම්බන්ධයෙන් ලබා දීපු නඩු තීන්දුව තුළ තමයි කිව්වේ, මේ රට ඒකීයද? ෆෙඩරල් ද කියන විවාදය 1988 පැමිණි අවස්ථාවේදී. මේ පළාත් සභා පනත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසූ අවස්ථාවේදී, බෙදුණු නඩු තීන්දුවක් ලබා දුන්නේ. වනසුන්දර විනිශ්චයකාරතුමා එක නඩු තීන්දුවක් ලබා දුන්නා. ෂර්වානන්ද විනිශ්චයකාරතුමා තව නඩු තීන්දුවක් ලබා දුන්නා. එතුමා කිව්වා. නැහැ, ජනාධිපතිවරයාගේ බලය නියෝජනය කරන ආණ්ඩුකාරවරු නව දෙනෙක් ඉන්නවා. ඒක නිසා ගැටලුවක් මතු වෙන්නේ නැහැ. මේ රට තවදුරටත් ඒකීයයි කියලා. ඒක නිසා දැන් මේ අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ පළාත් සභාව තව තවත් බලාත්මක කරන්න ඕනෑය කියලා. බලාත්මක කරන්න ඕනෑ කියලා, බෙදුම් වාදය ශක්තිමත් කරන්න, ෆෙඩරල්වාදය ශක්තිමත් කරන දෙසට තමයි මේ යෝජනා ගෙන එන්න උත්සාහ කරන්නේ. ඉතින් ඒ ගැන මගේ බලවත් අප්‍රසාදය, ඒ වාගේම කනගාටුව, නොසතුට පළ කරන ගමන්,

එවැන්නකට අපි ඉඩ නොතබන බව ඉතා පැහැදිලි මේ වෙලාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ඊළඟට මම කියන්න කැමැතියි. මේකේ සංඛ්‍යා ලේඛන පිළිබඳව අමුතුවෙන් කථා කරන්න ඕනෑ නැහැ. අපේ මේ පළාත් සභාවේ ඉදිරි වර්ෂය සඳහා මිලියන 71,000 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම පුනරාවර්තන සඳහා මිලියන 59,000 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම් සඳහා මිලියන 11,000 ක් වෙන් වෙලා තිබෙනවා. නමුත් මේ සියල්ල සඳහා අපට අනුමැතිය, ඒ කියන්නේ මූල්‍ය බලය පාර්ලිමේන්තුව සතුව තිබෙන්නේ. පාර්ලිමේන්තුවෙන් වෙන් කරන මුදලක් මේ තිබෙන්නේ. එතකොට ඒ සඳහා තමයි අපි මේ වාද විවාද කරන්නේ. අදහස් දක්වන්නේ. කෙසේ නමුත්, පළාත් සභාවක් විධියට අපට කරන්න පුළුවන් කාර්ය භාරය මොකක්ද? ඒකේ සීමාවන් මොනවාද? ඒකේ සීමා සලකුණු මොනවාද? කියන එක අපි තේරුම් අරගෙන කළ හැකි දේ සහ කළ නොහැකි දේ මොනවද කියන එක තේරුම් අරගෙන කටයුතු කළ යුතුයි.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. අද දවසේ අපි කථා කරනවා. අද දවසේ ප්‍රධානම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන ගැටලුවයි. දුම්රිය වර්ජනය තවම විසඳිලා නැහැ. ජනාධිපතිවරයා නියෝගයක් නිකුත් කළා. ඒ වාගේම ජනාධිපතිවරයා එය අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කළා. තවම දුම්රිය වර්ජනය නතර වෙලා නැහැ. අද අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා සිසුන් විභාග මධ්‍යස්ථානවලට යනවා. මම ඊයෙත් අවධාරණය කරලා කිව්වා. මේ පිළිබඳව මේ පළාත් සභාවේ ඒ අදාළ අමාත්‍යාංශවල අවධානය යොමු කරන්න ඕනෑය කියලා. අද සියලුම පුවත්පත්වල මොකක්ද කියලා තිබෙන්නේ? සියලුම පුවත්පත්වල කියලා තිබෙන්නේ, මේ දරුවන් වෙනුවෙන් මේ වැඩ වර්ජනය අත්හරින්න කියලා. ජනාධිපතිතුමා කරලා තිබෙන ඉල්ලීමත් ඒකයි. මම ඊයේ මේ පළාත් සභාව ඇතුළේ කිව්වා. අඩුම වශයෙන් මේ විභාග මධ්‍යස්ථානවලට යන ළමයින්ට අවශ්‍ය කරන ප්‍රවාහන පහසුකම් නොමිලේ හරි ලබා දෙන්න, මේ පළාත් සභාවේ ප්‍රවාහන අධිකාරියේ අවධානය යොමු කරන්න කියලා. මම දන්නේ නැහැ, ඒ සඳහා අවධානය යොමු කළාද? නැද්ද? කියලා.

ඊළඟට දෙවැනි ප්‍රශ්නය. අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව වැය ශීර්ෂයේදී කථා කළා. අද අපට පොල් පිටරටින් ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. සහල් පිටරටින් ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. අගමැතිතුමා පාර්ලිමේන්තුවේදී විශේෂ ප්‍රකාශයක් කරමින් කියා සිටියා, රටේ එළවළු නිෂ්පාදනය 30% කින් පහළ වැටිලාය කියලා. එහෙමනම් රටේ නිෂ්පාදන ආර්ථිකයේ විශාල අර්බුදයක් ඇති වෙමින් තිබෙනවා. මේකට විවිධ හේතු සාධක බලපාලා තිබෙන බව ඇත්ත. නියගය බලපාලා තිබෙනවා. ඒ වාගේම තමයි මේ අධික උෂ්ණත්වය. එල්නිනෝ තත්ත්වය. ඒ වාගේම ඇති වෙලා තිබෙන ගංවතුර. මේ ආපදා තත්ත්වය. මේ සියල්ල හේතු වෙලා තිබෙන අතර අපේ ජනතාව දැන් කොතෙක් දුරට මේ නිෂ්පාදන ආර්ථිකයෙන් ඈත් වෙමින් ඉන්නවාද කියන කාරණයත් අපි තේරුම් ගන්න ඕනෑ. සේවා ආර්ථිකය එන්න එන්නම ප්‍රසාරණය වෙනවා. රටේ ආර්ථිකයෙන් 65% ක් සේවා ආර්ථිකය. කෘෂිකාර්මික පංගුව වේගයෙන් හැකිලෙනවා. අපි කනගාටු විය යුතුයි. අපේ රටට අවශ්‍ය කරන ආහාර ටික මේ මහ පොළවේ, අද අපට නිෂ්පාදනය කරගන්න බැරි වෙලා තිබෙනවා. එදා අපි කිව්වේ මොකක්ද? සහලින් ස්වයං පෝෂිත වුණු රටක්. මේ රටේ තිබෙන එක ජල බිඳුවක් හෝ මුහුදට නිකන් ගලා යන්න ඉඩ දිය යුතු නැහැයි කියලා මහා පරාක්‍රමබාහු රජතුමා කිව්වේ. අපි සහල් පිටරට යවපු ජාතියක්.

නමුත් අද අපට සහල් පිටරටින් ගේන්න වෙලා තිබෙනවා. එහෙමනම් මේකෙන් වැඩිම පීඩාවට පත් වෙන්නේ අර උතුරු මැද කාලපයේ ඉන්න ජනතාව නොවෙයි. බස්නාහිර පළාත තමයි කාර්මීකරණයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය. සේවා ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය. එහෙමනම් මේ පළාතේ ඉන්න ජනතාවට අවශ්‍ය කරන ආහාර ටික, එළවළු ටික, පලතුරු ටික, අලයි, කොළ පළා ටිකයි කොහෙන්ද අපි නිෂ්පාදනය කරගන්නේ? කොහෙන්ද ගෙන්න ගන්නේ? අපි ඒවා හම්බන්තොට සූරිය වැවෙන් නම් ගේන්නේ, ඇඹිලිපිටියෙන් නම් ගේන්නේ, දඹුල්ලෙන් නම් ගේන්නේ, කිළිනොච්චියෙන් නම් ගේන්නේ ඒවායේ අද විශාල නියගයට මුහුණ දීලා තියෙන්නේ. ඒ අනුව ආහාර නිෂ්පාදනය, පලතුරු නිෂ්පාදනය, එළවළු නිෂ්පාදනය, වී වගාව කඩා වැටිලා නම්, පොල් වගාව විශාල කඩා වැටීමකට ලක් වෙලා නම් අද අපි මේ පිළිබඳව නැවත වතාවක් සිතා බලන්න වෙනවා. ඒ නිසයි අපි

කියන්නේ, අපේ කෘෂිකර්ම ඇමතිතුමා මේ සඳහා වැඩ පිළිවෙළක් - මම එතුමාවත් අගය කරන්න ඕනෑ. විශේෂයෙන්ම කොස් පැළ ලක්ෂ 05 ක් බස්නාහිර පළාත තුළ සිටවීම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඒක ඉතාම අගය කළ යුතුයි. කොස් ගස කියන්නේ අපේ දෙවැනි බත් ගස. ඒ නිසා එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම අපි අගය කළ යුතුයි. ඒ වාගේම තමයි මේ බස්නාහිර පළාත තුළ අපට වගා කරන්න පුළුවන් ඉඩම් අද වේගයෙන් වාණිජ ඉඩම් බවට පත් වෙමින් තිබෙනවා. ඒවා වෙනත් කටයුතු සඳහා යොදවා ගනිමින් තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්නට ඕනෑ.

ඊළඟට අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා. අධ්‍යාපන ඇමතිතුමා විවිධ අදහස්, මත පළ කරනවා. අද පැහැදිලිව අපේ අධ්‍යාපන ක්‍රමයේ විශාල විප්ලවයක්, ප්‍රතිසංස්කරණයක් ඇති විය යුතුව තිබෙනවා. ඒ සඳහා අපි කොතෙකුත් සාකච්ඡා කරනවා. සංවාද කරනවා. ඒ වාගේම විවිධ යෝජනා ඉදිරිපත් කරනවා. නමුත් මේවා කොතෙත්දුරට ප්‍රායෝගිකව අපේ පාසල් පද්ධතිය තුළ, අපේ අධ්‍යාපන ක්‍රමය තුළට ඇතුල් වෙමින් තිබෙනවාද කියන එක ගැටලුවක්. එන්න එන්න පාසල් වැහෙනවා. ජනප්‍රිය පාසල්වලට යන්න දරුවෝ වැඩි වෙමින් තිබෙනවා. ඉල්ලුම වැඩි වෙමින් තිබෙනවා. ඒ වාගේම තමයි ජාත්‍යන්තර පාසල් වේගයෙන් හතු පිපෙන්නා වාගේ බිහි වෙනවා. එහෙමනම් මේවා කොහොමද අපි පාලනය කරන්නේ? නියාමනය කරන්නේ? කළමනාකරණය කරන්නේ? ප්‍රමිතියක් ඇතිව කරන්නේ කොහොමද? කියන එක පිළිබඳව අද අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අපේ ගරු මහ ඇමතිතුමා - ඇත්ත වශයෙන්ම මේ බස්නාහිර පළාතේ දැවෙන ප්‍රශ්නය තමයි මේ කැළි කසළ ප්‍රශ්නය. ඒකට අපි හිතනවා තිරසාර, ස්ථිර විසඳුමක් 2020 වන කොටවත් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසයි මම කිව්වේ, අපේ මහ ඇමතිතුමාට අඩුම වශයෙන් මේ බස්නාහිර පළාත තුළ එතුමාගේ නම රඳවන්න, ඒ ඉසුරුමත් විධියට එතුමාගේ නම රඳවන්න පුළුවන්කම ලැබෙන්නේ, මේ කැළි කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දුන්නොත් පමණයි. ඒ සඳහා විවිධ අදහස් මත තිබෙනවා. යෝජනා තිබෙනවා. ව්‍යාපෘති තිබෙනවා. ඒවා ගැන කථා බහ කරනවා. ඇත්තටම මේක මහ පොළවේ යථාර්ථයක් බවට පත් කරන්න කටයුතු කරන්න. ඒකයි අවශ්‍ය වෙන්නේ කියන එක ප්‍රකාශ කරමින්, මේ විසර්ජන පනත සඳහා මම හිතන්නේ අදහස් දැක්වීමට ඉඩකඩ ලබා දීම පිළිබඳව මගේ ස්තූතිය ගෞරවය පිරිනමමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.17 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අද අපි මේ මුදල් අනුමත කරලා දෙන මොහොතේ, විසර්ජන ප්‍රඥප්තිය අනුමත කරලා දෙන මොහොතේ, මම හිතන්නේ විශේෂයෙන්ම අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටපු මට, එතුමාගේ කථාව ගැන එක පැත්තකින් එකඟ වෙන්න පුළුවන්. ඇත්තටම මේ අවස්ථාවේදී අපි හුඟක් දෙනෙක් මේ සභාවේ මුදල්, පළාතේ අපේ ආදායම් වැඩි කර ගැනීම ගැන කථා කරනවා. නමුත් අපේ තිබුණු ආදායම් ටික ඔක්කොම - අපට මතක් වෙනවා, පසුගිය කාලය තුළ ඒ ආදායම් සියල්ලම අපි මහ රජයට ලබා දුන්නා. මහ ආණ්ඩුවට අපිම තමයි ලියලා දුන්නෙත්. මේ සභාව තුළ අත උස්සලා සම්මත කරලා, අපට තිබුණු මුදල් අයිතිය අපි භාර දුන්නා. දීලා ඊට පස්සේ අපි දැන් මහ ආණ්ඩුවෙන් මුදල් ඉල්ලගෙන යැපෙන සභාවක් හැටියට පත් වුණේ මෑත කාලයේදී. ඒක නිසා අපි කියන්න ඕනෑ. විශාල වෙනස්කම් සිද්ධ කරන්න අවශ්‍යතාවයක් තිබෙනවා. අපට අවශ්‍ය මුදල් ටික උපයා ගන්න අපට ඕනෑ තරම් අවස්ථා, ක්‍රම, උපාය මාර්ග තිබෙනවා. නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නෙ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපට පුළුවන්ද මේ දේශපාලන සංස්කෘතිය තුළ, විශේෂයෙන්ම මේ රටේ පවතින දේශපාලන සංස්කෘතිය තුළ, මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තමයි ඇත්තටම තිබෙන්නේ. ඒක නිසා ගොඩක් දෙනෙක් බලන්නේ - මම අද බදු ගහනවා කියලා යෝජනාවක් ගෙනාවොත් ඒකට ඉස්සෙල්ලාම මෙතැන විරුද්ධ වෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ. හැබැයි ඒ අය කියනවා, මේකට ක්‍රම තිබෙනවා කියලා. ඒ අයට බලය දෙන්න කියනවා. නමුත් මේකේ ඇත්ත අපි කථා කළොත්, යථාර්ථය ගැන කථා කළොත් මේ පළාත් සභාව තුළින්

[ගරු ශ්‍රීනාත් පෙරේරා]

බද්දක් ගහන්න අපි යෝජනාවක් කළොත්, ඊළඟ අවස්ථාවේ අපට ගෙදර ඉන්න වෙනවා. ඒ යෝජනාව ගේන කෙනාට. තමන්ගේම කියලා අයවැයක් ඉදිරිපත් කරන එකේ තිබෙන ප්‍රශ්නය ඕක තමයි. අපට පුළුවන්ද? මහ ඇමති හැටියට කවුරු පත් වුණත් අපට පුළුවන් වෙයිද අද මේ යහපාලන රජය ගෙනාපු බදු ක්‍රමය වෙනස් කරන්න. දැන් යහපාලන රජය විසින් ගෙනත් තිබෙන බදු ක්‍රමය. එවැනි යෝජනාවක් ගේන්න තරම් හයියක්, ශක්තියක් අපට තිබෙනවාද කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය. මොකද, මේ දේශපාලන සංස්කෘතිය ඇතුළත අපට ඉතාමත් අසීරු ප්‍රශ්නයක් තමයි මේක. විශේෂයෙන්ම අපි ගත්තොත් මැද පෙරදිග රටවල්වල දේශපාලන සංස්කෘතිය ගත්තොත් පාර්ලිමේන්තුව කියන එක ඇවිල්ලා ඇත්තටම නීති සම්පාදනය කරන තැනක් විතරයි. ඒ රටේ නීතිය ක්‍රියාත්මක කරන්නේ එතැනින්. නීති හදන්නේ එතැන. එතැනින් එහාට පාර්ලිමේන්තුවක් තුළින් මම හිතන්නේ නැහැ මොනම දියුණු රටකවත් බඩු බෙදා දෙනවා කියලා. අද අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පොරකන්නේ පළාත් සභාවේ මන්ත්‍රීවරුත් එක්ක කොහොමද තරගෙට බඩු බෙදන්නේ කියලා. අපේ ජනතාවට. ඡන්ද ටික රැක ගන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉවරද? තවම විනාඩි තුනක් වත් ගියේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. හරි. අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද අපේ තිබෙන දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න කාලය ඇවිල්ලා තිබෙනවා. අපි පළාත් සභාව ගැන කථා කරද්දී, මහ ආණ්ඩුව ගැන කථා කරද්දී මේ ඔක්කොම පොරකන්නේ අපේ ඡන්ද ටික රැක ගන්න. අපි කොහොමද දේශපාලන පක්ෂ ටික රැක ගන්න වැඩියෙන් මොනවාද දෙන්නේ කියලා. ඇත්තටම අද ඡන්දයක් ඉල්ලන්න ගියාම ඉස්සෙල්ලාම ගමේ ඉන්න මනුස්සයා අහන්නේ අපට මොනවද දෙන්නේ කියලා. ඡන්දය දෙන්න අපට මොනවද දෙන්නේ කියන ප්‍රශ්නය තමයි ඉස්සෙල්ලාම අහන්නේ. ඉතින් මේක තමයි තිබෙන දේශපාලන යථාර්ථය. මේ රට දියුණුව කරා ගෙනියන්න බැරි ප්‍රධානම ප්‍රශ්නයත් මේක. මොකද, අද පොඩි තැනේ සිට ලොකු තැනකට වෙනතුරුම මේ රට දූෂණය වෙලා ඉවරයි. ඇත්තටම මේ රට කොමිස් මුදලට යට වුණු රටක් බවට පත් වෙලා ඉවරයි. ඒ නිසා මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න. නැත්නම් මම හිතන්නේ මේ කිසිම දෙයක් අපට ක්‍රියාත්මක කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මේ වර්තමාන පළාත් සභාවේ මහ ඇමතිතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් - අඩුපාඩු තිබෙන්න පුළුවන්. අඩුවැඩි වශයෙන් සමහර අයට ලැබිලා තිබෙන්න පුළුවන්. නමුත් සමස්තයක් වශයෙන් ගත්තාම - මම 2009 සිට මේ පළාත් සභාව නියෝජනය කරන්නේ. මේ දෙවැනි වතාව. කිසිම දවසක ලැබුණේ නැති ප්‍රතිපාදන ප්‍රමාණයක් මම හිතන්නේ මෙවර මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ලැබුණා. මහජනතාව ළඟට යන්න පුළුවන්, ගමට යන්න පුළුවන්, ගමේ ඡන්දය දුන්න ජනතාවට වැඩ කරන්න පුළුන් ප්‍රතිපාදන ප්‍රමාණයක් සියලුම මන්ත්‍රීවරුන්ට ලැබුණා. ඒ නිසා අපට කොහෙත්ම කියන්න බැහැ. පසුගිය හිටපු මහ ඇමතිතුමාත් එක්ක මේ මහ ඇමතිතුමා සංසන්දනය කරන්න කවුරු හරි හදනවා නම්, එහෙම බැලුවත් මේ මන්ත්‍රීවරුන්ට විශාල සාධාරණයක් පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ඉටු වෙලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒක මතක් කරන ගමන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මෙය අවස්ථාවක් කර ගන්නවා. අපේ හිතවත් මීගමුවේ ආසන සංවිධායක රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම අපේ ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාත් මේ පළාත් සභාවෙන් සමු ගන්නා අවස්ථාවේදී විශේෂයෙන්ම අපේ මීගමුව ආසනයේ සංවිධායකතුමා වෙනුවෙන්, මීගමුව ආසනය තුළත් ගම්පහ දිස්ත්‍රික්කය තුළත් අපි එකට වැඩ කළා. ඒ දෙපළටම මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. මේ පළාත් සභාව ඉදිරියට ගෙනි යන්න එතුමන්ලා දක්වපු දායකත්වයටත්, එතුමන්ලාගේ ඉදිරි ගමනටත් මේ අවස්ථාවේදී සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.23 ]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද ඓතිහාසික දවසක්. අපේ මන්ත්‍රීවරු දෙපළක් රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා මීගමුව නගරාධිපති අපේක්ෂකත්වයටත්, ඒ වාගේම මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයටත් තරග වැදීමට ඉල්ලා අස් වෙනවා. භය නැතිකම පෙන්නලා, යහපාලන රජයක් තුළ එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වීමට පළාත් පාලන ක්ෂේත්‍රයට පැමිණීම අපි අගය කරන්න ඕනෑ. ඇත්තටම ඒ තුළින් අපි දකිනවා. මේ ඡන්දයේ තිබෙන ජයග්‍රහණය එක්සත් ජාතික පක්ෂයේ. එම නිසා එම දෙපළට ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාගේත්, විපක්ෂ කණ්ඩායමේත් ආශිර්වාදය පළ කරමින් ඒ කාලය තුළ අපට දක්වපු සහයෝගයට අපේ ස්තූතිය අපි ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මාර්ගයෙන් පොඩි මතක් කිරීමක් කරනවා. මීට පෙර පරිපූරක අනුමත කිරීමේදී - ගරු අමාත්‍යතුමනි, මේක වැරැදියට හිතන්න එපා. ධූරධාරීන් හතර දෙනා සම්බන්ධව යම්කිසි පොරොන්දුවක් වුණා. මම ඉල්ලීමක් කරනවා. හිටපු අමාත්‍යතුමාත්, ප්‍රධාන අමාත්‍යතුමාත් යම් අවස්ථාවක අමාත්‍යාංශ මට්ටමින් වාහන අරගෙන ඒ ධූරධාරීන්ට ලබා දුන්නා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු විපක්ෂ නායකතුමා ඔබතුමාගේ වැය ශීර්ෂයට ඇවිල්ලත් මගෙන් ඇහුවේ ජෝර්ජ් සංවිධායකතුමා, අපේ අලුත් වාහනය සම්බන්ධයෙන් මොකද කියලා. ඔබතුමා ඇත්තටම ශක්තිමත්. අපි දකිනවා. ගරු ජනාධිපතිතුමා ලිඛිතවම අත්සන් කළා, මේක දෙන්න කියලා. ඒකේ කොපියක් මා ළඟ තිබෙනවා. අපි ජනාධිපතිතුමාව අගය කරනවා. ඒත් මේක තවම ක්‍රියාත්මක වෙලා නැහැ. එම නිසා අපි ඉන්න කෙටි කාලය තුළ නව පළාත් සභා ඡන්ද ක්‍රමයකට යන්න තිබෙන වෙලාවේ ඔබතුමාගෙන් හැම කර්තව්‍යයක්ම ඉෂ්ට වුණා වාගේම මේ කර්තව්‍යයත් මුල් කාර්තුවේදීම ඉෂ්ට කරයි කියන විශ්වාසය අපි තුළ තිබෙනවා. එම නිසා එම අවස්ථාව ඉටු කර දෙන්නය කියන එක ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මීට පෙරත් හිටපු ප්‍රධාන අමාත්‍යතුමා ලබා දුන්නේ, අමාත්‍යාංශ මට්ටමින් අරගෙන. එහෙමනම් ඔබතුමාටත් ඒ අවස්ථාව උදා කරලා ඒ ශක්තිය ලබා දෙන්නය කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම ප්‍රධාන ගොඩනැගිල්ල, නැත්නම් පළාත් සභා සංකීර්ණය විවෘත කිරීමට මාර්තු මාසයේ සැලසුම් කරලා තිබෙනවා. අපි ඒක නිරීක්ෂණය කරන්න ගියා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, පෙනෙන විධියට නම් මාර්තු මාසයට ඒක කරන්න බැහැ. ඔබතුමා ඒකට මැදිහත් වෙලා, ඔබතුමාගේ දක්ෂතාවය යොදවලා මේක කරන්න කටයුතු කරන්න. මේ ඡන්ද වකවානුවක් එන කාලයක්. ඒ වාගේම කියන්න ඕනෑ, මූල්‍ය ප්‍රගතිය ගැන කථා කරන්න ඕනෑ. කාර්තුවෙන් කාර්තුව පසු විපරමක් ඔබතුමා මාර්ගයෙන් ලබා දෙන්නේ නම්, ඉතා අගය කරනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා මාර්තු මාසයේ පරිපූරකයක් යොදනවා කියලා අපට පොරොන්දු වුණා. ඒ පරිපූරකය තුළ ඒ ශක්තිය ලබා දීලා, සියලුම ගරු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරු 104 දෙනාටම එක හා සමානව ප්‍රදේශයේ වැඩ කටයුතු කිරීමට, පාසල් දියුණු කිරීමට, මංමාවත් දියුණු කිරීමට, අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමේ කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා. මන්ත්‍රීවරු 104 දෙනා, 102 ක් වෙනවා. 102 න් 51 යි පත් වෙන්නේ. 51 දෙනෙක් ලැයිස්තුවෙන් එනවා. ඒකෙන් සියයට 30 ක් කාන්තාවෝ වෙනවා. එවැනි වාතාවරණයක් තුළ ඉදිරියේදී, මේ 2018 වසර අපේ තීරණාත්මක වසරක් බැවින්, සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ඔබතුමා ඒ ශක්තිය දීලා එක හා සමානව කටයුතු කරන්න. ඒ ගමේ, ඒ ආසනයේ වැඩක් කරන්න. ඔබතුමා කිව්වා වාගේ නම ඇති වැඩක් කරන්න සියලුම ගරු මන්ත්‍රීවරුන්ට, අපට අවස්ථාවක් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරමින්, අද අස් වූ අපේ ගරු මන්ත්‍රීවරු දෙපළට අපේ ස්තූතිය ප්‍රකාශ කරනවා වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේ කිව්ව කාරණා ගැනත් කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[පූ.භා. 11.27 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුදුරාජාණන් වහන්සේ කාලාම කියන ගමේ ධර්මානුශාසනාවකට වඩිනවා. කාලාම ගමේ නායකයා මහා කාලාම බුදුන් වහන්සේගෙන් අහනවා, දැන් වෙන කොට ශාස්තෘවරු 62 ක් ඇවිල්ලා

[ගරු නිරෝෂන් පාදුක්ක]

අනුශාසනා කරලා ගිහිල්ලා තිබෙන්නේ. ඔබ වහන්සේ 63 වැනියා. කවුරු කියන එකද අපි අහන්නේ කියලා. කවුරු කියන දේද හරි කියලා. එතකොට බුදුහාමුදුරුවෝ කියනවා, බොහොම සරල ප්‍රශ්නයක්. මම කොටුවක් ගහනවා. ඒ කොටුව ඇතුළේ කරුණු 10 ක් තිබෙනවා. අන්න ඒ 10 පිළිගන්න එපා කියලා. පළමුවැනි එක මොකක්ද? කට කථාවෙන් කියන ඒවා පිළිගන්න එපාය කියලා. සමහර මන්ත්‍රීවරු කියනවා, භය වෙන්න එපා. මහ ඇමතිතුමා ඇමතිවරු දාලා ඒ ඒ අමාත්‍යාංශවලින් වැඩිපුර අපට සල්ලි දෙනවා කියලා කිව්වත් අපි ඒවා පිළිගන්න ඕනෑ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට පස්සේ කියනවා, පරම්පරාවෙන් කියනවාට පිළිගන්න එපා කියලා. ඒ කියන්නේ අපි සාම්ප්‍රදායික ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටිය. ඒ නිසා අපට වැඩියෙන් මහ ඇමතිතුමා සල්ලි දෙයි. අපේ කට්ටියව බලා ගනියි. එහෙම කිව්වයි කියලත් මේක වැඩිය පිළිගන්න එපා. ඊට පස්සේ බුදුන් වහන්සේ කියනවා, න්‍යාය දුටු පමණින් පිළිගන්න එපා. අයවැයක් හදන කොට ආදායම් වියදම් වැය ශීර්ෂ හදලා, පුනරාවර්තන වියදම් හදලා, ප්‍රාග්ධන වියදම් හදලා මේ න්‍යායකට අනුව අයවැයක් ඉදිරිපත් කළා කියලත් පිළිගන්න එපා. ඊට පස්සේ කියනවා, තර්කයකට එකඟ වූ පමණින් පිළිගන්නත් එපා. අපි දවස් 05 ක් තර්ක කරනවා. මේ අයවැය හොඳයි. මේ අයවැය සවුත්තුයි. මේ අමාත්‍යාංශයට දීලා තිබෙන මුදල අඩුයි. මේ අමාත්‍යාංශයේ වැඩියි. ඒ මොක කිව්වත් එහෙමත් පිළිගන්න එපා. ඊට පස්සේ කියනවා, යමක් එසේ සිදු වෙතැයි කියා පිළිගන්නත් එපා. මහ ඇමතිතුමා අපට පොරොන්දු වුණා. පරිපූරකයක් දාලා මාර්තු මාසයේදී Smart Class Concept එකට මිලියන 100 ක් වෙන් කරනවා කියලා. එහෙම කිව්ව පළියටත් මේ අයවැය පිළිගන්න එපා. යමක් එසේ සිදු වුණාය කියලා පිළිගන්න එපා. මහ ඇමතිතුමා හම්බන්තොටදී කියනවා, මම එක්සත් ජාතික පක්ෂයට රුපියලක්වත් දුන්නේ නැහැ. මම පොහොට්ටුවටයි, අතටයි විතරයි දුන්නේ. හැබැයි, පොහොට්ටුව පිස්සු නටපු හින්දා අපට එක්සත් ජාතික පක්ෂයට දෙන්න වුණා. එහෙම වුණා කියලත් ඒක එහෙම පිළිගන්න එපා. ඊට පස්සේ කියනවා, ගුරුවරුන් කිව්වයි කියලත් මේක පිළිගන්න එපා. ගුරුවරුන් කියන්නේ, අමාත්‍යාංශ ලේකම්වරු එකතු වෙලා, මේක හදලා දීලා, සුන්දර විධියට හදලා ගෙනල්ලා දීපු මේ අයවැය එසේ වුණාය කියලා පිළිගන්නත් එපා. බ්‍රහ්මණයෝ ඒ වාගේම නිගන්ඨයෝ කිව්වයි කියලත් - බ්‍රාහ්මණයෝ, ඒ කියන්නේ අපේ ආණ්ඩුකාරතුමා ඇවිල්ලා මේක හොඳයි කිව්වයි කියලත් පිළිගන්න එපා. බුදුරජාණන් වහන්සේ අන්තිමට කියනවා, මම කිව්වත් මේක පිළිගන්න එපා. එහෙමනම් මොකක්ද පිළිගන්නේ? මොකක්ද පිළිගන්නේ? (බාධා කිරීමක්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ මොකක්ද පිළිගන්නේ? සුජාතා සිටු දුව දීපු කිරිපිඬ අනුභව කරලා බුදුරජාණන් වහන්සේ පාත්තරය ගඟට දානවා. හැබැයි ඒක යන්නේ උඩුගං බලා. ඒ මොකක්ද උඩුගං බලා කියන්නේ. සම්ප්‍රදායට එරෙහිව, සිංහලයේ අපට වචනයක් තිබුණේ නැහැ. අවසානයේදී අපි වචනයක් සොයා ගත්තා, රැඩිකල් කියලා. අපි රැඩිකල් කියලා. උඩුගං බලා. සම්ප්‍රදායට එරෙහිව යනවා. ඒ නිසා සම්ප්‍රදායට අනුකූලව මේ සභාවේ අපි ඡන්දය දිය යුතුයි. අපි පරම්පරාගත යූ.ඇන්.පී. පරම්පරාගත ජේ.වී.පී. පරම්පරාගත ශ්‍රී ලංකා. එහෙම සම්ප්‍රදායික වුණත් මේකේදී අපි ඡන්දය පාවිච්චි කළ යුතු නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙමනම් අපි ඡන්දය පාවිච්චි කරන්න ඕනෑ කොහොමද? අතීතය ගැන හිතලත් නොවෙයි. අනාගතය ගැන හිතලත් නොවෙයි. වර්තමානයේ ඉඳලා අපි මේ අයවැයට ඡන්දය පාවිච්චි කරන්න ඕනෑ. වර්තමානය තුළ අපේ තීන්දු, ප්‍රතිපත්ති, කොතරම් දුරට ශක්තිමත්ද? මේ අයවැය ගැන. ඒ නිසා අපි ඉතිහාසයේ වැරැදි කරලා තිබෙන්න පුළුවන්. අයවැයක් සම්බන්ධයෙන් අපි වැරැදි තීන්දු අරගෙන තිබෙන්න පුළුවන්. නමුත් ඒවා එකක්වත් අවශ්‍ය නැහැ. බුදුන්ගේ කාලයේ සුජාතා සිටු දියණියට නිවන් යන්න බැරි වුණා. නිවන් යන්න පුළුන් වුණේ ප්‍රඥාව වඩලා විතරයි. දන් දීලා යන්න බැහැ. ඒ නිසා බඩු බෙදලා මේකේ එක ඇමැතිවරයෙක්ටවත් නිවන් යන්න බැහැ. මේකේ එක ඇමතිවරයෙක්ටවත් බඩු බෙදලා යන්න බැහැ. පැළැටි බෙදලා යන්න බැහැ. පොඩි පොඩි කෑළි බෙදලා යන්න බැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පොඩි කෑලි කියන්නේ මොනවාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා මතක තියා ගන්න. සුජාතා සිටු දියණියට නිවන් යන්න -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරියට අර්ථ නිරූපණය කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බැරි වුණාට, ඉන්දියාවේ සිටිය බරපතළ වරදවල් කරපු, රාත්‍රි කාලයේ වරදේ හැසිරුණු අනුලා නිවන් දැක්කා. අම්බපාලි නිවන් දැක්කා. ඒ නිසා මතක තියාගන්න. සුජාතා සිටු දියණියට නිවන් යන්න බැරි වුණා. ඒ නිසා මතක තියාගන්න. වැරැදි කරපු අයටත් නිවන් යන්න පුළුවන්. යන්න පුළුවන් ප්‍රඥාව වඩලා විතරයි. ඒ නිසා මේ ඇමතිවරුන්ගේ වැරැදි කප්පරක් තිබුණා. ඒ වැරැදි හදලා ප්‍රඥාව දියුණු කරගෙන ගියොත් මම හිතනවා, මේ අයවැය අපට සාර්ථක අයවැයක් බවට පත් කරගන්න පුළුවන් කියලා. ඒ නිසා මතක තියාගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇඟිලි 999 ක් කපපු මිනිහත් නිවන් ගියා. ගියේ කුමක්ද? බුදුරජාණන් වහන්සේට නවතින්න කිව්වාම කිව්වේ, මම නැවතිලා. ඔබ නවතින්න. එහෙමයි නවතින්න කිව්වේ. වර්තමානයේ මම ඉන්නවා. ඔබත් වර්තමානයේ ඉන්න කියලා. ඒ නිසා මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා. ඔබ සියලු දෙනාම වර්තමානයේ ශක්තියත් එක්ක ඉඳලා මේ තීන්දුව ගන්න. අතීතයේ ක්‍රියාකාරකම් වැඩක් නැහැ. අනාගතයේ කරනවාය කියන කාරණාත් වැඩක් නැහැ. ඔබේ හෘද සාක්ෂියට එකඟව මේ අයවැය තුළ ඔබේ ශක්තීන් පාවිච්චි කරලා, අද දවසේ මේ ඡන්දය පාවිච්චි කරන්න. මොකද, මේ තමයි ලංකාවේ ලොකුම පළාත් සභාවේ අයවැය. මිලියන 71,000 ක් පිළිබඳව කතිකාවක් එන්නේ. ඒ නිසා අපි අනාගතයටත් වඩා, අතීතයටත් වඩා වර්තමානයේ ඉන්න ඕනෑ. ඒ ගමනේ දී මම විශ්වාස කරනවා. ප්‍රධාන අමාත්‍යවරයා වර්තමානයේ මේ සභාව තුළ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ ශක්තීන් පාවිච්චි කරලා, මේ සභාව වඩාත් ඵලදායි සභාවක් බවට පත් කරන්න ක්‍රියා කරයි කියලා. මේ විසර්ජන පනතේදී අපි තර්ක කරන්නේ නැහැ. අපි අභියෝග කරන්නේ නැහැ. අපි කරන්නේ දින 04 ½ ක් තිස්සේ අපි තර්ක කරපු වාගේ අවසාන සම්පිණ්ඩනය ගෙනැල්ලා අපි කථා කරලා අපි ඉදිරියේදී ගන්න පියවර ගැන කථා කරනවා. ඒ නිසා ඉදිරියේ ගන්න පියවර තීන්දු වෙන්නේ, අද වර්තමානයේ අපි තව විනාඩි කිහිපයකින් ගන්න ඒ ශක්තිමත් දේශපාලන තීන්දුව මත. ඒ නිසා ඒ තීන්දුව සියලු මන්ත්‍රීවරුන් තම තමන්ගේ හෘද සාක්ෂියට එකඟව, වඩාත් හොඳ යැයි කියන වඩාත් සුදුසු යැයි කියන තීන්දුවට එළැඹෙනු ඇතැයි කියලා මම විශ්වාස කරමින්, ලබන වසර මේ මන්ත්‍රීවරු මේ මොහොතේ, වර්තමානයේ ගන්න තීන්දුව අනාගතයට විශේෂයෙන් බලපානවා කියලා කියමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. දැන් තිබෙන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පිළිතුරු කථාව. ඊට ප්‍රථමයෙන් මම ස්තූතිවන්ත වෙනවා. මේ වර්ෂයේදී අපේ සියලුදෙනාම දැක් වූ සහයෝගයට. ඒ වාගේම අපේ මේ සභාවෙන් නික්මෙලා යන රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාටත්, මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාටත් තමන් බලාපොරොත්තු වන ඉලක්කයට යන්න වාසනා මහිමය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින්, ගරු ප්‍රධාන ඇමතිතුමාගේ කථාවට පෙර ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා -

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Sirikamal Filician de Silva M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 25 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.35 ]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ තිස් වන අයවැය විවාදය අවසන් දිනයේ,අවසන් මොහොතටයි අපි දැන් පැමිණ සිටින්නේ. අයවැය විවාදයට සම්බන්ධ වෙලා තමන්ගේ අදහස් හා යෝජනා ඒ වාගේම විවේචන ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය මම මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි. 2018 වර්ෂයට අදාළව මා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන සඳහා නීතිමය බලය පැවරෙන විසර්ජන ප්‍රඥප්තිය අප විසින් සම්මත කරගත යුතු

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

වෙනවා. ලබන වර්ෂය තුළ ගෙවිය යුතු පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ ණය අත්තිකාරම් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම මෙම විසර්ජන ප්‍රඥප්තියේ අරමුණයි. එක් එක් වැය ශීර්ෂය යටතේ රුපියල් 71,645,639,000/- ක මුදලක් වැය කිරීමට මෙම සභාවේ බලය මා ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අයවැය විවාදයේ දී සමහර විෂයන් සඳහා මුදල් වෙන්වීම ප්‍රමාණවත් නැතැයි පැවසුවා. මමත් එම කාරණය පිළිගන්නවා. අපේ අයවැයෙත් 85% ක් පුනරාවර්තන වියදම්. ප්‍රාග්ධන වියදම් 15% ක් පමණයි. අතීතයේ සිටම මේ තත්ත්වයයි. මේ 15% හැකිතාක් සාධාරණයව බෙදා හැරීම මාගේ කාර්යභාරයක්. මුදල් බෙදා හැරීමේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට පැවරී ඇති බලතල වගකීම් හා ඒ ප්‍රමාණය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුයි. කාර්යයන් විශාල වුවද, පවතින සම්පත් සීමිතයි. පවතින සීමිත සම්පත් හැකි තාක් සාධාරණ අයුරින් විෂයයන් හී වෙන් කර බෙදා තිබෙනවා. කෙසේ වුවත් 2018 වර්ෂය සඳහා අතීතයේ සෑම වර්ෂයකට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් සංවර්ධනය සඳහා අපි වෙන් කරලා තිබෙනවා.

අපේ ආදායම් වැඩි කරගත යුතුයි යන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ප්‍රකාශ වුණා. පළාත් සභාවට එකතු කළ හැක්කේ බදුවලට වඩා ගාස්තුයි. එයද නියම කිරීමේ බලයක් අප වෙත පැවරී නැහැ. රජය පනවා දුන් පසු එය එකතු කිරීම තමයි පළාත් සභාවෙන් කෙරෙන්නේ. රජයේ සහාය නොමැතිව තනිවම ආදායම් මාර්ග වැඩි කර ගැනීම පළාත් සභාවට කිරීම අපහසුයි. නමුත් රජයේ සහයෝගය ලබාගෙන හෝ මෙම කාර්යයන් කළ යුතුයි. සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කුමන ආකාරයෙන් පැවසුවද මෙම මුදල් ප්‍රකාශයේ 2018 වර්ෂයේදී ලබා ගැනීමට අපේක්ෂිත ඉලක්ක රාශියකට අපි මුදල් වෙන් කර තිබෙනවා. තට්ටු 15 කින් යුත් පළාත් සභා ගොඩනැගිල්ල ඉන් ප්‍රධානයි. ලබන වර්ෂයේ වෙන් කර ඇති මුදලත් එක්ක මෙමම ගොඩනැගිල්ලේ වැඩ අවසන් වන විට රුපියල් මිලියන 7200 ක් පමණ වියදම් කරන්නට අපේක්ෂා කරනවා. ඒ අනුව අපි මේ වෙලාවේ දී මේ ඡන්දයෙන් පස්සේ දිවා භෝජනයට පෙර මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ට විනාඩි කිහිපයකට ආරාධනා කරනවා, එම ගොඩනැගිල්ලේ නිරීක්ෂණ චාරිකාවකට මාත් එක්ක එකතු වෙන්න කියලා.

අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ විවාදයේදී ගරු මන්ත්‍රීතුමන්ලා එම අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව විශේෂයෙන් අදහස් දැක් වූවා. අනිකුත් අමාත්‍යාංශ හතරටම වඩා එම අමාත්‍යාංශය විවේචනයට ලක් වුණා. පළාත් සභාවට පැවරී තිබෙන විශාලම විෂයය අධ්‍යාපනය. එම නිසා ඒ කෙරෙහි අප සැමගේම අවධානය යොමු කළ යුතුයි. ගරු සභාපතිතුමනි, ඒක ඉතින් ගරු ඇමතිතුමාටම විතරක් දීලා මදී. අපි ගරු ඇමතිතුමාට කිව්වා. විෂ්ණු දෙවියෝ වෙන්නේ නැතිව - විෂ්ණු දෙවියන්ව මාව කරලා. විෂ්ණු දෙවියන්ව මාව කරන්න කියලා. විෂ්ණු දෙවියන්ව මාව කළා නම් වැඩේ ටිකක් ගොඩදාගන්න පුළුවන් වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පූජා වට්ටියක් දුන්නේ නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම හිතනවා විෂ්ණු දෙවියෝ මාව කරලා අපි සියලු දෙනාටම එකතු වෙලා මේ අධ්‍යාපන අමාත්‍යාංශය දියුණු කරන්න පුළුවන් කියලා. මොකද හොඳම දේ ළමයින්ට දෙන්න අපි සූදානම් වෙන වෙලාවේදී අපි සියලු දෙනාම එකතු වෙලා, මේ වර්ෂයේදී - අපට තව මාස 16 ක විතර කාලයක් තිබෙන්නේ. අපි ඒ මාස 16 දී අධ්‍යාපනය වෙනුවෙන් යමක් කරන්න එකතු වෙන්න කියලා මම තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පළාත් සංවර්ධන සැලැස්ම යටතේ අපි රුපියල් මිලියන 2000 ක් අමාත්‍යාංශයවලට වෙන් කර තිබෙනවා. එම මුදල් වලින් විශේෂ ව්‍යාපෘති කළ යුතු බවට එම අමාත්‍යාංශවලට දැනටමත් මම උපදෙස් දීලා තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකර්මය පිළිබඳව මගේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි පළාත් සභාවේ ඉතිහාසය තුළ අපේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේදී මිලියන 400 ක මුදලක් කෘෂිකර්ම ඇමතිතුමා විශේෂයෙන්ම පසුගිය කාල සීමාව තුළ දී යමක් කරන්න උත්සාහ කළා. එතුමාට අගය

කිරීමක් හැටියට එතුමාට අපි මිලියන 400 ක් මුදල් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ සියලුම මුදල් අධ්‍යාපන, ප්‍රවාහන, මහා මාර්ග, මෙවර මධ්‍යම රජයෙන් අධ්‍යාපනයටත් වඩා මුදල් ප්‍රතිපාදන වෙන් වුණේ, ප්‍රවාහන අමාත්‍යාංශයට. ඒ අනුව අපි සියලුම ප්‍රතිපාදන මිලියන 800 දක්වා එන විධියට, අමාත්‍යාංශවල ප්‍රතිපාදන ඒ ආසන්නයට සම කරන්නට අපි උත්සාහයක් ගත්තා. අද මම හිතන්නේ, මේ පළාත් සභාවේ හැටියට මට කරන්න පුළුවන් ආකාරයට උපරිම මුදලක් මම පළාතේ ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. දිගින් දිගටම අපේ ජනතා විමුක්ති පෙරමුණෙත් ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කිව්වා, මේකේ අලුත් දෙයක් නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, අපි ගිය අවුරුද්දේ තමයි පළාත් ආදායම් කමිටුවක් පිහිටෙව්වේ. අලුතෙන් අපේ පළාතට එකතු කළා. එක දවසෙන් මවන්න, ආදායම් උත්පාදනය කරන්න බැහැ. ඒවා සමහරවිට අපේ කාලයේ කරන්න බැරි වෙන්න පුළුවන්.

හැබැයි, කවුරු හරි කථා කරයි. අද ජනතා විමුක්ති පෙරමුණ මේකේ බෙදීමක් ඉල්ලලා ඒ අයගේ දේශපාලන සම්ප්‍රදාය අනුව මේ අයවැයට ඡන්දය නොදී ඉඳියි. නමුත් පළාත් සභාවක් හැටියට ගත්තොත් මේ අයට බෙදීමක් ඉල්ලලා නොදී ඉන්න ඕනෑ අයවැයක් නොවෙයි ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකත් කියන්න එපැයි. මම කියන්නේ, එතුමන්ලාගේ දේශපාලන කාරණාව එතුමන්ලා ඉෂ්ට කරයි. නේද සංවිධායකතුමා? නමුත් අපි පළාත් සභාවක් හැටියට ගත්තොත් එවැනි තත්ත්වයකට එහා නොයන දෙයක්. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා අවස්ථා දෙකකදීම මේ කැළි කසළ ප්‍රශ්නය පිළිබඳව කථා කළා. අපි දැන් මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙන්නේ. ඒ ආදායම් ඉදිරියේදී එනවා. හැබැයි, ඒ එන කොට අපි සභාවේ නැති වෙන්න පුළුවන්. මට මතකයි අපේ දිවංගත කිංස්ලි ටී. වික්‍රමරත්න මැතිතුමා. එතුමා ටයි කෝට් දාගෙන ඇවිල්ලා ගම්වලට කිව්වා, මේ තොරතුරු තාක්ෂණය ගැන. ටයි කෝට් දාගෙන ඇවිල්ලා තොරතුරු තාක්ෂණය ගැන මැතිවරණ වේදිකාවේ කියන කොට, ඒ මනුස්සයාට මිනිස්සු හිනා වුණා. ගම්වල හිනා වුණා. අපිත් දන්නේ නැතිකමට අපිත් හිනා වුණා. මොකක් කියනවද දන්නේ නැහැයි කියලා. අද එතුමාගේ සිහිනය සැබෑ වෙලා තිබෙනවා. ප්‍රධාන IT මධ්‍යස්ථානය, එතුමා කඩුවෙල ඉදි කළා. අද e concept එක නැතිව යන්න බැහැ. අද e සංකල්පය නැතිව අපට යන්න බැහැ. ලෝකය වෙනස් වෙලා. අද ලෝකයේ රටවල් මුදල් පාවිච්චි කරන්නේ නැහැ. පර්පචුවල් පොලට් කියන ක්‍රමයට මුදල් පාවිච්චි කරන්නේ. මේ හැම එකම ඒ සම්බන්ධයෙන් වාර්තාවක් තිබෙනවා. කාලය යන නිසා මම මෙය සභාගත කරනවා. දැන් මේ සාම්ප්‍රදායිකව ඉඳලා, දේශපාලන හුදු විවේචන කරලා, මේ සභාව ගෙනියන්න බැහැ. ලෝකයත් එක්ක යන්න ඕනෑ. අපි දැන් සම්පූර්ණයෙන්ම මේ ගොඩනැගිලි ඉදි වෙලා තමුන්නාන්සේලා ඉඳගන්නේ e concept එකත් එක්ක. දැන් ලෝකයේ ශල්‍යකර්ම කරනවා, e තාක්ෂණයෙන්. ඒ කියන්නේ, ඇමරිකාවට පුළුවන් මෙතැන ශල්‍යකර්මයක් කරන්න. අද හදිසි අනතුරක් වුණාම ඩ්‍රෝනා මගින් ආම්පන්න එවලා, මොකද අද මාර්ග තදබදයක් තිබෙන වෙලාවට යන්න බැහැ නේ? ඇම්බියුලන්ස් එකකට යන්න බැහැ. එතකොට මෙතැන සිට අනතුරක් වුණු තැනට උපදෙස් දීලා ශල්‍යකර්මයක් කරන්න පුළුවන්. රෝගියාට ප්‍රතිකාර දෙන්න පුළුවන්. ඒ යුගයට ලෝකය ගිහිල්ලා. අපි ඇට්ටි හැලෙන්න පාර්ලිමේන්තුවේ ඉඳගෙන දේශපාලනය කථා කරනවා. පළාත් සභාවටත් ඇවිල්ලා දේශපාලනය කථා කරනවා.

ගරු සභාපතිතුමනි, මේ අයවැයේදී සමහර අය කරපු කථා කරුණු මේ පළාතේ ජනතාවට වටිනාකමක් තිබෙනවාද? මම ඔබතුමාගෙන් අහන්නේ, මේ අයවැයේදී සමහරක් අය කරපු කථා පළාතේ ජනතාවට වටිනාකමක් තිබෙනවාද? අර පාර්ලිමේන්තුවේ තෙපර බාන ඒවායේ වටිනාකමක් තිබෙනවාද? කිසිම වටිනාකමක් නැහැ. මම කියන්නේ, මම සූදානම්. ඔබතුමා දන්නවා, මම කැමැතියි අලුත් දෙයක් කරන්න. අපි කැමතියි, කෘෂිකර්මයට නවීන තාක්ෂණය එකතු කරන්න. අපි කැමැතියි, අධ්‍යාපනයට නවීන තාක්ෂණය එකතු කරන්න. ලෝකයත් එක්ක වෙනස් වෙන්න. අපි කැමතියි ප්‍රවාහන අමාත්‍යාංශයට අලුත් තාක්ෂණය ගේන්න. අපි කැමැතියි, සෞඛ්‍යයට ගේන්න. ඉතින් හත් දෙයියනේ මෙතැන කයිය ගහන්නේ නැතිව, දන්නවා නම්, තේරෙනවා නම් කියල දීපල්ල කෝ. දන්නේ නැති අපි පස් දෙනාට. අපි ඉගෙන ගන්නවා නේ? අපට කියන්න කෝ මේකේ ආදායම් වැඩි කරගන්න විධිය. අපි කමිටුවක් පත් කරලා තිබෙනවා. ගිහිල්ලා කමිටුවට කියන්න කෝ. එකතු කරලා දෙන්න කෝ. අදහස් දෙන්න කෝ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කෙස් පැලෙන තර්ක විතරක් වැඩක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ලොක්කෙක්වත්, නායකයෙක්වත් නොවෙයි. මම මේ පළාතේ ඉන්න මහජන සේවකයා. ඇවිල්ලා මට දෙන්න. දැන් 40% ක් නගර සභාවට කාන්තාවෝ. 60% යි ඡන්දයෙන් යන්නේ. අනික් 40 ම කාන්තාවෝ. ඊළඟට අපේ පළාත් සභාවට 50% ක් කාන්තාවෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

25% යි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හරි. හරි. එකතු වෙලා එන කොට 50 යි. 50 යි, 50 යි. පළාත් සභාවට 50 ක් නොවෙයිද?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

පළාත් සභාවට හරි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

50 යි. හරි. ඉන්න කෝ කියන්න. 40% ක් කාන්තාවෝ දන්න එපැයි. පැරදිලා හිටියත් දාන්න ඕනෑ. ඉන්න කෝ කියන්න. Disturb කරන්න එපා. දැන් මේ ඉන්න අයගෙන් කීප දෙනෙක් ගත්තාම, මේ දෙතුන් දෙනෙක් ගත්තාම මම ඇතුළු අපි ඔක්කොම Grass roof level එකෙන් දේශපාලනයට ආපු අය. පල්ලෙහා මට්ටමෙන් දේශපාලනයට අපු අය. දැන් තවදුරටත් මේ Grass roof මට්ටමෙන් යන්න බැහැ. මේ ලෝකය වෙනස් කොට වෘත්තීය නිපුණතාවයක් තිබෙන අය මේ සභාවලට එන්න ඕනෑ. ගෙදර උයන කාන්තාව මේ සභාවේ 50% යටතේ ඇවිල්ලා ඉද ගත්තාට මේ පළාත් සභාව ගෙනියන්න පුළුවන්ද? ගෙදර උයන කාන්තාව, ගෙදර රෙදි හෝදන කාන්තාව List එකෙන් එනවා. List එකෙන් ඇවිල්ලා මේකේ ඉඳගෙන මොකක්ද කරන්නේ? මොකක්ද කරන්නේ? ප්‍රතිපත්තියක් හදන්න පුළුවන්ද? ප්‍රඥප්තියක් හදන්න පුළුවන්ද? බැහැ. එහෙමනම් මම කියනවා, පාර්ලිමේන්තුවට (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම එහෙමනම් කියනවා, පළාත් සභාවට 50% ක් කාන්තාවෝ දානවා නම්, දේශපාලන පක්ෂවලට අනිවාර්ය කරන්න ඕනෑ. ඒ 50% වෛද්‍යවරයෙක් ඉන්න ඕනෑ. ඉංජිනේරුවරියක් ඉන්න ඕනෑ. මොකක් හරි මේ නවීන ලෝකයත් එක්ක යන්න පුළුවන් වෘත්තීය දැනුමක් තිබෙන අය එහෙමනම්, මේ කණ්ඩායමට ඇතුළත් කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් වෙන්නේ ගරු සභාපතිතුමනි, මේ සභාවල්වලට ඇවිල්ලා කෙස්වලු පටලවා ගන්න එකයි. ඒක තමයි වෙන්නේ. කාන්තාවන් දාන්න කියන එක අපේ සංස්කෘතියේ තිබෙනවාද? අපේ බෞද්ධ දර්ශනයේ තිබෙනවාද? අපේ ආගමේ තිබෙනවාද? නැහැ. ඕවා රාජ්‍ය නොව සංවිධානවලින් ආපු දේවල්. අද කසාද බැඳලා පහුවදාට divorce එක ගන්නවා. මේ කෙහෙල්මල නිසා. මේ 50%, රාජ්‍ය නොවන සංවිධානවල කෙහෙල්මල නිසා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට බාධා කරන්න අවස්ථාවක් තිබෙනවා නම්, අපි බාධා කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ, ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ නිසා මම යෝජනා කරන්නේ මේ 50% ක් කාන්තාවෝ එනවා නම් ඒ තුළ අනිවාර්යයෙන්ම වෘත්තීයවේදීන් මේ කණ්ඩායමට ඇතුළත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ජනතා විමුක්ති පෙරමුණට හැමදාම ඕක කිය කියා ඉන්න පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනිවාර්යයෙන් වැඩ කාරයෝ එන්නේ. භය වෙන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අද මේක වෙනස් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. මම ප්‍රාර්ථනා කරනවා, රෝස් මන්ත්‍රීතුමිය වාගේ අය මේ සභාවට එන්න එපාය කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. නැහැ. රෝස් කමක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරදර කරන කට්ටිය.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

රෝස් කමක් නැහැ. රෝස් ලෝයර් නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එයා හරි කරදරයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මගේ කාලය යනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැඩකාරයෝ එන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අපි දැන් මේ කථා කරනවා. අපි දැන් මේ කථා කරන යුගය එන කොට දැන් අපේ බැංකු පවා ඉදිරියේ දී මේ e තාක්ෂණය නිසා ගරු සභාපතිතුමනි, දැන් ගණකාධිකාරී ක්ෂේත්‍රයේ රැකියා නැති වෙලා යනවා. ඒවායේ වටිනාකමක් එන්නේ නැහැ. Shroff වටිනාකමක් එන්නේ නැහැ. බැංකුවටත් ඉදිරියේදී එන්නේ e තාක්ෂණය. e තාක්ෂණය මේ ලෝකේ ක්‍රියාත්මක වුණාම බැංකු warehouse විධියට තමයි තියා ගන්න වෙන්නේ. බැංකුවට මිනිස්සු යන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි ඒ නිසා, මේ වෙනස් වන ලෝකයත් එක්ක මේ පළාත් සභාව අපි ගෙනියන්න ඕනෑ. අද ලක්ෂ ගණන්, කෝටි ගණන් දීලා පුස්තකාල හදලා වැඩක් නැහැ. අද ලෝකයේ තිබෙන ඕනෑම පොතක් තමන්ගේ පරිගණකයට ඇතුල් කරගන්න පුළුවන්. ලැප්ටොප් එකට ඇතුල් කරගන්න පුළුවන්. අපි ඒවා ගැන කථා කරන්නේ නැහැ. අපි කථා කරන්නේ පුස්තකාල හදන්න. ළමා ක්‍රීඩාංගණ හදන්න. ප්‍රජාශාලා හදන්න. ඔය මොකකටවත් එක ළමයෙක්වත් යන්නේ නැහැ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුස්තකාල පොත් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අද මේ වන කොට sharemarket එක වෙනස් වෙලා තිබෙනවා. ඩුබායිවල අද big points වලට ගිහිල්ලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අද චීනය අලුත් මුදල් ඒකක හඳුන්වලා දීලා තිබෙනවා. ඒ නිසා අපි මේ ලෝකයත් එක්ක ඉදිරියට යනවා. ඒ නිසා මේ ලෝකයත් එක්ක ඉදිරියට යන්න පුළුවන් පළාත් සභාවක් අපි හදන්න ඕනෑ. එහෙම නැතිව නිකන් අයවැය විවාදයකට ඇවිල්ලා දේශපාලන විවේචන කරලා වැඩක් නැහැ. ඒ නිසා අද මේ රටේ බුද්ධිමය ප්‍රතිසංස්කරණයක් කරන්න ඕනෑ. අවස්ථාවාදී දේශපාලඥයන්ට අහු වෙලා, රසට කථා කරන

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මිනිස්සුන්ට අහු වෙලා, රසට කථා කරන නායකයන් මේ රට බිලි අරගෙන තිබෙනවා. මේකෙන් මේ රට බේරගන්න ඕනෑ. එහෙම නොවුණොත් එහෙම වෙන්නේ අපට ජාතියක් හැටියට, පළාත් සභාවක් හැටියට ඉස්සරහාට යන්න බැහැ. ඒ නිසා මම ආරාධනා කරන්නේ - දැන් අපි අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව, විශ්ව විද්‍යාලයෙන් කෙරෙන ඩිප්ලෝමා එක සඳහා - ගරු සභාපතිතුමනි, රුපියල් 80,000 ක් මේ පළාත් සභාව දරනවා. පොඩි ගණනයි මන්ත්‍රීවරයෙක් දරන්නේ. අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. මේ පාඨමාලාව දැන් අපි පටන් ගන්න සූදානම් වෙලා තිබෙනවා. හැබැයි මම මේ ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. මේ මුදල අපි විශ්ව විද්‍යාලයට එක පාර බඳින්නේ. මේක අර ගම්වල කොල්ලන්ට අර රැකියා පුහුණු යටතේ ඩ්‍රයිවර් ලයිසන් එක දුන්නාම පළාත් සභාව CTB එකට සම්පූර්ණ සල්ලි ගෙව්වා. කොල්ලෝ නිකන් කරන නිසා මගදී කෝස් එක දාලා ගියා. අපේ මන්ත්‍රීවරුන් මේ අපරාධය නම් කරන්න එපා. තමුන්ට සම්පූර්ණ පාඨමාලාවට යන්න බැරි නම්, මේ පාඨමාලාවට ලියාපදිංචි වෙන්න එපාය කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා. අනික් එක ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ පාඨමාලාව හොඳයි. මේ පාඨමාලාවත් කෙරෙන්න ඕනෑ. දේශපාලන විද්‍යාව, මේ හැම එකක්ම ඇතුළත් වෙලා තිබෙනවා. හැබැයි දැන් මේක විතරක් මදී. දැන් අපි e concept එක තිබෙන ගොඩනැගිල්ලට ගිහිල්ලා මෙතැන කොම්පියුටර් එක සවි කළාම මූලික දැනුමක් අපේ අයට දුන්නේ නැත්නම් ඒක හරි යන්නේ නැහැ. එහෙමනම් අපි විශ්ව විද්‍යාලයත් එක්ක කථා කරලා මේ පාඨමාලාවටම අලුත් පාඨමාලාවක් එකතු කරන්න ඕනෑය කියලා මම හිතන්නේ මම එකඟතාවය ඉල්ලනවා. අපේ සියලු පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන්. අපි මේක වෙනස් කරගන්න ඕනෑ. මේ තාක්ෂණය පිළිබඳව අපට අවබෝධයක් තිබුණේ නැත්නම්, මේ e අදහස් සම්බන්ධයෙන් අපට අවබෝධයක් තිබුණේ නැත්නම් අපට ඉස්සරහාට යන්න බැහැ. මේ ගොඩනැගිල්ලට ගිහිල්ලා, මේක ඔබලා කඩලා දායි.

ඒ වාගේම අද විශේෂයෙන්ම අපේ රොයිස් ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම අපේ මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාත්, ඇත්තෙන්ම හිතේ පොඩි කනගාටුවක් තිබෙනවා. මොකද මොන දේශපාලන පක්ෂයක සිටියත් පසුගිය කාලසීමාව තුළ දී මේ පළාත් සභාවේ උන්නතිය වෙනුවෙන් විශාල කැපවීමක් කළා. අපි සුභ පතනවා. මොකද, අපි නම් ඉතින් ප්‍රාදේශීය සභාවේ ඉඳලා ආවේ. තමුන්නාන්සේලාත් එහෙම ඉඳලා ආවේ. නැවත වතාවක් ඔබතුමන්ලා ඒ ගන්න දේශපාලන ක්‍රියා මාර්ග වෙනුවෙන් අපි සුභ පතනවා. සභාපතිවරයා හැටියට පත් වෙන්නය කියලා පළාත් සභාව වෙනුවෙන් මම ඒ අයට සුභ පතන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත වුණාම ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගන්න ඕනෑය කියලා. හැබැයි, ගරු සභාපතිතුමනි, මම එකක් කියන්න ඕනෑ. මේ ළඟදී ආණ්ඩුකාරතුමා මාත් එක්ක කථා කර කර සිටියා. ආණ්ඩුකාරතුමා මේ විසුරුවා හැර තිබෙන පළාත් සභා තුන සම්බන්ධයෙන් මාත් එක්ක කථා කර කර සිටියා. එතුමා මගෙන් ඇහුවා, මේ පළාත් සභා විසුරුවා හැර තිබෙන අවස්ථාවක දැන් මේ වොරන්ට් බලපත්‍රය අත්සන් කිරීමේ බලය තිබෙන්නේ, මහ ඇමතිට විතරයි. විසර්ජන ප්‍රඥප්තිය අපි අද වැඩි ඡන්දයෙන් අනුමත කරලා, සම්මත කරලා ආණ්ඩුකාරතුමාට යැව්වාට, එයාගේ අනුමැතිය ආවාට මහ ඇමතිවරයා වොරන්ට් බලපත්‍රයට අත්සන් කළේ නැත්නම් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක නිසා මේකේ මූල්‍ය බලතල ඉතා පැහැදිලියි. ඒකේ තිබෙන්නේ, ප්‍රධාන ඇමතිවරයාට හෝ මුදල් ඇමතිවරයාට. ඒ නිසා මම හිතන්නේ ඒ ගැන එච්චර හිතන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද ඒ බලය අපට තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන අපි හිතන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මමත් මේකේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුදු 16 ක් සිටියා. මට මතකයි, මම සෞඛ්‍ය විවාදයට එකතු වෙන වෙලාවේදී කිව්වා, අපේ රෝගීන්ගේ අයිඩෙන්ටි කාඩ් එකේ අංකයට පරිගණක ගත කරන්න ඕනෑය කියලා. අද ඒක සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අද ඩෙංගු රෝගියෙක් ඇතුළත් වුණොත් පෞද්ගලික රෝහලකට හරි, රජයේ රෝහලකට හරි එයාව කෙළින්ම අපේ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙනවා. අද අපි ඉල්ලීම් කරලා තිබෙනවා. අපි තාක්ෂණය අද අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම පසුගිය දවසේ අපි කැබිනට් මණ්ඩලයෙන්

අනුමත කළා. දැන් අලුත්ම එක තමයි ඩිජිටල් තාක්ෂණය. දැන් මේ ඩිජිටල් තාක්ෂණය පළාතේ ක්‍රියාත්මක කරන්න මේ වෙන කොට ඒ සියලු කටයුතු අපි කරගෙන යනවා. දැන් මේ 2 G ඇවිල්ලා , 3 G ඇවිල්ලා 4 G වෙලා තිබෙන්නේ. දැන් මේක වෙනස් වෙලා තිබෙන්නේ. ඒ නිසා අද මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු අපට මොන විවේචනය කළත් අපිත්, අපේ කැබිනට් මණ්ඩලයත් අපගේ නිලධාරීනුත් මේ තාක්ෂණය පිළිබඳව, අලුත් මෙවලම් පිළිබඳව අපේ අවධානය යොමු වෙලා කටයුතු කරන්න පුළුවන් විධියට, අපි ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. එකම දේ වෙලා තිබෙන්නේ, අපේ පළාත් සභා මන්ත්‍රීවරුන් උපදේශක කාරක සභාවලට සම්බන්ධ වුණාට ඒ අයට එක් එක් අමාත්‍යාංශවල ක්‍රියාත්මක වන සැබෑ මහජන සේවාවන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන්නේ නැහැ. ඒකට හේතුව තමයි, උපදේශක කාරක සභාවට ගිහිල්ලත් ඒ ගොල්ලෝ මතු කරන්නේ එදිනෙදා ප්‍රශ්න. කාණුවේ, බෝක්කුවේ ජනප්‍රිය දේශපාලන කාරණා විතරයි. හැබැයි, අපි උදාහරණයකට ගත්තොත් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගිහිල්ලා තමුන්නාන්සේලා බැලුවොත් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ විශාල ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවා. හැබැයි, ඒවා කාටත් පේන්නේ නැහැ. අද අපි දන්නවා, අපේ ප්‍රවාහන ඇමතිතුමාගේ අමාත්‍යාංශය. ඒ ගොල්ලොත් දැන් වෘත්තිය නිපුණතාවයන් තිබෙන අය බිහි කරනවා. නමුත් ඒ පිළිබඳව දැනුවත් වීමක් නැහැ. අපි දැන් මෙවර අපේ පරිපූරකයෙන් ඒකේ ප්‍රතිපාදන අපි වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපනයටත් ඒක තමයි වෙලා තිබෙන්නේ. අධ්‍යාපනයටත් වෙලා තිබෙන්නේ, ඔක්කොම ළමයින් ඉස්කෝලේ දාන්න තමයි කථා කරන්නේ. අධ්‍යාපනයට වෙලා තිබෙන්නේ මොකක්ද? ළමයා ඉස්කෝලෙට දාන්න තමයි කථා කරන්නේ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මේ අවුරුද්දේ එකක්වත් දුන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පන්තිය හදන්න, ගුරුවරයා දෙන්න, ඒවා නොවෙයි කථා කරන්නේ. දැන් මොකක්ද කරන්නේ? දැන් විශාල චෝදනාවක් තිබෙනවා. ඉස්කෝලේ ළඟ ඉන්න ළමයා ප්‍රතික්ෂේප වෙනවා. හේතුව මොකද, සීයා ඔප්පුව අම්මාට හරි තාත්තාට හරි ලියලා නැති එක. එහෙම Reject වුණු ළමයාව අපේ මන්ත්‍රී ගිහිල්ලා ගන්නවා. අපේ මන්ත්‍රීතුමා ගිහින් ගන්නවා. (බාධා කිරීමක්) ඒ නිසා මම හිතන්නේ මේ ළමයින් ඉස්කෝලේ දාන එක අපිත් කාලයක් හොඳට කළා. අපිත් හොඳට ළමයින් දැම්මා, මන්ත්‍රීවරු හැටියට ඉන්න කාලයේ. ඒක බොරුවක්. අපි ළමයින් 10 දෙනෙක් දාන කොට ළමයින් 20 ක්, 30 ක් අපිත් එක්ක තරහා වෙනවා. ඒ නිසා මේ ළමයින් දැමීමේ සංකල්පයෙන් අපි බැහැර වෙන්න ඕනෑ. හැබැයි යම් අසාධාරණයක් වුණු කෙනෙක්ට තමන්ගේ දරුවා පාසලකට ඇතුළත් කරන්න, යම් අසාධාරණයක් වුණු කෙනෙක් වෙනුවෙන් මැදිහත් වීමේ අයිතිය අපට තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒක නැති කරගන්න ඕනෑය කියලා. ඒ නිසා මම යෝජනා කරන්නේ ගරු සභාපතිතුමනි, 19 ක්‍රියාත්මක වන රටක අපට, මේ දේශපාලඥයන්ට, මහජන නියෝජිතයන්ට, නායකයන්ට තමන්ට හිතුන හිතුන දේ කරන්න පුළුවන් රටක් නිර්මාණය වෙන්නේ නැහැ. ඒ නිසා තවදුරටත් අපි ළමයින් ඇතුළත් කිරීමත් එක්ක අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉන්නවා නම් අපේ පළාතේ ජනතාවට අපි කරන්නේ විශාල අසාධාරණයක්. ඒ නිසා තමයි මම කිව්වේ, අපි දැන් හඳුනාගෙන තිබෙනවා. අපි හඳුනාගෙන තිබෙනවා. මේ මානව සම්පත, අපේ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපනය සඳහා අපි මොකක්ද කරන්නේ ඕනෑ කියන කාරණාව පිළිබඳව අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව අපි කටයුතු කරන්න සූදානමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, දැන් පළාත් පාලන මැතිවරණය පැවැත්වෙනවා. දැන් අවුරුදු ගණනාවකට පස්සේ පළාත් පාලන මැතිවරණය පවත්වන්න අවශ්‍ය සියලු කටයුතු සලස්වා තිබෙනවා. අපි ඉතා පැහැදිලිවම කිව්වා. මොකද දැන් මේ පළාත් පාලන මැතිවරණය සඳහා එන අපේක්ෂකයන් බහුතරයක් කිසිම අවබෝධයක් නැති, දේශපාලනය පිළිබඳවත් අවබෝධයක් නැති, පරිපාලනය පිළිබඳවත් අවබෝධයක් නැති අය මේකට එන්නේ. එහෙමනම් දැන් අපි සූදානම් වෙලා තිබෙනවා. යුධ හමුදාවත් සාකච්ඡා කරලා දින පහක වැඩමුළුවක්, සම්පූර්ණ අණපනත් පිළිබඳව පූර්ණ දැනුමක් ලබා දීලා දින පහක වැඩමුළුවක් පවත්වන්න අපි මේ වෙන කොට සූදානමින් ඉන්නවා. මේ අයවැයත් එක්ක අපි විශාල වැඩ කොටසක් ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, හුදෙක් විවේචනයකට එහා ගිය පළාතේ ජනතාවගේ හෙට දවස

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

වෙනුවෙන් යමක් මේ මහ පොළවේ පැළ විය හැකි යමක් කරන්න ඔබ සූදානම් නම්, ඒ සඳහා මමත් අපේ ගරු ඇමතිවරුත් සූදානම් කියන පණිවිඩය ලබා දෙමින් ඔබතුමාටත්, සභා ලේකම්තුමාටත්, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු අපේ සියලුම ලේකම්වරුන්ටත්, පළාත් සභාවේ සියලු දෙනාටත්, මාධ්‍යවලටත්, අපේ ගරු මන්ත්‍රීවරුන්ටත් සියලු දෙනාට මම ස්තුතිවන්ත වෙනවා. පොලිසියටත් සියලු දෙනාටත් අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

පර්මිට් එක.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ වාගේම අද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. හොඳම නිවේදනය තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හැමදාම පර්මිට් එක නොවෙයි. රුපියලක් හරි ඔබතුමන්ලාට දෙන්න තිබෙනවා නම්, මම ඒ රුපියල දෙන්න ආණ්ඩුකාරතුමා ළඟට මම ගිහිල්ලා තිබෙනවා. මම ඔබතුමන්ලා වෙනුවෙන් තනියෙන් සටන් කරනවා. මම ඒවාට සූදානම්. පර්මිට් එක නොවෙයි. පර්මිට් දෙකක් හරි දෙන්න මම සූදානම් කියන එකත් කියන්න කැමැතියි. ඒ වාගේම අවසාන වශයෙන් සියලු දෙනාට සුභ නත්තලක් ප්‍රාර්ථනා කරමින්, සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් අද දින අපි ප්‍රධාන ගොඩනැගිල්ල නරඹලා ඉවර වෙලා සියලු දෙනාටම දිවා භෝජනය සඳහා මම පිළියෙල කරලා තිබෙනවා. මම දැන් දවස් හයක් විතර කන්න දුන්නා. අද දිවා භෝජනයත් මම පිළියෙල කරලා තිබෙනවා. ඒ සඳහා සියලු දෙනාටම ආරධනා කරමින්, ඔබ සියලු දෙනාට සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එසේම වේවා!

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එසේම වේවා! පර්මිට් එක ලැබේවා!

***පූ.භා. 11.59 ට 2018 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය අවසන් විය.***
*At 11.59 p.m the debate on the Appropriation Statute related to Annual Financial Statement of 2018 was concluded.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමන්ලා තමුන්ට හිමි ආසනය වෙත ගිහින් වාඩි වෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය යන යෝජනාව පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීමක් තිබෙන නිසා, කරුණාකර සීනුව නාද කරන්න.

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය යන යෝජනාවට බෙදීමක් ඇති වූ බැවින් ඒ ප්‍රඥප්තියට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න. කරුණාකර වාඩි වෙන්න. විසර්ජන ප්‍රඥප්තියට විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න. කරුණාකර වාඩි වෙන්න. ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීතුමන්ලා ඉන්නවාද? කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ ප්‍රතිඵලය නිවේදනය කරන්න පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න කෝ.

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය යන යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බෙදීමක් ඇති වූ බැවින්, ඒ සඳහා සභාවේ මත විමසීමේදී පක්ෂව ඡන්ද 80 යි. විපක්ෂව ඡන්ද 05 යි. වැළකී සිටි මන්ත්‍රීවරු කිසිවෙකු නැත. එතුමා මතයක් මොකුත් ප්‍රකාශ කළේ නැහැ. ඒ අනුව එම විසර්ජන ප්‍රඥප්තිය වැඩි ඡන්ද 75 කින් සභා සම්මත වූ බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

*එවලේ,*

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 80 යි, විරුද්ධව 05 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*Question put and the Council divided as per Rule No 61 (3), 80 for, 05 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු ගරු ඇමතිතුමා කරුණාකර මට කාලය දීර්ඝ කර දෙන්න.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් සභාවේ කාලය දීර්ඝ කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යායපත්‍රානුකූලව අපට ඊළඟට තිබෙන්නේ අද දවසේ ප්‍රගතිය වාර්තා කිරීම. කරුණාකර සෙංකෝලය ස්ථාන ගත කරන්න.

***ඊට අනුකූලව අ.භා. 12.04 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 12.04 p.m. the Provincial Council resolved itself in to a committee of the whole Council.*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. දැන් කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ ඡන්දය කොහෙද? නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ, පොඩ්ඩක් ඉන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එයා පක්ෂත් නැහැ. විරුද්ධත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කමක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ රීතියේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මොකකටවත් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කරුණාකර වාඩි කරවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මේ සිටියා වාගේ පොඩ්ඩක් ඉන්න. කරුණාකර නිශ්ශබ්ද වෙන්න. සභා ගර්භය තුළ මොහොතක් රැඳී සිටින්න.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, මේ ඡන්දය -

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේ ප්‍රගතිය.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

රීති ප්‍රශ්නයක්. 36(1) –

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මොන ගණයටද අයිති වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ කමක් නැහැ. ගණය මොකක් හරි -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සභාවට ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕක මොකක් හරි -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

සමාවෙන්න. මම මේ පරණ මන්ත්‍රීවරයෙක්. ඔබතුමාගේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශ කරන්න. පක්ෂ, විපක්ෂ, වැළකුණු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති ප්‍රශ්නයක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැඟිට්ටේ නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රකාශ කළා. වාඩි වෙලා සිටියේ එතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නැඟී සිටියා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ජාති දෙකයි ඉන්න පුළුවන්. එක්කෝ ඡන්දය දෙන්න ඕනෑ. එක්කෝ ඡන්දය නොදී ඉන්න ඕනෑ. එහෙම නැත්නම් ඡන්දය දීමෙන් වැළකී සිටින්න ඕනෑ. දැන් ඔබතුමා ඡන්දය දීපු සංඛ්‍යාව කිව්වා, 75 යි. ඡන්දය නොදීපු සංඛ්‍යාව 05 යි. ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු නැත කියලා කිව්වේ. ඡන්දය දීපු සංඛ්‍යාව75 යි. ඡන්දය නොදීපු අය 05 යි. ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛයාව 01 යි. 86 ක් ඉන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පොඩ්ඩක් ඉඩ දෙන්න කෝ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

86 ක් ගණන් තිබෙන්න ඕනෑ, සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවසාන මොහොතේ සභාව අවුල් කරනවා. ඒකයි වෙන්නේ මේකෙන්.

[සභාවේ ඝෝෂා]

වාඩි වෙන්න කෝ. පණ්ඩිතයෝ නේ. ඔක්කොම වැඩකාරයෝ. අපි මේ සභාවේ මොකුත් දන්නේ නැහැ. ඒක නේ වෙලා තිබෙන්නේ. කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා අනවශ්‍ය ප්‍රකාශවලට යන්න එපා. එක එක මන්ත්‍රීතුමාට අයිතියක් තිබෙනවා. එහෙම කථා කරන්න එපා. කරුණාකර වාඩි වෙන්න. විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ඡන්දය විමසීමේදී ඡන්ද 80 ක් ලැබුණා, පක්ෂව. විපක්ෂව ඡන්ද 05 යි. කොඩිකාර මන්ත්‍රීතුමා නැඟිට්ට ද මොනවා කිව්වාද දන්නේ නැහැ. නමුත් මට සිද්ධ වෙනවා එතුමා නැඟිට්ටා කියන්නේ ඒක වැළකී සිටියාට ගණන් ගන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම නැඟිට්ටේ නැහැ. මම මධ්‍යස්ථව සිටියේ. මම විරුද්ධව නැගී සිටියෙත් නැහැ. මම පක්ෂව නැඟිට්ටෙත් නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඡන්දයෙන් වැළකී සිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා වැඩක් නැති ඒවා අල්ලගෙන දඟලන්න එපා. මේ කරන විහිළුව මොකක්ද? පොඩි කාරණාවක් අල්ලගෙන දඟලනවා.

අද දවසේ ප්‍රගතිය. බොරුවට වීරයෝ වෙන්න එපා. කාලය දීර්ඝ කළා. දවසේ ප්‍රගතිය. අද දවසේ සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේ දී එම වැය ශීර්ෂයන් සභා සම්මත වුණා. ඒ එක්කම ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් බෙදීමක් ඇති වූ බැවින් එම වැය ශීර්ෂයට පක්ෂව 80 යි, විපක්ෂව 05 යි, වැළකී සිටි මන්ත්‍රීවරු 01 යි. ඒ අනුව මෙම වැය ශීර්ෂය වැඩි ඡන්ද 75 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා.

සම්ප්‍රදායානුකූලව අපි හැම සභාවක ස්තුතියක් කරනවා. ඒ අනුව සම්ප්‍රදායානුකූලව මම මේ අවස්ථාවේදී ස්තුතිය ප්‍රකාශ කරනවා. අනේ ඕගොල්ලෝ ඔක්කොම වැඩකාරයෝ. මට පොඩ්ඩක් ඉඩ දෙන්න කෝ. හරි. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා අපි දන්නවා, ඔබතුමා වැඩකාරයා. හරි. කරදර කරන්න එපා. පොඩ්ඩක් ඉන්න. දීපාල් ගරු මන්ත්‍රීතුමාත් හොඳ වැඩකාරයෙක්. නීතිඥ මහත්මයෙක්. අන්තිම මොහොතේ ඇවිල්ලා සභාවේ බොරුවට කෑ ගහන්න එපා.

ස්තුති කිරීම්. ගරු ආණ්ඩුකාරතුමාට විශේෂයෙන්ම අපි - බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර කේ.සී. ලෝගේෂ්වරන් මැතිතුමා, එතුමා කවදත් අපේ පළාත් සභාවේ සියලු වැඩ කටයුතුවලට අපට අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී එතුමාට මගේ ස්තුතිය සහ ගෞරවය පුද කර සිටිනවා. (බාධා කිරීම්)

ඒ වාගේම මේ පළාත් සභාව වෙනුවෙන් සියලුම බේදයකින් තොරව සියලුම ගරු මන්ත්‍රීවරුන්ට පළාත් සභාව තුළ දැවැන්ත සේවාවක් ඉටු කරන අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එතුමා අර grass root මට්ටමෙන් අපේ පළාත් සභාවට පත් වෙලා අපි හැමොත් එක්කම සුහදව කටයුතු කරන ප්‍රධාන අමාත්‍යවරයෙක් වශයෙන් එතුමා ලබා දුන්නු සහයෝගයට. ඒ වාගේම සියලුම ගරු අමාත්‍යවරුන්ට, ගරු විපක්ෂ නායකතුමා නොසිටියත් - එතුමා අසනීපෙන් සිටියත් අපි එතුමාව අගය කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයට එතුමා සම්බන්ධ වෙලා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කරන ගෞරවයක් වශයෙන් එතුමා, එතුමාගේ ඡන්දය ප්‍රකාශ කරලා ගියා. ඒ නිසා එතුමා කරන ලද උතුම් වටිනා ඒ ගෞරවයට අපි එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම මට නිතරම සහාය දැක් වූ මගේ නියෝජ්‍ය සභාපතිතුමා, නිරන්තරයෙන් මේ සභා ගර්භයේ රැඳී සිටියා. කොහෙවත් එහේ මෙහේ ගියේ නැහැ. මේ සභා ගර්භයේම සිටියා. ඒ නිසා එතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සභානායකතුමාත් ඒ වාගේම මට විශාල සහායක් ලබා දුන්නා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, මම හිතන්නේ මේ අයවැය විවාදය පුරාවටම එතුමා සභා ගර්භයේ රැඳී සිටියා. මම එතුමාව ඉතා අගය කරනවා. ඒ වාගේම

[ගරු සභාපතිතුමා]

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, එතුමා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකුතමාගේ කාර්යභාරය එතුමා උපරිමයෙන් ඉෂ්ට කළා. අපි ඒක විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම එතුමා ගැන අපි සතුටු වෙනවා. එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් විපක්ෂයේ කාර්යභාරය හරියට කළා. ඒ නිසා අපි එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඊළඟට සභාපති නිල මඩුල්ලේ මට සහයෝගය දැක් වූවා. විශේෂයෙන්ම අපේ නවක මූලාසනයේ අසුන් ගන්නා අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, එතුමා විශාල සහායක් මට දැක් වූවා. ඒ වාගේම අපේ සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. එතුමා මට මේ අයවැය විවාදය පැවැත්වෙන කාලසීමාව තුළ විශාල ශක්තියක් ලබා දුන්නා. මූලාසනයේ අසුන් ගනිමින් එතුමාත්, මෙතැන නොසිටියත් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාත් මට ඒ සහාය ලබා දුන්නා. ඒ තුන්දෙනාට මම මගේ ස්තුතිය සහ ගෞරවය පුද කර සිටිනවා. ඒ වාගේමෙ අපේ පක්ෂවල කණ්ඩායම් නායකයෝ රාශියක් ඉන්නවා. ඒ සියලු දෙනාටමත්, මූලාසනය දැරූ අපේ අනිකුත් ගරු මන්ත්‍රීතුමන්ලාටත් විවාදයට සහභාගි වී ඉතාම වැදගත්, හරවත් අදහස් දක්වමින් විවාදයට සම්බන්ධ වුණු ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය ගෞරවය පුද කර සිටිනවා. ඒ වාගේම සභා රැස්වීම් ආරම්භයේදී ගරු මන්ත්‍රීවරු සභා ගර්භයේ නොසිටියත් මට සිද්ධ වුණා බොහොම අඩු සංඛ්‍යාවෙන් මේ සභාව පටන් ගන්න. ආරම්භක අවස්ථාවේ. නමුත් මම සන්තෝෂ වෙනවා. ඡන්දය ලබා ගන්නා අවස්ථාවලදී මන්ත්‍රීවරු පැමිණීම ඉතාම අගය කරන්න පුළුවන්. ඒ අනුව ඒ සහභාගි වුණු සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය සහ ගෞරවය පුද කර සිටිනවා.

ඒ වාගේම නිලධාරී වශයෙන් විශේෂයෙන්ම අපි ස්තුති කරන්න ඕනෑ. ප්‍රධාන ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට. එතුමා නිරන්තරයෙන්ම සභා ගර්භයේ රැඳී සිටියා. එතුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයට, ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් අපේ සභා ලේකම් හේමන්ත සමරකෝන් මැතිතුමා ඇතුළු අපේ සභා ලේකම් කාර්යාලයේ සියලුම දෙනා ඉතාමත්ම කැපවීමෙන් මේ කාලපරිච්ඡේදය තුළ විශාල සේවාවක් ඉෂ්ට සිද්ධ කළා. සුපුරු පරිදි හැමදාමත් ඒ සේවය සභා ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරි මණ්ඩලය ඉටු කරනවා. ඒක මේ විවාදයේදී ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම ස්තුති කළා. සභා ලේකම් කාර්යාලය කරන කාර්යභාරයට. විශේෂ ස්තුතියක් කරනවා. මමත් අපේ සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතියක් කරනවා. ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා සමහර අවස්ථාවලදී සම්බන්ධ වුණා පෙණුනා. එතුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයට සියළුම අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු කාර්ය මණ්ඩලයට, අමාත්‍යාංශ ලේකම්වරු බොහෝ දෙනෙක් මේ සභා ගර්භයේ නිලධාරී ගැලරියේ රැඳී සිටියා. එතුමන්ලා ඇතුළු එතුමන්ලාගේ කාර්ය මණ්ඩලයටත් විශේෂයෙන්ම සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සහාය දැක් වූවා. එතුමන්ලාටත්, සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලවලට, ඒ වාගේම ප්‍රධාන ලේකම් කාර්යාලයේ මූල්‍ය අංශය අපි සිහිපත් කරනවා. බන්දුල ප්‍රේමකුමාර මහත්මා නිරතුරුවම සභා ගර්භයේ රැඳී සිටියා. දැනුත් එතුමා අපේ නිලධාරී ගැලරියේ රැඳී සිටිනවා. එතුමාටත් අපි අපේ ගෞරවය, ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම පළාත් භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුවේ බොහෝ දෙනෙක් රැඳී සිටියා. අපි ඒ හැමදෙනාටම ස්තුතිවන්ත වෙනවා.

ආරක්ෂාව සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරී මහත්ම මහත්මීන්ට, අමාත්‍යාංශ ආරක්ෂක අංශයේ නිලධාරීන්ට, තලංගම පොලීසියේ ස්ථානාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට. පුංචි පුංචි අඩුපාඩු සිදු වුණත්. තලංගම පොලිසියේ ස්ථානාධිපතිතුමා අපට විශාල සහායක් ලබා දුන්නා. එතුමාටත්, ඒ වාගේම බෝම්බ නිශ්ක්‍රීය අංශයටත්, බස්නාහිර පළාත් සභාවේ වෙස්ප්‍රෝ ආයතනයේ සේවක මහත්වරු විශාල සහයක් අපට මේ කාලය තුළ ලබා දුන්නා. ඊළඟට සේවා සැපයීම වෙනුවෙන්, කඩුවෙල මහ නගර සභාවටත් අපි විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. කඩුවෙල මහ නගර සභාවේ කොමසාරිස්තුමිය ඇතුළු ඒ සියලුම කාර්ය මණ්ඩලය අපට විශාල සහයක් දැක් වූවා. පළාත් ඉංජිනේරු කාර්යංශය අපේ රණසිංහ මහත්මයා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනා අවශ්‍ය සහාය ලබා දුන්නා. ඒකටත් මගේ ගෞරවය ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම විශේෂයෙන්ම මේ පළාත් සභා රැස්වීම් වාර්තා කිරීමට සහභාගි වුණු සියලුම ජනමාධ්‍ය ආයතනයන්ට, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය නියෝජිතයන්ට,

හැන්සාඩ් සංස්කාරක වරුණ මහත්මයා ඇතුළු නිල වාර්තාකරණයෙන් සහභාගි වූ අපේ හැන්සාඩ් කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ට, ගරු මන්ත්‍රීවරුන්ගේ කථනයන්, ක්ෂණිකව පරිවර්තනය සහාය දැක් වූ ක්ෂණික භාෂණ පරිවර්තන, Interpriter මහත්ම මහත්මීන්ටත් මගේ ගෞරවය ස්තුතිය විශේෂයෙන්ම පුද කර සිටිනවා. ඒ වාගේම සහායක සේවා සැපයීම වෙනුවෙන්, ආහාර පාන, සංග්‍රහ කටයුතු සිදු කරමින් සේවා කටයුතු සැපයූ සියලුම ආයතනයන්ට, පවිත්‍ර කටයුතු කිරීමෙන් සේවා සැපයූ සියලුම ආයතනයන්ට, නන් අයුරින් සහාය දැක් වූ ඉහත ප්‍රකාශ නොවූ යම් පාර්ශවයක් වේ නම් ඒ සියලුම පාර්ශවයන්ට, ඉහළම නිලධාරියා සිට සුළු සේවක මහතා දක්වා වූ සියළුම අයට මගේ ස්තුතිය, ගෞරවය සහ ප්‍රණාමය පුද කර සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මම අද සතුටු වෙනවා. අවුරුදු 02 ½ කට ආසන්න කාලයක් මේ පළාත් සභාව තුළ විශාල දායකත්වයක් ලබා දුන්නු ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාත්, මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාත් මම විශ්වාස කරනවා ඒ දෙපළ අද දවසේ අස්වීම් මට භාර දුන්නා. ඒ දෙපළ ඉදිරියට පළාත් සභාව නියෝජනය කරන්නේ නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු, අමාත්‍යතුමන්ලා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ඒ හැමෝමත් එක්කම එතුමන්ලා දෙදෙනාට සුභ පතනවා. එතුමන්ලාගේ අනාගතය නගරාධිපතිවරු වෙලා සභාපතිවරු වෙලා ඊට්ත් එහාට ගිහිල්ලා, අපේ පාර්මේන්තුවට පවා යන්නට ඔබ දෙපළට වාසනාව ශක්තිය උදා වේවා කියලා විශේෂයෙන් ප්‍රාර්ථනා කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මහ ඇමතිතුමාත් දෙන්නාට උදව් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උදව් කරනවා. ප්‍රතිපාදනත් දෙයි. ප්‍රශ්නයක් නැහැ. අවසාන වශයෙන්, මම සතුටු වෙනවා. මේ කාලය තුළ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට අමතක කරන්න බැහැ. එතුමා පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව - අපි විශ්වාස කරනවා, පරිපූරක මුදල් බෙදා දීමේදී එතුමා ඇත්ත වශයෙන්ම කිසිම ප්‍රශ්නයක් වුණේ නැහැ. හැමකෙනාටම සාධාරණව මුදල් බෙදා දුන්නා. අපි දන්නවා. කලිනුත් අපි මහ ඇමතිතුමාත් එක්ක සම්බන්ධ වුණා. මොකද එතුමා හැම කෙනාටම බොහොම සාධාරණව ඒ මුදල් ලබා දුන්නා. ඒ පිළිබඳව එතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට මම නැවතවරක් ස්තුතිවන්ත වෙමින්, මෙම ලබන්නා වූ 2018 වසර අපි හැමෝටම, විශේෂයෙන්ම නත්තල් සමරන ගොඩක් කට්ටිය මේ පළාත් සභාව තුළ ඉන්නවා. ඒ අයට සාමය සතුට පිරි සුභ නත්තලක් ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ලබන්නා වූ 2018 නව වසර ඔබ සැමටම - තව පුංචි නිවේදනයක් කරන්න තිබෙනවා. අපේ දිනපොත මේ වන විට මුද්‍රණය කරලා අවසානයි. දිනපොත අද බෙදා දෙන්න අපි බලාපොරොත්තු වුණා. නමුත් පුංචි මුද්‍රණ දෝෂයක් නිසා ඒ සමාගම දැනුම් දුන්නා, මේ සිකුරාදා වන විට ඒ දින පොත් ඔක්කොම අපේ සභා ලේකම් කාර්යාලයට භාර දෙනවා කියලා. ඒ නිසා ඉදිරියේදී ඔබතුමන්ලාට පුළුවන් සිකුරාදා වන විට සභා ලේකම් කාර්යාලයට ඇවිල්ලා 2018 වර්ෂයේ දින පොත ලබා ගන්න. ඒ බව සිහිපත් කරනවා. ඒ වාගේම ගරු ප්‍රධාන ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි එතුමා අද සුපුරුදු අපේ දිවා භෝජන සංග්‍රහය වෙනස් කරලා මන්ත්‍රීවරුන්ට, වෙනත් ස්ථානයක එතුමා අංග සම්පූර්ණ දිවා භෝජන ලැහැස්ති කරලා තිබෙනවා. පාලම් තුන ගාව ලැවිනියා හෝටලය. පාලම් තුන අසළ colour light එක ළඟ තිබෙන ලැවිනියා හෝටලය. ඒ බව සිහිපත් කරමින්, ඒ සඳහා සහභාගි වන ලෙස ආරාධනා කරනවා. මම හිතන්නේ ඒ ආරාධනාව තිබෙන්නේ මන්ත්‍රීවරුන්ට විතරයි. ඒත් එක්කම අපේ ලේකම්වරුන්ටත් ආරාධනා කරනවා. ඊළඟට එතුමා බලාපොරොත්තු වෙනවා. අපි හැමෝම ගිහිල්ලා මේ අලුත් ගොඩනැගිල්ල බලලා, අඩුපාඩු සම්බන්ධයෙන් දැනුවත් කරන්න කියලා සිහිපත් කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.19 ට, 2018 ජනවාරි මස 09 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.19 p.m till 09.30 a.m, on 09.01.2018.*